# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# Annual Report 2015

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

# ශ්‍රී ලංකා
# මානව හිමිකම් කොමිෂන් සභාව

## වාර්ෂික වාර්තාව 2015

1996 අංකː 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 30 වන කොටසෙහි දක්වා ඇති අවශ්‍යතාවය ප්‍රකාර මෙම වාර්තාව පිරිනැමේ.


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ප්‍රධාන කාර්යාලය. අංකː14,ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 04.

දු.ක.(94) 0112505580, 2505581, 2505582
ෆැක්ස්ː (94) 0112505541
වි.තැ.:sechrcsl@gmail.com
වෙබ් අඩවියːwww.hrcsl.lk

| පටුන | පිටුව |
| --- | --- |


දැක්ම, මෙහෙවර සහ නිල ලාංඡනය 04

කොමිෂන් සභා සංයුතිය 05

සභාපතිතුමියගේ පණිවුඩය 06

**පළමුවන පරිච්ඡේදය** : හැඳින්වීම 09

1.1. කොමිෂන් සභාවේ සංයුතිය, වගකීම්භාරය සහ කාර්යාවලිය 09

**දෙවන පරිච්ඡේදය :** පරීක්ෂණ සහ විමර්ශන අංශය 14

2.1. ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත 2015 වසරේදී ඉදිරිපත් වූ පැමිණිලි වල දළ විශ්ලේෂණයක් 14

2.1.1. ප්‍රධාන කාර්යාලය

2.1.2. ප්‍රාදේශීය කාර්යාල

2.2. පැමිණිලි විභාග කිරීමේ ක්‍රියාදාමය 17

2.3. පරීක්ෂණ හරහා විශේෂ මැදිහත්වීම් 18

2.4. හදිසි දුරකථන සේවය 19

2.5. ස්ථාන පරීක්ෂණ චාරිකා සහ මෙහෙයුම් යාන්ත්‍රණය 19

2.5.1. පොලිස් ස්ථාන වෙත කෙරෙන රාත්‍රි පරීක්ෂණ චාරිකා සහ බන්ධනාගාර පරීක්ෂණ චාරිකා

**තෙවන පරිච්ඡේදය :** අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය 21

3.1. වැඩසටහන් සම්පාදනය 21

3.2. මානව හිමිකම් ලේඛන සම්පාදනය 21

3.3. යුදහමුදා සහ රාජ්‍ය නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම 22

3.3.1. සම්පත් දායකයින්ගේ සේවය සමග

3.3.2. යුද හමුදා නිලධාරීන් සඳහා මානව හිමිකම් දැනුවත් කිරීමේ වැඩසටහන්

3.3.3. අයිතිවාසිකම් මත පදනම් වූ රාජ්‍ය සේවය සහතික වීම පිණිස නිලතල දරන්නන්ගේ වගකීමට අදාල වැඩමුළු

3.3.4. සුළුජනවාර්ගික කොටස්වල අයිතිවාසිකම් පිළිබඳ පුහුණු වැඩසටහන්

3.4. කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය 24

3.4.1. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට අදාල විශේෂ දේශනය

3.4.2. පුහුණු වැඩසටහන් ( 2015 ඔක්තෝබර් මස 3 දින සිට 5 වන දින දක්වා සහ 10 වන දින සිට 12 වන දින දක්වා)

3.5. නීති සතිය වෙනුවෙන් ශ්‍රී ලං.මා.හි.කො.ස. ප්‍රදර්ශන කුටිය 25
3.6. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය-2015 25
3.7. වෙනත් වැඩසටහන් 26
3.7.1. සිවිල් සමාජය හා සමග සම්බන්ධීකරණය
3.7.1.1. සිවිල් සමාජ රැස්වීම්
3.7.1.2. සිවිල් සමාජ ක්‍රියාකාරී කමිටු රැස්වීම්
3.7.1.3. සිවිල් සමාජය හා අළුතින් පත්වූ කොමිෂන් සභාව සමග රැස්වීම
3.7.2. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට සහනය
3.7.3. මානව හිමිකම් සුරකින්නන්ගේ ආරක්ෂාව සඳහා මාර්ගෝපදේශනය

**සිව්වන පරිච්ඡේදය :** පර්යේෂණ හා අධීක්ෂණ අංශය (පෙර: අධීක්ෂණ හා සමාලෝචන අංශය) 28
4.1. පර්යේෂණ හා අධීක්ෂණ අංශය ස්ථාපනය කිරීම 28
4.2. ජනාධිපති මැතිවරණය - 2015 සම්බන්ධයෙන් ශ්‍රී ලං.මා.හි.කො.ස. වාර්තාව 28
4.2.1. භාෂණ නිදහස
4.3. මහ මැතිවරණය - 2015 30
4.4. බණ්ඩාරවෙල ජල ප්‍රශ්නය 33
4.5. ශ්‍රී ලංකා ආදිවාසීන්ගේ අයිතිවාසිකම් 35
4.6. භාෂා අයිතිවාසිකම් 37
4.7. කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල වාහන තදබදය 37
4.8. විශේෂ සිද්ධීන් 39

**පස්වන පරිච්ඡේදය :** පාලන හා මුදල් අංශය 40
5.1. පාලන අංශය 40
5.2. මුදල් අංශය 40

**හයවන පරිච්ඡේදය -** ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන් ව්‍යාපෘති ශ්‍රී ලං.මා.හි.කො.ස. වෙත සහාය 41
6.1. ව්‍යාපෘති පසුබිම 41
6.2. ක්‍රියාකාරකම් - 1 වන අදියර 42
6.3. ක්‍රියාකාරකම් - 2 වන අදියර 45

**ඇමුණුම්**

## දැක්ම

සැමට මානව හිමිකම් සහතිකවීම සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය හා සුරැකීම අපගේ දැක්මයි.

## මෙහෙවර

සැමට මානව හිමිකම් තහවුරු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා ක්‍රියා කරනු ලබන සියළුම පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය හා සහයෝගිතාවය සමග, ශ්‍රී ලාංකීය පුරවැසියන් සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තහවුරු කොට ඇති මූලික අයිතිවාසිකම් විශේෂයෙන් අවධාරණය කරමින්, විශ්වය පුරා පිළිගනු ලැබ ඇති මානව හිමිකම් ධර්මතාවයන්ට සහ ප්‍රතිපත්තිමය මූලධර්මයන්ට අනුගත වෙමින්, නීතිය, ප්‍රතිපත්තිය මෙන්ම ව්‍යවහාරයෙහි ලා සියළු දන මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය හරහා ශ්‍රී ලංකාවේ වඩාත් හොඳ මානව හිමිකම් සංස්කෘතියක් සම්පාදනයට කැපවීම අපගේ මෙහෙවර වන්නේය.

## නිල ලාංඡනය

ජාතික මට්ටමින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීමෙහි ලා ජාතික මානව හිමිකම් ආයතනයට පැවරී ඇති වගකීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි නිල ලාංඡනයෙන් විදහා දැක්වෙයි. නිල් පැහැයෙන් පිළිබිඹු වන්නේ මානව වර්ගයාගේ උද්‍යෝගය සහ නිර්මාණශීලිත්වයයි. බාහු යුගලයෙන් දැක්වෙන්නේ ආරක්ෂාව සහ ආරක්ෂාව සාක්ෂාත්කර ගැනීමේ ක්‍රියාකාරිත්වයයි. ලෝක ගෝලය කියාපාන්නේ ලෝකය සිසාරා මානව හිමිකම් ප්‍රසාරණය වීම සහ ජාත්‍යන්තර මට්ටමින් සලසා ඇති ආරක්ෂාවයි. ජාතික මට්ටමින් සුරක්ෂාව සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා සිතියමෙන් ප්‍රකාශයට පත් කෙරේ. ගැහැණියකගේ, පුරුෂයෙකුගේ සහ දරුවෙකුගේ ප්‍රතිරූපයෙන් ප්‍රකාශයට පත් කෙරන්නේ සියල්ලන්ටම සමානව මානව අයිතිවාසිකම් ආරක්ෂණය පැතිර යා යුතු බවයි.

## කොමිෂන් සභාවෙහි සංයුතිය (2015 ඔක්තෝබර් මස 21 වන දින දක්වා)

සභාපති

විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා මැතිතුමා

කොමසාරිස්වරුන්

ටී. ඊ. ආනන්දරාජා මහතා

ජෙසීමා ඉස්මායිල් මහත්මිය

ආචාර්ය එස්. ඩබ්. ප්‍රතිභා මහානාමහේවා මහතා

වෛද්‍ය. බර්නාඩ් ද සොයිසා මහතා

යථෝක්ත කොමිෂන් සභාවෙහි අනුප්‍රාප්තික ලෙස
පහත දැක්වෙන සංයුතියෙන් සමන්විත වත්මන් කොමිෂන් සභාව පත් කෙරිණ.

සභාපතිතුමිය

ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මැතිතුමිය

කොමසාරිස්වරුන්

එච්. ගසාලි හුසේන් මහතා
සාලිය පීරිස් මහතා
අම්බිකා සත්කුණනාදන් මෙය
ආචාර්ය උපනන්ද විදානපතිරණ මහතා

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# වාර්ෂික වාර්තාව - 2015

## සභාපතිතුමියගේ පණිවුඩය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී පැවති කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වල සංක්ෂිප්ත වාර්තාවක් සැපයීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නව සභාපතිනිය ලෙස පත්වූ මා මුහුණ දෙන ප්‍රත්‍යක්ෂ වශයෙන් දුෂ්කර කාර්ය භාරයකි. එකී දුෂ්කරතාවය ගැබ්ව ඇත්තේ එකී කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් එහි ප්‍රතිපත්ති හා තර්කනයේ සාරය ග්‍රහණය කර ගනිමින් සාකච්ඡාවට භාජනය කිරීමයි. එමනිසා, නව කොමිෂන් සභාවෙහි දැක්ම සහ ශ්‍රී ලංකාවෙහි මානව හිමිකම් ප්‍රවර්ධනය සහ සුරක්ෂාව ශක්තිමත් කරලීමේ සැලසුම් කෙරෙහි අවධානය යොමු කරනු ලබන පණිවුඩයක් නිකුත් කිරීම හුදෙක් සාධාරණීකරණය කළ හැකි යැයි සිතමි.

2015 අප්‍රේල් මාසයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ නව කොමිෂන් සභාව පත් කරන ලද අතර, කොමිෂන් සභාවෙහි නව කොමසාරිස්වරුන් පත් කරන ලද්දේ 2015 ඔක්තෝබර් මාසයේදීය.

සංක්‍රාන්තික සාධාරණත්වය සහ පශ්චාත් සිවිල් යුධ සංහිඳියාව පිළිබඳ ක්‍රියාදාමයක් දියත් කිරීම ඇතුළුව, සියල්ලන්ගේම මානව අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන බවට හා ප්‍රජාතාන්ත්‍රීයකරණය පිළිබඳ ප්‍රතිඥා දුන් දේශපාලන සංකලනයක් උදෙසා ශ්‍රී ලාංකීය ජනතාව විසින් වර්ෂය ආරම්භයේදී ස්වකීය ඡන්දය භාවිතා කරන ලදී. අධිකරණයෙහි ස්වාධීනත්වය ප්‍රකෘතිමත් කිරීම සහ අධීක්ෂණ කොමිෂන් සභා සඳහා ඉස්මතු වූ දැඩි ජනතා ඉල්ලීමට කන්දෙමින් 19 වන සංශෝධනය නීතිගත කෙරිණි. අහෝසි කරන ලද 18 වන සංශෝධනය යටතේ අධිකරණයෙහි සහ අධීක්ෂණ කොමිෂන් සභාවන්හි පත්වීම් මධ්‍යගත වූයේ විධායක ජනාධිපති ධූරය තුළය.

ශ්‍රී ලංකාවෙහි ප්‍රජාතාන්ත්‍රිකරණ ක්‍රියාදාමයෙහි ලා 19 වන සංශෝධනයෙහි වැදගත්කම ගැන මෙන්ම මානව හිමිකම් සුරක්ෂිත කිරීම උදෙසා වන ඉහළ ජනතා අපේක්ෂාවන් පිළිබඳව කොමිෂන් සභාව නිරන්තරයෙන් මෙනෙහි කරනු ලබයි.

මානව හිමිකම් කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පැවැත්ම ශක්තිමත් කරලීමෙහි ලා නව කොමසාරිස්වරුන් දැඩි කැපවීමකින් යුතු වන අතර, ඔවුහු බොහෝ දෙනෙක් මානව හිමිකම් ක්‍රියාධරයන් ලෙස දීර්ඝ කාලයක් අත්දැකීම් ලද වුවන් වෙති. මානව හිමිකම් ක්‍රියාධරයන් ලෙස අපි 19 වන සංශෝධනය ඇතුළු ප්‍රජාතන්ත්‍රී ප්‍රතිසංස්කරණයන් නිරන්තරයෙන්ම ඉල්ලා සිටියෙමු.

නව කොමිෂන් සභා සංයුතියෙන් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සහ ආගමික විවිත්‍රත්වයද පිළිබිඹු වේ. කොමසාරිස් මණ්ඩලයේ දෙදෙනෙකු කාන්තාවන් වන අතර, ඉන් එක් අයෙකු සභාපතිත්වය උසුලනු

ලැබේ. මානව අයිතිවාසිකම් පිළිබඳ පුළුල් අත්දැකීම් සහ විශේෂ විශේෂඥ දැනුම් සම්භාරයක් කැටිකර ගත් සහෝදර කොමසාරිස්වරුන් පිරිසක් සමඟ කටයුතු කරන්නට ලැබීම සභාපතිනිය ලෙස භාග්‍යයක් කොට සලකමි.

ස්වකීය කාර්ය මණ්ඩලය (මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාල 10හි කාර්ය මණ්ඩලය ඇතුළුව) සිවිල් සමාජ සංවිධාන හා මාධ්‍යවේදීන් සමඟ පුළුල් පරාසයක් තුල සාකච්ඡාවන්හි නිරත වීමට කොමිෂන් සභාව විසින් වහාම පියවර ගන්නා ලදී. මෙම සාකච්ඡා හේතුකොට ගෙන කොමිෂන් සභාවේ යෝජිත දැක්ම සහ යෝජිත කාර්ය සැලසුමට අදාළ කරුණු බෙදාහදා ගැනීමට සහ අදාළ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් ලබා ගැනීමේ අවස්ථාව කොමසාරිස්වරුන්ට උදාවිය.

පළමුව, නව කොමිෂන් සභාවේ මාර්ගෝපදේශනාත්මක මූලධර්මය වන්නේ, ශක්තිමත් ස්වාධීනත්වය සහ ජනතාවට හිතකර ආකාරයකට සේවය කිරීම බව අපි පෙන්වා දුන්නෙමු. ජනතා මතිමතාන්තර පරම වැදගත්කමකින් යුක්තය. ඒ හා සමානවම, සිවිල් සමාජ සංවිධානයන් හා සමඟ දැඩි සම්බන්ධතාවයක් පවත්වා ගෙනයාම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයකි.

දෙවනුව, ප්‍රමුඛතාගත ගැටලු/ක්‍රියාකාරකම් හඳුනා ගන්නා ලදී:

- යෝජිත සංක්‍රාන්තික යුක්තිය ඉටු කරගැනීමෙහිලා මානව හිමිකම් අධීක්ෂණය සැලසීම
- මානව අයිතිවාසිකම් වල ව්‍යවස්ථාමය ආරක්ෂාව ශක්තිමත් කිරීමෙහිලා යෝජිත ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට මැදිහත් වීම
- වගවීමෙන් මුක්ත වීම අවසන් කිරීම පිණිස නීතිය බලාත්මක කරන්නවුන් විසින් කෙරෙන බරපතල වධහිංසා සහ අනෙකුත් උල්ලංඝණයන් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම
- සැමගේ අයිතිවාසිකම් සුරකෙන බවට සහතිකවීම් වස් කොන් වූ සමාජීය කණ්ඩායම් වල අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කිරීම
- අයිතිවාසිකම් බෙදා වෙන් කළ නොහැකිය යන මූලධර්මය කෙරෙහි කොමිෂන් සභාවෙහි කැපවීම සහ බැඳීම හුවා දක්වනු ලබන ආර්ථිකමය සහ සාමාජීය අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කිරීම

තෙවනුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ක්‍රියාකාරිත්ව ක්‍රමවේදයන්ට අදාළ වූ යෝජිත ප්‍රතිසංස්කරණයන් ගෙනහැර දක්වන ලදී.

සාකච්ජාමය ක්‍රියාදාමයක් තුලින් 2016 වසරේදී උපායමාර්ගික සැලසුමක් සම්පාදනය කිරීමට කොමිෂන් සභාව කැපවී සිටියි. නීති සම්පාදන සහ පරිපාලනමය ව්‍යවහාරයන් මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට (මූල් ව්‍යවස්ථාවේ 10(සී) සහ (ඩී) වගන්ති) අනුකූල වන බවට සහතිකවීම් වස් රජයට උපදෙස් ලබාදීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි උපදේශාත්මක ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදීමද වඩාත් වැදගත් නව ප්‍රතිපත්ති ඉලක්කයකි. ඒ හා සමානවම, විමර්ශන/පරික්ෂණ ක්‍රියාදාමය විධිමත් කිරීමද ප්‍රමුඛතාවයකි. කටයුතු නිම නොවී පවත්නා පැමිණිලි

සම්භාරය සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීමටද පියවර ගත යුතුව ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි විෂය පථය යටතට සෘජුවම නොගැනෙන පැමිණිලි අදාළ වෙනත් සහන යාන්ත්‍රණයන් වෙත යොමු කෙරෙන අතරතුර, විමර්ශන හා පරීක්ෂණ ක්‍රියාදාමය සරල කිරීම ද කළ යුතු වේ.

ආයතනික ඒකග්‍රතාවය තහවුරු කරලීම පිණිස ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 10 අතර වැඩිදියුණු වූ සහසම්බන්ධතාවය අවශ්‍ය ප්‍රමුඛතාවයකි. එසේම, කාර්ය ක්‍රමවේදයන් කඩිනම් කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිතය නවීකරණය කිරීම මෙන්ම ඒ පිළිබඳව කාර්ය මණ්ඩලය ධෛර්යමත් කරවීමේ අවශ්‍යතාවය ද හඳුනාගෙන ඇත.

විශේෂයෙන්ම නව ප්‍රමුඛතාවයන්ට අනුගතවී කටයුතු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ නිපුණත්වය ඉහළ නැංවීම අවශ්‍යයෙන්ම කළයුතු කාර්යයකි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රතිසංවිධානය කිරීමෙහිලා සහ දිශාභිමුඛ කිරීමෙහිලා තමන් මුහුණ දෙනු ලබන අභියෝගයන්හි විශාල පරිමාණය නව කොමිෂන් සභාව විසින් පැහැදිලිව හඳුනා ගනු ලැබ ඇත. කෙසේ වුවද, කොමසාරිස්වරුන්ගේ පෞද්ගලික කැපවීම සහ සියලුම පාර්ශ්වයන්ගෙන්, විශේෂයෙන්ම සිවිල් සමාජ සංවිධාන සහ පොදු ජනතාවගෙන් ලැබී ඇති සහයෝගය සහ හොඳහිත හේතුවෙන් තමන් වෙත පැවරී ඇති කාර්යභාරය වඩා පහසු කටයුත්තක් වන බව කොමිෂන් සභාවේ විශ්වාසයයි.

ආචාර්ය දීපිකා උඩගම

සභාපතිනි

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# පළමුවන පරිච්ඡේදය : හැඳින්වීම

ජනවාරි මාසයේදී පවත්වන ලද ජනාධිපතිවරණය සහ අගෝස්තු මාසයේදී පවත්වන ලද මහා මැතිවරණය වැනි දිවයිනෙහි අතිශයින් විශේෂිත වෙනස්කම් ගණනාවකට 2015 වසර සාක්ෂි දරයි. බරපතල ප්‍රචණ්ඩකාරී සිද්ධීන්ගෙන් තොර, සාපේක්ෂකව සාමකාමී වූ වාතාවරණයක මෙකී මැතිවරණයන් පැවැත්විණ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව හා එක්ව, අතිශයින් සක්‍රීය කාර්යදාමයක නියැළුණ අතර, මෙම වාර්තාවේ දෙවන ඡේදයෙහි, මෙහෙයුම් හා සමාලෝචන අංශයේ ක්‍රියකාරකම් දැක්වෙන කොටසෙහි මනාව හුවා දක්වා ඇති පරිදි, නිදහස් හා සාධාරණ මැතිවරණයන් සහතික කරගැනීම සඳහා විවිධ පියවර ගන්නා ලදී.

විධායක ජනාධිපති බලතල සීමා කරමින් ද, රටෙහි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් සහ ස්වාධීන කොමිෂන් සභා යළිත් ස්ථාපනය කිරීමට මග සලසමින් ද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 19 වන සංශෝධනය අනුමත විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද 2015 ඔක්තෝබර් මාසයේදී ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස ප්‍රතිස්ථාපිත කෙරිණ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2015 වසර තුළදී මෙහෙයවන ලද ක්‍රියාකාරකම් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

## 1.1 කොමිෂන් සභාවේ සංයුතිය, වගකීම්භාරය සහ කාර්යාවලිය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වූ කලී, ශ්‍රී ලාංකීය ජනතාවගේ මානව අයිතිවාසිකම් වර්ධනය සහ සුරක්ෂාව උදෙසා, 1996 අංක 21 දරණ පනතින් ස්ථාපිත කරන ලද ස්වාධීන ආයතනයකි.

පනතේ 10 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි, කොමිෂන් සභාවෙහි කාර්යභාරය පහත දැක්වෙන පරිදි වේ.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් වලට අදාළ ප්‍රතිපාදනයන්ට අනුගත වන බවට සහතිකවීමේ අරමුණින්, ක්‍රියාපරිපාටීන් සම්බන්ධයෙන් කෙරෙන පැමිණිලි පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම සහ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගරුත්වය දැක්වීම හා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම,

(ආ) මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම හෝ උල්ලංඝණය වීමට ඉඩකඩ සැලසෙමින් පවතින අවස්ථාවන් සම්බන්ධයෙන් කෙරෙන පැමිණිළි පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සහ මෙහි පහත සලසා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, අවිරෝධයෙන් හා සමථකරණයෙන් එකී පැමිණිලි විසඳාලීම,

(ඈ) මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ සුරක්ෂාව වැඩිදියුණු කරලීමෙහි ලා, නීති, පරිපාලන නියමයන් සහ ක්‍රියා පටිපාටීන් පැනවීම පිණිස රජයට උපදෙස් දීම සහ සහාය වීම,

(ඈ) ජාතික නීති මාලාවන් සහ පරිපාලන ව්‍යවහාරයන්, ජාත්‍යන්තර මානව හිමිකම් ධර්මතාවයන්ට සහ ප්‍රමිතීන්ට අනුගත වන බවට සහතිකවීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම,

(ඉ) මානව හිමිකම් ක්ෂේත්‍රයෙහි ගිවිසුම් වලට සහ වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රයන්ට අත්සන් තැබීම සහ එකඟව ක්‍රියා කිරීමට අදාළව, රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම, සහ

(ඊ) මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත්වීම සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

ස්වකීය කාර්යභාරය ඉටු කිරීම පිණිස, කොමිෂන් සභාවට පුළුල් පරාසයක බලතල පැවරී ඇත. එකී බලතල පනතේ II වන කොටසෙහි දක්වා ඇත. පහත දැක්වෙන ක්‍රියාදාමයන් සඳහා පැවරෙන බලතල එහි අන්තර්ගතය.

(1) මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම හෝ උල්ලංඝණය වීමට ඉඩකඩ සැලසෙමින් පවතින අවස්ථාවන් විමර්ශනය,

(2) මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම හෝ උල්ලංඝණය වීමට ඉඩකඩ සැලසෙමින් පවතින අවස්ථාවක් සම්බන්ධයෙන් කිසියම් උසාවියක නඩුවක් විභාගවෙමින් පවතින අවස්ථාවක, එකී උසාවියේ අවසරය ඇතිව, එකී නඩු කටයුතු වලට මැදිහත්වීම,

(3) උසාවි නියෝගයකින් හෝ වෙනත් ආකාරයකට පුද්ගලයින් රඳවා ගෙන ඇති ස්ථාන ක්‍රමිකව පරීක්ෂාවට ලක් කිරීමෙන් එකී රැඳවියන්ගේ සුබසාධන කටයුතු ගැන සොයා බැලීම සහ එකී රැඳවුම් ස්ථානවල රැඳවුම් තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි නිර්දේශ ඉදිරිපත් කිරීම,

(4) මහාධිකරණය විසින් යොමු කරන ලද කරුණු සම්බන්ධයෙන් මහාධිකරණයෙන් නියම කෙරෙන ආකාරයට, අවශ්‍ය පියවර ගැනීම,

(5) වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම මගින් මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් පර්යේෂණ වල නියැලීම හා අයිතිවාසිකම්

පිළිබඳ දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම සහ එවන් පර්යේෂණයන්හි ප්‍රතිඵල පතළ කර හැරීම,

(6) පනතේ 14 වන කොටස යටතේ, පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා කෙරෙණ වියදම් පියවා ගැනීම පිණිස ප්‍රමාණවත් විය හැකි කිසියම් මුදල් ප්‍රමාණයක්, පීඩාවට පත් තැනැත්තෙකු වෙත හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකු වෙත ප්‍රදානය කිරීම,

(7) ස්වකීය කාර්යභාරය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ හේතුපාදක වන හෝ පරිදි වෙනයම් සෑම කටයුත්තක්ම ඉටු කිරීම.

මානව හිමිකම් වලට අදාළ කරුණු සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පළපුරුද්ද හෝ ඇති පුද්ගලයින් අතුරින් තෝරා ගනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් එකී කොමිෂන් සභා සාමාජිකයින් පත් කිරීමට පනතේ 3 වන කොටසෙහි විධිවිධාන සලසා ඇත. කොමිෂන් සභාවේ එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කෙරේ. 2015 මැයි මාසයේදී අනුමත වූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාලනය වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළු ශ්‍රී ලංකාවේ ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයින් පත් කිරීම, ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකා ජනාධිපතිතුමන් විසින් කළ යුතු බව, 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 19 වන පරිච්ඡේදයෙහි දක්වා ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, 2015 පෙබරවාරි මස 12 වන දින ස්වකීය නිලකාලය අවසන් වූ කොමසාරිස්වරයා හැර, පසුගිය 2014 වසරේ සේවය කළ කොමිෂන් සභා සාමාජිකයෝ 2015 ඔක්තෝබර් මස 21 වන දින දක්වා අඛණ්ඩව සේවයේ නිරත වූහ.

සභාපතිවරියකගෙන් සහ කොමසාරිස්වරුන් සිව් දෙනෙකුගෙන් සමන්විත වත්මන් කොමිෂන් සභාව පත් කරන ලද්දේ 2015 ඔක්තෝබර් මස 21 වන දිනය. කොමිෂන් සභාවෙහි පස්වන සාමාජිකයා පත් කරන ලදදේ 2015 නොවැම්බර් මස 13 වන දිනය.

අලුතින් පත් කරන ලද කොමිෂන් සභාව විසින්, 2015 නොවැම්බර් මස 16 වන දින, කොළඹ 08, කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලදී. එහි ප්‍රධාන අරමුණ වූයේ, කොමිෂන් සභාවෙහි ඉදිරි කටයුතු සම්බන්ධයෙන් මාධ්‍ය දැනුවත් කිරීමයි.

වර්ෂ 3 ක කාලපරාසයක් සඳහා පත් කරන ලද වත්මන් කොමිෂන් සභාව, 2015 ඔක්තෝබර් මස 30 වන දින ස්වකීය කටයුතු ආරම්භ කරන ලද අතර, සමාලෝචනයට භාජනය වන වර්ෂය අවසන් වන

තුරුම ස්වකීය කාර්යයන්හි නිරතව සිටින ලදී. පනතෙහි දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා, පනතේ 22 වන කොටස ප්‍රකාර පත් කරන ලද ලේකම්වරයෙකු මෙන්ම අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් ද සිටිති.

කොමිෂන් සභාව අංශ හතරකින් සමන්විතය.

- පරීක්ෂණ හා විමර්ශන අංශය
- මෙහෙයුම් හා සමාලෝචන අංශය
- අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය
- පාලන හා මුදල් අංශය

එක් එක් අංශය අධ්‍යක්ෂවරයෙකුගේ පාලනය යටතේ පවතී.

කොමිෂන් සභා කටයුතු වඩාත් කාර්යක්ෂම ඉටු කිරීම සඳහා අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, යාපනය, කල්මුණේ, මහනුවර, මාතර, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කර ඇති අතර, කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීම පිණිස ඒ එක් එක් ප්‍රාදේශීය කාර්යාලය ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරයෙකුගෙන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල වලින් සමන්විතව ඇත. මෙයට අමතරව, සමහර ප්‍රාදේශීය කාර්යාල යටතේ විවිධ ස්ථානවල උප කාර්යාල ක්‍රියාත්මක වේ. ඒ අනුව මන්නාරම, කිලිනොච්චි, මුලතිව්, පුත්තලම, නුවරඑළිය සහ පොළොන්නරුව යන ස්ථානවල උප කාර්යාල ස්ථාපිතව ඇත.
(මෙම වාර්තාවට යාකර ඇති **ඇමුණුම් 1ඒ** හි දැක්වෙන, ශ්‍රී ලං.මා.හි.කො.ස. ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වල පිහිටීම දැක්වෙන ශ්‍රී ලංකා සිතියම බලන්න).

සමාලෝචනයට භාජනය වන වසර තුළ, කොමිෂන් සභාව විසින් දේශීය හා විදේශීය ආයතන ගණනාවක් සමග රැස්වීම්වලට සහභාගී වී ඇත. වෙනත් ආයතන අතර, පැෆරල් ආයතනය, ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිතායතනය සහ මැතිවරණ කොමසාරිස් ද එයට ඇතුළත්ය.

(ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2015 වසරේදී සහභාගී වූ රැස්වීම්වල සමස්ත විස්තරය සඳහා මෙම වාර්තාව අවසානයේ යා කර ඇති **ඇමුණුම් 1බී** බලන්න).

කොමිෂන් සභාවේ කටයුතුවලට සහාය වීම් වස් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනින් නොමසුරු ප්‍රදානයක් ද හිමි විය. (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා සමග සහයෝගිතාවයට අදාළ විස්තරාත්මක ප්‍රකාශනයක් මෙම වාර්තාවේ 6 වන පරිච්ඡේදයට ඇතුළත් කර ඇත).

2015 වසරේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 233ක් වූ නමුදු, අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබූ හෙයින්, අතිරේක නිලධාරීන් බඳවා ගැනීම කළ නොහැකි විය. 2015 වසරේදී ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල සතුව තිබූ සමස්ත සේවක සංඛ්‍යාව 161කි. කොමිෂන් සභාව සඳහා අරමුදල් සපයන ප්‍රධානතම ආයතනය වන්නේ රජයේ මහා භාණ්ඩාගාරයයි. 2015 වසර සඳහා කොමිෂන් සභාව වෙත වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදනය රුපියල් 186,500,000.00කි.

(2015 වසරේ, ශ්‍රී ලංකා මානව කොමිෂන් සභාවේ වියදම් වලට අදාළ සවිස්තරාත්මක ප්‍රකාශනය සඳහා මෙම වාර්තාවට යා කර ඇති **ඇමුණුම් 1 සී** බලන්න).

# දෙවන පරිච්ඡේදය : පරීක්ෂණ සහ විමර්ශන අංශය

## 2.1. 2015 වසරේද ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත ලද පැමිණිලි වල දළ විශ්ලේෂණය

පෙර වසරවලදී ද අනුගමනය කරන ලද පරිදි, ප්‍රධාන කාර්යාලයේදී සහ ප්‍රාදේශීය කාර්යාලවලදී පැමිණිලි භාරගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් පරිපාටියක් අනුගමනය කෙරිණ.

### 2.1.1. ප්‍රධාන කාර්යාලය

2015 වසරේදී මහජනතාව විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කරන ලද සමස්ත පැමිණිලි සංඛ්‍යාව 4724ක් වන අතර, විශාලතම පැමිණිලි සඛ්‍යාව (22.30%) සේවා නියුක්තියට අදාළව වේ. ඊළඟට ගැණෙන්නේ පෞද්ගලික නිදහස කඩවීම් පිළිබඳ පැමිණිලි (19.97%) ය. හිංසනයට අදාළ පැමිණිලි (6.75%) ද, අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් වලට අදාළ පැමිණිලි (5.57%) ද, බරපතල වධහිංසා වලට අදාළ පැමිණිලි (4.72%) ද සමස්ත පැමිණිලි සංඛ්‍යාවට අයත්ය. කෙසේවුවද, 2015 වසරේදී බරපතල වධහිංසාවලට අදාළ පැමිණිලි වල අඩුවීමක් පෙනී යයි. තවද, පැමිණිලි වලින් 15.79%ක් අදාළ වන්නේ ජනතාවගේ දුක්ගැනවිලිවලට අදාළව කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් විසින් දක්වන ලද උදාසීනත්වයටයි. 2015 වසරේදී ප්‍රධාන කාර්යාලය විසින් විභාග කර නිම කරන ලද පැමිණිලි සංඛ්‍යාව 1891කි.

### 2.1.2. ප්‍රාදේශීය කාර්යාල

#### i. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය

2015 වසරේදී අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව 141කි. සුදුසු පරිදි ක්‍රියාකර බැහැර කරන ලද පැමිණිලි සංඛ්‍යාව 134කි. 2015 අවසානය වන විට අතරැඳි පැමිණිලි සංඛ්‍යාව 78කි. නැවත ද, ලත් විශාලතම පැමිණිලි සංඛ්‍යාව අදාළ වන්නේ සේවා නියුක්තියට අදාළවය (36.8%). ඊළඟට ඉඩම් හා දේපළවලට අදාළ පැමිණිලි ( 25.5%) ය. තෙවනුව, සමාජ සුබසාධනයට අදාළ පැමිණිලි (12.76%) ය. සිව්වන ස්ථානයට ගැනෙන පෞද්ගලික නිදහසට අදාළ පැමිණිලි ප්‍රමාණය 9.21%කි.

#### ii. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය

2015 වසරේදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව 652ක් වන අතර, විභාග කර නිම කරන ලද පැමිණිලි සංඛ්‍යාව 637කි. 2015 දෙසැම්බර් මස 31 වන දින වන විට අතරැඳි පැමිණිලි සංඛ්‍යාව 514කි. ඉහළම පැමිණිලි ප්‍රතිශතය (22.69%) දේපළ වලට අදාළ කරුණු සම්බන්ධයෙනි. සේවා නියුක්තියට අදාළ පැමිණිලි සංඛ්‍යාව 21.62% කි. සමස්ත පැමිණිලි

සංඛ්‍යාවෙන් 17.48%ක් පෞද්ගලික නිදහසට අදාළ පැමිණිලි වන අතර, වගකිවයුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයට අදාළ පැමිණිලි ප්‍රමාණය 18.25%කි.

### iii. බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය

2015 වසරේදී බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව 273ක් වන අතර, විභාග කර නිම කරන ලද පැමිණිලි සංඛ්‍යාව 191කි. 2015 වර්ෂය අවසානය වන විට අතරැදි පැමිණිලි සංඛ්‍යාව 177කි. ඉහළම පැමිණිලි ප්‍රතිශතය අදාළ වන්නේ සේවා නියුක්තියටය. ඊලඟට පෞද්ගලික නිදහස කඩවීම් (18.31% ) වන අතර, ඉඩම් හා දේපළ වලට අදාළ පැමිණිලි ප්‍රමාණය 17.21% කි. පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහි ලා, වගකිවයුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයට අදාළව ලත් පැමිණිලි ප්‍රමාණය 6.59% කි.

### iv. මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය

වර්ෂය තුළදී, මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයට පැමිණිලි 433ක් ලැබී ඇත. පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලැබූ පැමිණිලි ඇතුළුව, පැමිණිලි 441ක් සුදුසු පරිදි ක්‍රියා කර අවසන් කර ඇත. පැමිණිලි 157ක් ඉදිරි වර්ෂයට ගෙන ගොස් තිබේ. 2015 වසරේදී මඩකලපුව කාර්යාලයට ලද පැමිණිලි වලින් 31.40%ක් රාජ්‍ය නිලධාරීන් විසින් දක්වන ලද උදාසීනත්වය සම්බන්ධයෙන් වන අතර, පෞද්ගලික නිදහසට අදාළ පැමිණිලි අනුපාතය 28.17%කි. සේවා නියුක්තියට අදාළ පැමිණිලි 11.17%ක් වන අතර, දේපළ වලට අදාළ පැමිණිලි 7.62 %කි.

### v. යාපනය ප්‍රාදේශීය කාර්යාලය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය ප්‍රාදේශීය කාර්යාලයට පමණක් ලද පැමිණිලි සංඛ්‍යාව 315කි. 2015 වසරේදී පැමිණිලි 317ක් විභාග කර නිම කරන ලද අතර, 2015 වසරේදී ලද පැමිණිලි 234ක් සහ පෙර වර්ෂවලදී ඉදිරිපත් කරන ලද පැමිණිලි 83ක් එයට ඇතුළත්ය. යාපනය ප්‍රාදේශීය කාර්යාලයට ලද සමස්ත පැමිණිලි සංඛ්‍යාවෙන් 23.49% ක් වගකිව යුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයට අදාළව ලත් පැමිණිලි වන අතර, පෞද්ගලික නිදහසට අදාළ පැමිණිලි ප්‍රමාණය 20.63%කි. සමාජ සුබසාධනයට අදාළ පැමිණිලි ප්‍රමාණය ද 20.63%කි. ඊලඟට 14.92%ක් වූ අධ්‍යාපන කටයුතු වලට අදාළ පැමිණිලි යටතට ගැණෙන අතර, ළමා අයිතිවාසිකම් වලට අදාළ පැමිණිලි සංඛ්‍යාව 0.63 %කි.

### (අ) කිලිනොච්චි උපකාර්යාලය

යාපනයේ ශ්‍රී ලං.මා.හි.කො.ස. කාර්යාලය විසින් 2012 ඔක්තෝබර් මස 03 වන දින කිලිනොච්චියේ උප කාර්යාලයක් විවෘත කරන ලදී. 2015 වසරේදී පැමිණිලි 101ක් මෙම උප කර්යාලයට ලැබී ඇත. එයින් 29.70%ක් අදාළ වන්නේ ඉඩම් හා දේපළ වලට වන අතර, පෞද්ගලික නිදහස කඩවීම් 22.77%ක් ලෙස ද, අධ්‍යාපනයට අදාළ පැමිණිලි 11.88% ක් ලෙස ද හඳුනා ගෙන ඇත. එසේම,

සේවා නියුක්තිය සම්බන්ධයෙන් ලත් පැමිණිලි 10.89%ක් ද, වගකිවයුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වය සම්බන්ධයෙන් වූ පැමිණිලි 7.92%ක් ද වේ.

### vi. කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය

වර්ෂය තුළදී, පැමිණිලි 250ක් ලැබී ඇත. 2015 වසරේදී ලත් පැමිණිලි 126ක් ඇතුළුව, පැමිණිලි 262ක කටයුතු නිම කර ඇත. පැමිණිලි 154ක් 2016 වර්ෂය කරා ගෙන යන ලදී. සේවා නියුක්තියට අදාළ පැමිණිලි 29.2%ක් වන අතර, කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලයට ලද රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයට අදාළ වැඩිම පැමිණිලි ප්‍රමාණය 19.2% කි. පෞද්ගලික නිදහස කඩවීම් 16%ක් වන අතර, දේපළ ආරාවුල්වලට අදාළ පැමිණිලි අනුපාතය 12.4 %කි.

### vii. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

2015 ජනවාරි මස 01 වන දින විට, පසුගිය වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි 146ක් විය. 2015 වසරේදී, ප්‍රධාන කාර්යාලය විසින් යොමු කරන ලද පැමිණිලි 123ක් සහ නුවරඑළිය ජංගම කාර්යාලය විසින් එවන ලද පැමිණිලි 56ක් මෙම කාර්යාලයට ලැබුණු අතර, ඍජුවම ලත් පැමිණිලි සංඛ්‍යාව 700කි. ඒ අනුව, 2015 වසරේදී මෙම කාර්යාලය විසින් පැමිණිලි 1024ක් සම්බන්ධයෙන් කටයුතු කෙරිණ. මෙයින් පැමිණිලි 161ක් මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය පථයට අයත් නොවීය. 2015 වසරේදී පැමිණිලි 684 සම්බන්ධයෙන් කටයුතු අවසන් කෙරිණ. ඒ අනුව 2016 ජනවාරි මස 01 වන දිනට ගෙන යන ලද පැමිණිලි සංඛ්‍යාව 179කි. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය වෙත ගොනු කරන සේවා නියුක්තියට අදාළ පැමිණිලි අනුපාතය 21.75%කි. වගකිවයුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයට අදාළව පැමිණිලි 23.23%ක් වන අතර, පෞද්ගලික නිදහස කඩවීම් වලට අදාළ පැමිණිලි 10.59%කි. අධ්‍යාපනයට අදාළව 8.31%ක් ද, දේපළ ආරාවුල් වලට අදාළව 6.94% ක් ද වන අතර, සමාජ සුබසාධනයට අදාළ පැමිණිලි අනුපාතය 2.05%කි.

### viii. මාතර ප්‍රාදේශීය කාර්යාලය

2015 ජනවාරි මස 01 වන දින විට මෙම කාර්යාලයේ තිබූ පැමිණිලි සංඛ්‍යාව 156කි. 2015 වසර තුළදී පැමිණිලි 646ක් ලද අතර, වසර තුළදී පැමිණිලි 621ක කටයතු අවසන් කර ඇත. පැමිණිලි 181ක් 2016 වසර කරා ඉදිරියට ගෙන යන ලදී. මාතර ප්‍රාදේශීය කාර්යාලයට ලද පෞද්ගලික නිදහස කඩවීම් වලට අදාළ පැමිණිලි 22.91%ක් වූ ඉහළ අනුපාතයක පැමිණිලිය. සේවා නියුක්තිය 23.06%ක් ද, අධ්‍යාපනය 10.37%ක් ද වන අතර, දේපළ ආරාවුල් 15.94%කි. කෙසේවුවද, සමාජ සුබසාධන (1.54%), ළමා අයිතිවාසිකම් (0.30%) හා පාරිසරික (2.63%) පැමිණිලි අඩු අනුපාතයකට අයත් බව පෙනේ.

### ix. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය

2015 වසරේදී පැමිණිලි 152ක් ලද අතර, 2014 වසරේදී කටයුතු අවසන් නොවූ පැමිණිලි 71ක් 2015 වසරට ගෙන එන ලදී. ඒ අනුව 2015 වසරේදී ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය විසින් කටයුතු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 223කි. ඉන් 166ක් අවශ්‍ය විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව කරන ලද නිගමනයන් අනුව වසා දමන ලදී. 2016 ජනවාරි මස 01 වන දින වනවිට පැමිණිලි 57ක කටයුතු කළ යුතුව තිබිණ. මෙම කාර්යාලයෙහි වැඩිම සංඛ්‍යාවක පැමිණිලි (34.21%) අදාළ වූයේ වගකිව යුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයටය. ඊලඟට 22.36%ක් වූ සේවා නියුක්තියට අදාළ පැමිණිලි, 14.47% ක් වූ පෞද්ගලික නිදහසට අදාළ පැමිණිලි සහ 12.5% ක් වූ දේපළ ආරාවුල් වලට අදාළ පැමිණිලි වලට අමතරව, 3.28 %ක් වූ අධ්‍යාපනයට අදාළ පැමිණිලි සහ 1.97%ක් වූ සමාජ සුබසාධනයට අදාළ පැමිණිලි ද මෙම කාර්යාලයට ලැබී ඇත.

### x. වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය

2015 වසරේ දී, මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පැමිණිලි 284ක් වවුනියාව ප්‍රාදේශීය කාර්යාලයට ලැබී ඇත. වැඩිම පැමිණිලි සංඛ්‍යාව (39.43%) පෞද්ගලික නිදහස කඩවීම්වලට අදාළ පැමිණිලි ය. මෙයට අමතරව, 19.36%ක් වූ දේපළ ආරාවුල් පැමිණිලි ද, 13.73%ක් වූ සේවා නියුක්තියට අදාළ පැමිණිලි ද, 13.02%ක් වූ වගකිවයුතු රාජ්‍ය නිලධාරීන්ගේ උදාසීනත්වයට අදාළ පැමිණිලි ද ලැබී ඇත. කෙසේ වුවද, පාරිසරික කටයුතු සහ සමාජ සුබසාධනය වැනි කරුණු සම්බන්ධයෙන් ලැබී ඇත්තේ පිළිවෙළින් 1.05% සහ 3.87% ක් වැනි අඩු අනුපාතයක පැමිණිලි බවද පෙනේ.

(2015 වසර තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාලවලට ලද පැමිණිලිවල විස්තර සහ එකී පැමිණිලිවල වර්ගීකරණය දැක්වෙන වගු සඳහා මෙම වාර්තාවට යා කර ඇති **ඇමුණුම් 2ඒ සහ 2බී** බලන්න.)

## 2.2. පැමිණිලි හසුරවීමේ ක්‍රියාදාමය

පැමිණිලි කරනු ලබන කාරණයේ ස්වභාවය, පෙත්සම්කරුවන්ගේ සහ වගඋත්තරකරුවන්ගේ විස්තර, පරීක්ෂණ නිලධාරියාගේ නම සහ කාරණයේ තත්ත්වය හඳුනා ගැනීම පිණිස දත්ත පද්ධතියක් අදාළ අංශය විසින් පවත්වා ගෙන යනු ලැබේ. උපදෙස් පතා කාර්යාලය වෙත පැමිණෙන පැමිණිලිකරුවන්ට සවන්දීම පිණිස නිලධාරියකු හෝ දෙදෙනෙකු දිනපතා අනුයුක්ත කෙරේ. මෙයට අමතරව, හදිසි දුරකථන ඇමතුම් ජාලය ඔස්සේ ද පැමිණිලි ලැබේ. පැමිණිල්ල විභාග කිරීමට වඩාත් යෝග්‍ය වෙනත් ආයතනයක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ද පැමිණිලිකරුට උපදෙස් දීම ද, ලිඛිත පැමිණිලි භාරගනු ලබන අදාළ නිලධාරියා විසින් සිදු කෙරේ. දිනකට කාර්යාල වේලාවන් තුළ සාමාන්‍යයෙන් පැමිණිලි 35ක පමණ කටයුතුවල නියැලීමට සේවයේ නියුක්ත නිලධාරියාට සිදුවේ.

පැමිණිලි හසුරවීමේ ක්‍රියාදාමයේ දෙවන අදියර වන්නේ යම් පැමිණිල්ලක් මානව හිමිකම් කොමිෂන් සභා විෂය පථයට ගැනෙන්නේ ද යන්න විමසා බැලීමෙන් පසු, ඉදිරි කටයුතු කළයුතු පැමිණිලි කවරේ ද යන්න තීරණය කිරීමයි. යම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ හැකි වන අවස්ථාවකදී, විමර්ශන ක්‍රියාදාමයේ මූලික පියවර වන්නේ වගඋත්තරකරුවන්ගෙන් වාර්තා ලබා ගැනීම, ඔවුන්ගේ නිරීක්ෂණ කැඳවීම සහ වාර්තා සියුම්ව පරීක්ෂා කිරීමයි. ඉන් අනතුරුව අදාළ පාර්ශ්වයන් වෙත සිතාසි නිකුත් කිරීම සහ යැවීමට පියවර ගැනේ. මානව හිමිකම් කොමිෂන් සභා විෂයපථය යටතේ නොගැණෙන පැමිණිලි වෙනත් ආයතන වෙත යොමු කිරීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. එසේ පැමිණිලි යොමු කෙරෙන ආයතන සමහරක් වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, කම්කරු දෙපාර්තමේන්තුව සහ නීති ආධාර කොමිෂන් සභාවයි.

මිත්‍රසන්ථවය සහ සමථයට පත්වීම ඔස්සේ පිළියම් සලසා ගැනීම සඳහා අදාළ පාර්ශ්වයන්ට පහසුකම් සැලසීමට කොමිෂන් සභාව බලගන්වා ඇත. මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති අවස්ථාවලදී, අවශ්‍ය පරීක්ෂණ සහ විමර්ශනයන් කොට, අදාළ වගඋත්තරකාර අධිකාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාව විසින් සිදු කෙරේ. ප්‍රධාන කාර්යාලය විසින් යොමු කරන ලද හෝ තමන් වෙත ඍජුව ගොනු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් මූලික විමර්ශනයන්/පරීක්ෂණ කටයුතු සිදු කිරීමට ප්‍රාදේශීය කාර්යාල විසින් පියවර ගැනේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශ යලි සළකා බලන ලෙස කෙරෙන ඉල්ලීම් සැළකිල්ලට ගන්නා අතර, අවශ්‍ය යැයි අදහස් කෙරෙන අවස්ථාවලදී එවන් පැමිණිලි සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ සිදු කෙරේ. සාමාන්‍යයෙන් එවන් පරීක්ෂණ සිදු කරනු ලබන්නේ කොමිෂන් සභාවේ සභාපතිතුමිය ඉදිරියෙහි ය.
(කොමිෂන් සභාව විසින් පැමිණිලි හසුරුවනු ලබන ආකාරය සම්බන්ධයෙන් දැනුවත්වීම සඳහා මෙම වාර්තාවට යා කර ඇති **ඇමුණුම් 2සී (පැමිණිලි අංක: එච්ආර්සී/4429/09, එච්ආර්සී/1188/10 දරණ පැමිණිලි සහ ඇමුණුම්2ඩී (පැමිණිලි අංක: එච්ආර්සී/630/15/1-14)** බලන්න.)

## 2.3. පරීක්ෂණ ඔස්සේ සිදු කරනු ලබන විශේෂ මැදිහත්වීම්

මෙයට අමතරව, පනතේ 14 වන කොටස යටතේ, කොමිෂන් සභාවට හැඟීයන පරිදි, බැලූ බැල්මට මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් සිදුවී ඇති බව හෝ උල්ලංඝණයක් විය හැකි බව හෝ හෙළිදරව් කෙරෙණ කාරණයක් සම්බන්ධයෙන් ස්වයංයෝජනය පරිදි විමර්ශනයන් හෝ පරීක්ෂණ හෝ ආරම්භ කිරීම කොමිෂන් සභාවට කළ හැකිය. සාමාන්‍යයෙන්, ජනතා යහපත කෙරෙහි බරපතල බලපෑමක් සිදුවන කිසියම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මෙසේ කටයුතු කරනු ලැබේ.

(**14 වන වගන්තියෙන්** කොමිෂන් සභාව වෙත පැවරී ඇති නීත්‍යානුකූල බලය පිළිබඳ විස්තර සඳහා **ඇමුණුම 2ඊ: (පැමිණිලි අංක: එච්ආර්සී/3824/15 සහ 3827/15)** බලන්න.)

කිසියම් උසාවියක විභාග වෙමින් පවතින නඩුවකට අදාළ කාරණය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට කොමිෂන් සභාවට නොහැකිය.

## 2.4 හදිසි දුරකථන සේවය

දවස මුළුල්ලේ ක්‍රියාත්මක හදිසි දුරකථන සේවයක් සලසා ඇති අතර, එකී දුරකථන සේවය භාරව කටයුතු කරනු ලබන විමර්ශන නිලධාරියා, බලවත් වධහිංසන, හිතුවක්කාර අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම්වලට අදාළව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන්, අදාළ බලධාරීන් විමසා වහාම කටයුතු කරනු ලැබේ.

## 2.5 ස්ථානීය පරීක්ෂණ චාරිකා සහ මෙහෙයුම් යාන්ත්‍රණය

උසාවි නියෝගයකින් හෝ වෙනත් ආකාරයකට කිසියම් පුද්ගලයෙකු රඳවා ගෙන ඇති පොලිස් ස්ථාන, බන්ධනාගාර, රැඳවුම් මධ්‍යස්ථාන හෝ වෙනයම් ස්ථානයක් පරීක්ෂා කර බැලීම සඳහා යෑමට සහ රැඳවියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව සහතිකවීමේ අරමුණින්, ඔවුන්ගේ සුබසාධනය සහ රැඳවුම් කොන්දේසි පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වන අවස්ථාවලදී, එකී ස්ථාන තුළ පරීක්ෂණ පැවැත්වීමට හෝ එහිදී හමුවන ඕනෑම පුද්ගලයෙකුගෙන් කරුණු විමසීමට කොමිෂන් සභාව විසින් කටයුතු කෙරේ. වධහිංසා පැමිණවීම සහ නීතිවිරෝධී ලෙස සැළකීම් ගැන රැඳවියන් විසින් කරනු ලබන චෝදනා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් විමර්ශනය කෙරේ.

### 2.5.1 පොලිස් ස්ථාන වෙත කෙරෙණ රාත්‍රි පරීක්ෂණ චාරිකා සහ බන්ධනාගාර පරීක්ෂණ චාරිකා

නිදහස උල්ලංඝණයට ලක්වන සේ පුද්ගලයින් රඳවා ගෙන සිටින්නා වූ පොලිස් ස්ථාන, බන්ධනාගාර සහ වෙනත් රජයේ බලයලත් ස්ථාන වලට දැනුම්දීමකින් තොරව යෑමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ සහ විමර්ශන අංශය මෙන්ම ප්‍රාදේශීය කාර්යාල ද, කටයුතු කරති. දිවයින පුරා වර්ග කරන ලද මාර්ග ගණනාවක් ඔස්සේ පොලිස් ස්ථාන ස්ථාපිතව ඇත (එක් මාර්ගයක පොලිස් ස්ථාන 8-12 දක්වා ස්ථාපිතය). බන්ධනාගාර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්තවාදී විමර්ශන දිසාව වැනි රැඳවුම් ස්ථාන පරීක්ෂාවට යෑමට අමතරව, පොලිස් ස්ථාන 159ක් කොමිෂන් සභා නිලධාරීන් විසින් ආවරණය කෙරේ.

පොලිස් ස්ථාන කරා පරීක්ෂණ චාරිකාවන්හි යෙදීමේ අරමුණ වන්නේ, කාර්යක්ෂම, ප්‍රගාමී හා ප්‍රතික්‍රිය පියවර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ වධහිංසා පැමිණවීම් මුලිනුපුටා දැමීම, මෙකී උල්ලංඝණයන් සිදු කරන වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සහ ප්‍රතිකර්ම නිර්දේශ කිරීමයි. තවද, අරමුණ වන්නේ,

වධහිංසා පැමිණවීමේ සිද්ධීන් මැඩලීම සඳහා වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සමග සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් ක්‍රියා කිරීමය. තවද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ විෂයපථය යටතේ ගැනෙන ත්‍රස්තවාද විමර්ශන දිශාවෙහි සහ අපරාධ පරීක්ෂණ අංශයෙහි විශේෂ පරීක්ෂණ චාරිකාවල නියැලීමට ද කටයුතු කෙරේ.

පොලිසිය වෙත කෙරෙන පරීක්ෂණ චාරිකාවලදී හඳුනා ගන්නා ලද පොදු ගැටලු වලට පහත දක්වෙන අවස්ථා ඇතුළත්ය.

- පුද්ගලයින් සැකපිට අත්අඩංගුවට ගත් නමුදු, එකී රැඳවියන් සම්බන්ධයෙන් සැක කරනු ලබන්නේ කවර වරදක්/අපරාධයක් සම්බන්ධයෙන්දැයි පහදා දීමට අපොහොසත් වීම ඇතුළු අත්අඩංගුවට ගැනීමේදී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදය අනුගමනය නොකිරීම
- අත්අඩංගුවේ සිටියදී අනිසි ලෙස සැළකීම සහ වධහිංසනය
- උසාවියට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය
- සිරමැදිරිවල තදබදය
- රැඳවියන් සඳහා, සනීපාරක්ෂක පහසුකම් වැනි විධිමත් මූලික පහසුකම් නොතිබීම
- කොමිෂන් සභාව බන්ධනාගාරවල පරීක්ෂණ චාරිකාවල ද නියැලෙයි. මෙකී පරීක්ෂණ චාරිකාවලදී මැදිරිවල තදබදය සහ ප්‍රමාණවත් සෞඛ්‍ය නොමැතිකම නිරීක්ෂණය වී ඇත. අදාළ බලධාරීන් හා සමග සාකච්ඡා කර, මෙවන් සමහර ගැටලු කෙරෙහි එවෙලෙහිම අවධානය යොමු කර ඇත.

# තුන්වන පරිච්ඡේදය: අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10(එෆ්) කොටස යටතේ, කොමිෂන් සභාවේ ප්‍රධානතම කාර්යභාරයක් වන්නේ මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් වීම් ප්‍රවර්ධනය සහ ශික්ෂණය සැලසීමයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ, අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශය විසින් දිවයින පුරා වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු කිරීම් පවත්වමින්, මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් බව ප්‍රවර්ධනය කරනු ලබයි. ජනතාව වෙත බෙදා හැරීම පිණිස මානව හිමිකම් ආශ්‍රිත ලේඛන සම්පාදනය ද මෙම අංශය විසින් සිදු කෙරේ.

2015 වසරේදී මෙම අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි සංක්ෂිප්තව සාකච්ඡාවට භාජනය කෙරේ.

## 3.1 වැඩසටහන් සම්පාදනය

වර්ෂය තුළදී, මෙම අංශය විසින් පහත දැක්වෙන වැඩසටහන් සම්පාදනය කර, ක්‍රියාවට නංවන ලදී.

(i) අයිතිවාසිකම් පදනම කොටගත් රාජ්‍ය සේවයක් සහතිකවීමෙහි ලා නිලතල දරන්නන්ගේ වගකීම

(ii) ආරක්ෂක හමුදා සඳහා සුළුජන අයිතිවාසිකම් සුරැකීම

(iii) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය නිලධාරීන් හා සිවිල් සමාජය අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ වැඩමුළු

## 3.2 මානව අයිතිවාසිකම් පිළිබඳ ලිපිලේඛන සම්පාදනය

අංශය විසින් පහත දැක්වෙන පොත්පිංච සිංහල සහ දමිළ භාෂාවලින් සම්පාදනය කර මුද්‍රණය කරන ලදී.

| | ලේඛන නාමය | මුද්‍රණය කළ පිටපත් | |
|---|---|---|---|
| | | සිංහල | දමිළ |
| 1 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හඳුනා ගනිමු | 5000 | 5000 |
| 2 | මානව හිමිකම් යාන්ත්‍රණ | 5000 | 5000 |
| 3 | මූලික අයිතිවාසිකම් | 20000 | 10000 |
| 4 | මානව හිමිකම් මූලාශ්‍ර සහ එහි වර්ධනය | 8000 | 5000 |

## 3.3 යුද හමුදා සහ රාජ්‍ය නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම

### 3.3.1 සම්පත් දායකයින්ගේ සේවය සමග

| දිනය | මාතෘකාව/විෂයය | ඉලක්කගත කණ්ඩායම | සංවිධානය කරන ලද්දේ |
|---|---|---|---|
| 29 - 30.01.2015 | මානව හිමිකම් සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ භූමිකාව | සුරාබදු නිලධාරීන් | ශ්‍රී ලංකාවේ සුරාබදු දෙපාර්තමේන්තුව |
| 12.03.2015 | කාර්ය ස්ථානවල ලිංගික අතවර විරෝධී ප්‍රතිපත්තිය | කාර්ය මණ්ඩලය | ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, අංගොඩ |
| 27.04.2015 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ භූමිකාව | පොලිස් නිලධාරීන් | ජාතික පොලිස් විද්‍යාපීඨය, කටාන |
| 28.04.2015 | ජාත්‍යන්තර සාධනපත්‍ර | පොලිස් නිලධාරීන් | ජාතික පොලිස් විද්‍යාපීඨය, කටාන |
| 28.04.2015 | කණ්ඩායම් හිමිකම් | පොලිස් නිලධාරීන් | ජාතික පොලිස් විද්‍යාපීඨය, කටාන |
| 30.04.2015 | රැඳවියන්ගේ අයිතිවාසිකම් | පොලිස් නිලධාරීන් | ජාතික පොලිස් විද්‍යාපීඨය, කටාන |
| 30.04.2015 | පොදු යහපතට අදාල නඩුහබ | පොලිස් නිලධාරීන් | ජාතික පොලිස් විද්‍යාපීඨය, කටාන |
| 30.04.2015 | කාන්තා ශ්‍රමික ජාවාරම් | පොලිස් නිලධාරීන් | ප්‍රජා සංවර්ධන සේවා, කොළඹ 10 |
| 13.07.2015 | මානව අයිතිවාසිකම් සහ රාජ්‍ය නිලධාරීන් | ශ්‍රී.ලං.අ.ප.සේවයේ නිලධාරීන් | ජාතික අධ්‍යාපන ආයතනය |
| 10.07.2015 | වධහිංසා වින්දිත ආධාර ජාත්‍යන්තර දිනය | පොලිස් නිලධාරීන් | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය/ අ.වි.වැ.අංශය |
| 20.07.2015 | රාජ්‍ය සේවයේ කාන්තාවන් මුහුණ දෙන ගැටළු | කාර්ය මණ්ඩලය | කාන්තා කටයුතු, ජාතික භාෂා සහ සමාජ ඒකාග්‍රතා අමාත්‍යාංශය, රාජගිරිය |
| 25-26.08.2015 | මානව අයිතිවාසිකම් | රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සාමාජිකයින් | අම්පාර ප්‍රාදේශීය කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය |
| 15.09.2015 | රෝගීන්ගේ අයිතිවාසිකම් හා හෙද සේවය | හෙද හෙදියන් | කොළඹ දකුණ ශික්ෂණ රෝහල, කළුබෝවිල |
| 10.09.2015 | වධහිංසා වින්දිත ආධාර ජාත්‍යන්තර දිනය | පොලිස් නිලධාරීන් | මාතර ප්‍රාදේශීය කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය |
| 03.10.2015 | ළමා අපචාර සහ ළමා අයිතිවාසිකම් (ලෝක ළමා දිනය) | ශිෂ්‍යයින්, දෙමාපියවරු | සිංහ සමාජය, හොරණ |
| 12.10.2015 | රෝගීන්ගේ අයිතිවාසිකම් හා හෙද සේවය | හෙද හෙදියන් | කොළඹ දකුණ ශික්ෂණ රෝහල, කළුබෝවිල |

| | | | |
|---|---|---|---|
| 04.11.2015 | රෝගීන්ගේ අයිතිවාසිකම් හා හෙද සේවය | හෙද හෙදියන් | කොළඹ දකුණ ශික්ෂණ රෝහල, කළුබෝවිල |
| 14.11.2015 | පවුල, ළමා අයිතිවාසිකම් හා ආශ්‍රිත නීති | තාරුණ්‍යය | දිවිනැගුම ප්‍රජාමූල බැංකුව, ජා ඇල |
| 18.12.2015 | සමාජභාවී ප්‍රචණ්ඩත්වය | කාර්ය මණ්ඩලය | ජාතික සහජීවන,සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය |

### 3.3.2 යුද හමුදා නිලධාරීන් සඳහා මානව අයිතිවාසිකම් දැනුවත්වීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා යුද හමුදාවේ මානව හිමිකම් සහ මානුෂික නීති අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම් මත, යුද හමුදා නිලධාරීන් සඳහා මොඩියුල සම්පාදනය සහ මානව අයිතිවාසිකම් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට මෙම අංශය විසින් පියවර ගන්නා ලදී. යාපනය, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල සිංහල කථනයෙහි ව්‍යක්ත සම්පත් දායකයින් නොමැති හෙයින්, එකී ප්‍රදේශවලට සිංහල කථනයෙහි ව්‍යක්ත සම්පත් දායකයින් සැපයීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

දේශන සහාය සපයන ලද වැඩසටහන් මෙසේය.

| දිනය | මාතෘකාව/විෂයය | සංවිධානය කරන ලද්දේ |
|---|---|---|
| 21.07.2015 | සමාජභාවී ප්‍රචණ්ඩත්වය සහ මානව අයතිවාසිකම් | ශ්‍රී ලංකා සාම සහායක මෙහෙයුම් අභ්‍යාස ආයතනය, කුකුළේගඟ |
| 12.05.2015 | මානව හිමිකම්, කාන්තා අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් | 513 වන හමුදා බණ්ඩය, යුදහමුදා කඳවුර, මාවම්කල්ලාඩි, කන්කසන්තුරේ, යාපනය |
| 13.05.2015 | මානව හිමිකම්, කාන්තා අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් | 512 වන හමුදා බණ්ඩය, යුද හමුදා කඳවුර, ආරෝග්‍යශාලා පාර, යාපනය |
| 27.05.2015 | මානව හිමිකම්, කාන්තා අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් | 12 වන ගජබා රෙජිමේන්තුව, යුදහමුදා කඳවුර, සිංහල මහා විද්‍යාලය, මන්මුණෛයි උතුර, මඩකලපුව |
| 09.06.2015 | මානව හිමිකම්, කාන්තා අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් | ගජබා රෙජිමේන්තුව, ෆ්‍රෙඩ්රික් කොටුව, යුද හමුදා කඳවුර, ත්‍රිකුණාමලය |
| 10.06.2015 | මානව හිමිකම්, කාන්තා අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් | 222 වන හමුදා බණ්ඩය, යුද හමුදා කඳවුර, ජයන්තිගම, කන්තලේ |

### 3.3.3 අයිතිවාසිකම් මත පදනම් වූ රාජ්‍ය සේවය සහතික වීම පිණිස නිලතල දරන්නන්ගේ වගකීමට අදාළ වැඩමුළු

මහජනතාව වෙතින් කොමිෂන් සභාව වෙත ගොනු කරනු ලබන පැමිණිලි, විවිධ රාජ්‍ය අයතන වලින් සේවය ලබා ගැනීමේදී ඔවුන් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවයන්ට අදාළ බව මෙම අංශයේ

නිරීක්ෂණයට ලක්විය. එමනිසා, අංශය විසින්, මානව හිමිකම් පදනම් කොටගත් රාජ්‍ය සේවයක් සහතිකවීම සඳහා නිලතල දරන්නන්ගේ වගකීම පිළිබඳ වැඩසටහනක් සම්පාදනය කර, පහත දැක්වෙන පරිදි වැඩසටහන් පවත්වන ලදී.

| අංක | දිනය | සංවිධානය කරන ලද්දේ |
|---|---|---|
| 1. | 12.05.2015 | යාපනය ප්‍රාදේශීය කාර්යාලය, (දමිළ මාධ්‍යය) |
| 2. | 26.05.2015 | මඩකලපුව යාපනය ප්‍රාදේශීය කාර්යාලය, (දමිළ මාධ්‍යය) |
| 3. | 09.06.2015 | ත්‍රි'මලය ප්‍රාදේශීය කාර්යාලය, ( දමිළ මාධ්‍යය) |
| 4. | 09.07.2015 | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය |
| 5. | 24.07.2015 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය |
| 6. | 27.07.2015 | ජාතික තරුණ සේවා සභාව, පානදුර |
| 7. | 16.09.2015 | මහනුවර ප්‍රාදේශීය කාර්යාලය |

### 3.3.4 සුළු ජනවාර්ගික කොටස්වල අයිතිවාසිකම් පිළිබඳ පුහුණු වැඩසටහන්

සුළු ජනවාර්ගික කොටස්වල අයිතිවාසිකම් පිළිබඳව ආරක්ෂක හමුදා සහ පොලිසිය දැනුවත් කිරීමට අංශය විසින් පියවර ගන්නා ලදී. සුළු ජනවාර්ගික කොටස්වල අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්, ශ්‍රී ලංකාවේ සුළුජන වාර්ගික ප්‍රජාවගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුළුජන වාර්ගික කොටස්වල අයිතිවාසිකම් වලට අදාළව ආරක්ෂක හමුදාවන්හි භූමිකාව සහ වගකීම යන විෂයයන්ගෙන් මෙම වැඩසටහන් සමන්විත විය.

| දිනය | ඉලක්කගත කණ්ඩායම | සංවිධානය කරන ලද්දේ |
|---|---|---|
| 10.03.2015 | ත්‍රිවිධ හමුදා නිලධාරීන් | ශ්‍රී ලංකා සාම සහායක මෙහෙයුම් අභ්‍යාස ආයතනය, කුකුලේගඟ |
| 26.05.2015 | මඩකලපුව දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් | අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය |
| 09.06.2015 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් | අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය |
| 02.10.2015 | ත්‍රිවිධ හමුදා නිලධාරීන් | ශ්‍රී ලංකා සාම සහායක මෙහෙයුම් අභ්‍යාස ආයතනය, කුකුලේගඟ |

## 3.4 කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය

2015 වසරේදී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විදේශීය පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ කිහිපයකට මෙන්ම දේශීය පුහුණු වැඩසටහන් කිහිපයකට ද සහභාගී වන ලදී (2015 වසරේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා නිලධාරීන් සහභාගී වූ විදේශීය සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළුවල විස්තරාත්මක වගුවක් දක්වෙන **ඇමුණුම් 3ඒ** බලන්න).

### 3.4.1 සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට අදාළ විශේෂ දේශනය

සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට අදාළ විශේෂ දේශනයක් 2015 ජූලි මස 22 වන දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද අතර, සම්පත් දායකයා වූයේ එච්අයිවී/එඩ්ස් රෝගය පිළිබඳ ඒකාබද්ධ එක්සත් ජාතීන්ගේ වැඩසටහනෙහි, දේශීය කළමණාකාර, වෛද්‍ය දයානාත් රණතුංග මහතාය.

### 3.4.2 පුහුණු වැඩසටහන් (2015 ඔක්තෝබර් මස 03 දින සිට 05 වන දින දක්වා සහ 10 වන දින සිට 12 වන දින දක්වා)

**කණ්ඩායම් වැයම** - ඇකඩමි ඔෆ් ඇඩ්වෙන්චර් ආයතනය විසින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධන අනුභාවාත්මක පුහුණු වැඩසටහනක් බෙලිහුල්ඔයදී පවත්වන ලදී. මෙම වැඩසටහන, පොදුවේ, සහභාගීවන්නන් අතර නායකත්වය, කණ්ඩායම් හැඟීම, සන්නිවේදනය සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්, ආත්ම විශ්වාසය මත මෙන්ම විශේෂයෙන් ඔවුන්ගේ වෘත්තිමය ගති ලක්ෂණයන් වර්ධනය කිරීම මත මූලික වශයෙන් නාභිගත වූවකි. වැඩසටහන කණ්ඩායම් දෙකක් සඳහා 2015 ඔක්තෝබර් මස 03 වන දින සිට 05 වන දින දක්වා සහ 10 වන දින සිට 12 වන දින දක්වා පැවැත්විණ.

### 3.5 නීති සතිය වෙනුවෙන් ශ්‍රී ලං.මා.හි.කො.ස. ප්‍රදර්ශන කුටිය

ජාතික නීති සතිය 2015 නොවැම්බර් මස 23 වන දින සිට 29 වන දින දක්වා පැවැත්විණ. මෙම සතිය සැමරීම සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් අධිකරණ අමාත්‍යාංශය හා නීති ආධාර කොමිෂන් සභාව සමග ඒකාබද්ධව නොවැම්බර් මස 28-29 දක්වා ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද මෙම ප්‍රයත්නයෙහි ලා දායක වූ අතර, ප්‍රදර්ශන භූමියෙහි කොමිෂන් සභාවේ ප්‍රදර්ශන කුටියක් ද විය.

### 3.6 ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් දිනය - 2015

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, 'ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංස්කෘතියක් නිර්මාණය කිරීමට එක්වෙමු.....' යන තේමාව යටතේ, 2015 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය ජාතික මට්ටමින් සැමරීම සඳහා ජනමාධ්‍ය හා සමාජ මාධ්‍යජාල ඔස්සේ කටයුතු කරන ලදී. කොමිෂන් සභාව භාෂාත්‍රයෙන්ම මානව හිමිකම් දින රූපවාහිනී වැඩසටහන් වලට ද සහභාගී විය.

**වැඩසටහන් පහත දැක්වෙන පරිදි විය:**

| | | |
|---|---|---|
| නිව්ස් ලයින් | 2015 දෙසැම්බර් 10 | සීමා. එම්ටීවී නාලිකා (පෞ) සමාගම |
| පැතිකඩ | 2015 දෙසැම්බර් 10 | සිරස ටීවී |
| නුගසෙවන | 2015 දෙසැම්බර් 10 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව |
| නිස්කලංක හතහමාර | 2015 දෙසැම්බර් 10 | ස්වාධීන රූපවාහිනී සේවය |
| එතිරෝලි | 2015 දෙසැම්බර් 11 | ශක්ති ටීවී |

කොමිෂන් සභාව විසින් **"සමාජ මාධ්‍යජාල ඔස්සේ මානව අයිතිවාසිකම් සංස්කෘතියක් නිර්මාණය කිරීමට එක්ව වැඩකරමු"** යන තේමාව යටතේ මානව හිමිකම් ව්‍යාපාරයක් ද දියත් කරන ලදී. මෙම ව්‍යාපාරය 2015 දෙසැම්බර් මස 14 වන දින, සභාපතිතුමිය සහ කොමසාරිස්වරුන් හමුවේ දියත් කෙරිණ. කොමිෂන් සභාව විසින් මානව හිමිකම් පිළිබඳව වන්-මිනිට්-ස්නිපට්ස් දර්ශනයක් ද නිර්මාණය කරන ලද අතර, එය මාසයක කාල පරාසයක් තුළ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඔස්සේ විකාශනය විය. මෙම පණිවුඩ දීපව්‍යාප්ත වාණිජ සේවා ගුවන්විදුලි නාලිකා සහ ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකා ඔස්සේ ද විකාශනය කෙරිණ.

## 3.7. වෙනත් වැඩසටහන්

### 3.7.1. සිවිල් සමාජය හා සමග සම්බන්ධීකරණය

#### 3.7.1.1. සිවිල් සමාජ රැස්වීම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2015 පෙබරවාරි මස 18 වන දින කොමිෂන් සභා පරිශ්‍රයේදී සිවිල් සමාජ උපදේශන රැස්වීමක් පවත්වන ලදී. මෙම රැස්වීමේදී තත්ත්ව ප්‍රකාශන පත්‍රයක් ස්ථාපිත කිරීමට, රැඳවුම් ස්ථාන වෙත හවුල් පරීක්ෂණ චාරිකාවල යෙදීමට, වෙනත් රටවල් ස්වකීය ජාතික ගීයට සියලුම ප්‍රජාවන්ගේ භාෂා එක් කරනු ලබන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් සමාලෝචනයක් කිරීමට, මැතිවරණ සම්බන්ධයෙන් ඒකාබද්ධ උපදේශනයක යෙදීමට සහ උගත් පාඩම් සහ සංහිඳියා කොමිෂන් සභා වාර්තාව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට, සිවිල් සමාජය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සාමූහිකව එකඟත්වයට පත්වන ලදී.

#### 3.7.1.2. සිවිල් සමාජ ක්‍රියාකාරී කමිටු රැස්වීම්

සිවිල් සමාජ කමි□ රැස්වීමක් 2015.01.20 වන දින පැවැත්විණ. ම□තඅ□තයේදී මාධ්‍යකරුවනට සහ සිවිල් සමාජයට සළකන ලද □කාරය සහ රැස්වීමේ අයිතිය, සමාගමයේ අයිතිය සහ භාෂණ අයිතිය සම්බන්ධයෙන් තම මතය ඔවුන් විසින් පෙන්වා දෙන ලදී. සිවිල් සමාජය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් □රක්ෂක අමාත්‍යාංශය විසින් නි□ත් කර □ති ච□ලේ□ය ද සාක□□ාවන්ට භාජනය විය.

### 3.7.1.3. සිවිල් සමාජය හා අලුතින් පත්වූ කොමිෂන් සභාව සමග රැස්වීම

සිවිල් සමාජය හා අලුතින් පත්වූ කොමිෂන් සභාව සමග රැස්වීමක් 2015 නොවැම්බර් මස 16 වන දින පවත්වන ලදී. මෙහිදී කොමිෂන් සභාව විසින් සිවිල් සමාජ නියෝජිතයින්ගේ ගැටලු සහ සිවිල් සමාජය සමග කොමිෂන් සභාවේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් අදහස් විමසා සිටින ලදී.

### 3.7.2. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට සහනය

2015 මැයි මස 22 වන දින, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා හාර්ට් ටු හාර්ට් සහ ඊක්‍යුඅල් ග්‍රවුන්ඩ් වැනි සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්තික සමාජභාවී ආදී(LGBTIQ) අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ සිවිල් සමාජ අතර රැස්වීමක් පැවැත්විණ. උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත හා ගුවන්ගමන් බලපත්‍රය වැනි නෛතිකමය ලේඛන වල සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන්ගේ ස්ත්‍රී පුරුෂභාවය සංශෝධනය කිරීමට අදාළ ගැටලු, විශේෂයෙන්ම නීතිමය හා පරිපාටිමය ගැටලු සම්බන්ධයෙන් ස්වකීය උද්දේශයන් සාකච්ඡාව අතරතුර කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටියහ.

රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව වැනි අදාළ රාජ්‍ය බලධාරීන් සමග තවත් රැස්වීමක් 2015 ජූනි මස 16 වන දින පැවැත්විණ. ඉන් අනතුරුව, පෞද්ගලික ලිපි ලේඛන වල සමාජභාවී විපර්යාසයන් ඇතුළත් කිරීමට හැකි වන සේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකසා ඇති සමාජභාවී සහතිකය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සමග අඛණ්ඩව සාකච්ඡා පවත්වා ඇත. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට, ස්වකීය පෞද්ගලික ලේඛන වල ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කිරීමට හැකිවන පරිදි චක්‍රලේඛයක් නිකුත් කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2015 දී සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නිර්දේශ කර ඇත.

### 3.7.3. මානව හිමිකම් සුරකින්නන්ගේ ආරක්ෂාව සඳහා මාර්ගෝපදේශනය

මානව අයිතිවාසිකම් සුරකින්නන් ආරක්ෂා කිරීම පිණිස රාජ්‍ය අධිකාරීන් සඳහා මර්ගෝපදේශන සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්විය. ඒ අනුව මාර්ගෝපදේශන සකස් කර අදහස් විමසීම සඳහා සිවිල් සමාජ ක්‍රියාකාරී කමිටුවට යොමු කරන ලද අතර, ප්‍රාදේශීය මට්ටමින් ද සාකච්ඡා පවත්වන ලෙස සිවිල් සමාජ ක්‍රියාකාරී කමිටුව කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී. මෙම අංශය විසින් ප්‍රාදේශීය උපදේශන රැස්වීම් 6 ක් පවත්වන ලදී.

(යාපනය- 2015 මැයි 13, වවුනියාව- 2015 ජූලි 09, අනුරාධපුර- 2015 ජූලි 10, ත්‍රිකුණාමලය- 2015 ජූනි 10, මහනුවර- 2015 සැප්තැම්බර් 16, මඩකලපුව-2015 මැයි 27)

# සිව්වන පරිච්ඡේදය : පර්යේෂණ හා අධීක්ෂණ අංශය (පෙර: අධීක්ෂණ හා සමාලෝචන අංශය)

පර්යේෂණ හා අධීක්ෂණ අංශය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ වැදගත් කාර්ය භාරයක් ඉටු කරමින් සිටී. අංශය වෙත පැවරී ඇති ඉතා පුළුල් කාර්යභාරයෙන් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රමිතීන් යටතේ හඳුනා ගෙන ඇති සියලුම කරුණු කාරණා ආවරණය වෙයි.

2015 වසරේදී, පර්යේෂණ හා අධීක්ෂණ අංශය පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදී ඇත.

## 4.1 පර්යේෂණ හා අධීක්ෂණ අංශය ස්ථාපනය කිරීම

**අධීක්ෂණ හා සමාලෝචන අංශය,** අලුතින් පත්කරන ලද කොමිෂන් සභාව විසින් **පර්යේෂණ හා අධීක්ෂණ අංශය**[1] ලෙස යළි නම් කරන ලදී. මෙම අංශය ස්ථාපිත කර ඇත්තේ අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සිදුකිරීමෙහි ලා කොමිෂන් සභාවට සහායවීම සඳහා මානව හිමිකම් ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණයන්හි නියැලීම පිණිසය.

## 4.2 ජනාධිපති මැතිවරණය-2015 සම්බන්ධයෙන් ශ්‍රී ලං.මා.හි.කො.ස. වාර්තාව

2015 ජනවාරි මස 08 වන දින පවත්වන ලද ජනාධිපතිවරණයේදී, නිදහස්, සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණයක් පැවැත්වෙන බව සහතිකවීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අතිශයින් සක්‍රීය කාර්යභාරයක් ඉටුකරන ලදී. නිදහස් හා සාධාරණ මැතිවරණයකින් තම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා රටේ ජනතාවට සහාය වීම පිණිස රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ සාමාජිකයින් හා මැතිවරණ නිරීක්ෂකයින් සමග කටයුතු කිරීමට කොමිෂන් සභාව පියවර ගන්නා ලදී. කොමිෂන් සභා කාර්යභාරයේ කොටසක් ලෙස, මැතිවරණ කොමසාරිස් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් හා සමග රැස්වීම් පැවැත්වීම, පරීක්ෂණ පැවත්වීම, මාධ්‍ය කටයුතු මෙහෙයවීම, වාර්තා කැඳවීම ආදී කටයුතුවල නියැලුණ අතර, මැතිවරණය ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් වලට අදාළ නියමයන්, මාර්ගෝපදේශන සහ නිර්දේශයන් නිකුත් කිරීමට ද පියවර ගන්නා ලදී. 2015 ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම සම්බන්ධයෙන් වාර්තාවක් සම්පාදනය කරන ලදී.

මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත කරන ලද නිර්දේශයන් මෙසේය.

1. කෘතිම හෝ ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ජනතාවට ස්වකීය නිවෙස් වලින් බැහැර ආරක්ෂිත ස්ථානවල රැඳී සිටීමට සිදුවන අන්දමේ කිසියම් තත්ත්වයක් උද්ගත වුවහොත්, පවත්නා තත්ත්වය සම්බන්ධයෙන් ස්වකීය දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් විමසා බලා, එවන්

---

[1] 2015.11.23 වන දින සිට, අධීක්ෂණ හා සමාලෝචන අංශය , පර්යේෂණ හා අධීක්ෂණ අංශය ලෙස යලි නම් කෙරිණ.

තත්ත්වයක් යටතේ ඡන්දය පළ කිරීම පිණිස ජනතාවට අවස්ථාව සලසා දීම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් කළ යුතු වෙයි.

2. වාර්තා වී ඇති පරිදි, ස්වකීය ලිපිනයන් සහ නිවාස අංක යටතේ කුලී වැසියන් ඡන්ද ලැයිස්තු වල ලියාපදිංචි වීම නිවාස හිමියන් විසින් ප්‍රතික්ෂේප කිරීමේ හේතුව නිසා, ඡන්ද ලැයිස්තුවල ලියාපදිංචි වීමට කුලී වැසියන් සතු අයිතිවාසිකම සහතික කරනු පිණිස යෝග්‍ය පියවර ගත යුතු අතර, ඉදිරියේදී පැවැත්වෙන මැතිවරණ වලදී ස්වකීය ඡන්දය භාවිතා කිරීම සඳහා එකී කුලී වැසියන්ට අවස්ථාව සලසා දිය යුතුය.

3. මැතිවරණ කොමසාරිස්වරයා හා සමග පවතින සම්බන්ධය වැඩියෙන් නියාමනය කරලීමට හැකි වන පරිදි, මැතිවරණ සමය තුළදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉටු කරන ලබන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම පිණිස මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු පත් කිරීම.

### 4.2.1. භාෂණයේ නිදහස

2015 ජනාධිපතිවරණ සමයේදී, පළාත් පාලන බලාධිකාරියේ විෂයය පථය යටතේ ගැණෙන විශේෂිත වූ ස්ථානවල රැස්වීම් පැවැත්වීම සඳහා අවසර ඉල්ලා සිටි විට කිසියම් දේශපාලන පක්ෂ වලට අනුග්‍රහාත්මකව සළකන ලද අතර, වෙනත් පාර්ශ්වයන් එම ස්ථාන ඉල්ලා සිටි විට, එකී ස්ථාන මැතිවරණ ක්‍රියාදාමයට අදාළ නොවන වෙනත් ක්‍රියාකාරකම් සඳහා වෙන්කර ඇත යන පදනමින් එකී ස්ථාන භාවිතා කිරීමේ ඔවුන්ගේ අයිතිය වළක්වාලන ලද බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තා විය. මැතිවරණ කොමසාරිස්වරයා විසින් මෙම පුරුද්ද කොමිෂන් සභාව වෙත වාර්තා කර සිටින ලදී. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී, එස්. රන්වල මහතා විසින් ගොනු කරන ලද අංක: එච්ආර්සී/5030/2014 දරණ පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභා සභාපතිතුමන් ඉදිරියේ විභාග කරන අවස්ථාවේදී, මැතිවරණ සමයේදී පොදු ස්ථාන වෙන්කර දීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සියලුම පළාත් කොමසාරිස්වරුන් සමග ජාතික මට්ටමේ රැස්වීමක් පැවැත්වීමේ වැදගත්කම මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙන්වා දෙන ලදී.

මෙම කාරණය අදාළ බලධාරීන් හා සමග සාකච්ඡාවට ගත යුතු ගැටලුවක් ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද අතර, 2015 මාර්තු මස 17 වන දින කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වන ලද සම්මන්ත්‍රණයට පහත දැක්වෙන රාජ්‍ය ආයතනවල නියෝජිතයින් සහ වෙනත් පාර්ශ්වකරුවන් සහභාගී වූහ.

1. මැතිවරණ කොමසාරිස් සහ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්
2. සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ නියෝජිතයෙකු
3. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්

4. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පාලන හා මැතිවරණ)
5. බස්නාහිර, වයඹ, මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, උතුරු මැද සහ ඌව පළාත් සභාවල පළාත් පාලන කොමසාරිස්වරුන්
6. වයඹ, නැගෙනහිර සහ සබරගමුව පළාත් සභාවල මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයේ සභාපතිවරු
7. දේශපාලන පක්ෂවල නියෝජිතයින්
8. මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්

මැතිවරණ කොමසාරිස් සහ සහභාගී වූවන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මෙසේය:

සියලුම පළාත් සභාවල පළාත් පාලන අමාත්‍යාංශ, පළාත් පාලන ආයතන (විශේෂයෙන් කොළඹ මහ නගර සභාව) සහ අනෙකුත් අදාළ ආයතනවල සහාය ඇතිව, දිස්ත්‍රික් මට්ටමින්, රැස්වීම් පැවැත්වීම සඳහා සුදුසු ස්ථානවල විස්තර එක්රැස් කිරීමට, එක් එක් දිස්ත්‍රික්කයේ මහජන රැස්වීම් පැවැත්වීමට යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීමෙන් පසු එකී දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරු තම දිස්ත්‍රික්කයේ දේශපාලන පක්ෂ නියෝජිතයින් හා සමග රැස්වීමක් පැවැත්විය යුතු අතර, එක් එක් පක්ෂයේ අවශ්‍යතාවයන් සහ රැස්වීම් දින දර්ශනය සැළකිල්ලට ගනිමින්, එක් එක් පක්ෂය දැනුවත් කළ යුතුය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම යෝජනාව අනුමත කළ අතර, එයට තම නොමසුරු සහාය ලබා දෙන ලෙස සියලුම පාර්ශ්වයන්ට දන්වා සිටින ලදී.

## 4.3 මහ මැතිවරණය - 2015

ශ්‍රී ලාංකිකයෝ නව පාර්ලිමේන්තුවක් තෝරා පත් කර ගැනීම සඳහා 2015 අගෝස්තු මස 15 වන දින ස්වකීය ඡන්දය භාවිතා කළහ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහ මැතිවරණ දෙපාර්තමේන්තුවට එකිනෙකට වෙනස් කාර්යභාරයන් පැවරී ඇත්තේ වී නමුදු, සාධාරණත්වය සහ සමානාත්මතාවය උදෙසා ක්‍රියා කිරීමේ අරමුණ දෙපාර්ශවයම සතු වේ. මෙය සාක්ෂාත් කර ගැනීම වස්, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික වීම පිණිස මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැතිවරණ දෙපාර්තමේන්තුව සමග සහ/හෝ සිවිල් සමාජ සංවිධානයන් සමග එක්ව වෙනස් අන්දමේ ක්‍රියාකාරකම් වලට මුල පුරන ලදී.

### I - දේශපාලන පක්ෂවල සහභාගිත්වයෙන් පැවැත්වෙන මැතිවරණ රැස්වීම් සඳහා පොදු ස්ථාන වෙන් කර දීම

මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, මැතිවරණ කොමසාරිස්, පළාත් පාලන ආයතන සහ අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් යුත් රැස්වීම් පවත්වන ලදී. නෛතිකමය රාමුව තුළ, පළමුව ආ තැනැත්තාට පළමු අවස්ථාව ලබාදීම සහතික වෙමින්, අනිසි

පක්ෂපාතිත්වයෙන් තොරව සාධාරණව සැළකීම තහවුරු කරලීම සඳහා, එකී ගැටලුව සම්බන්ධයෙන් මාර්ගෝපදේශන සකස් කරන ලදී. මෙම උපදෙස් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කෙරිණ.

### II - පෞද්ගලික අංශ සේවකයින්ට නිවාඩු

පෞද්ගලික අංශ සේවකයින්ට ඡන්දය භාවිතා කිරීම සඳහා නිවාඩු දීමේ ක්‍රියා පරිපාටිය හිඩැස් සහිත විය. මෙම ගැටලු සාකච්ඡා කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ මැතිවරණ කොමසාරිස්වරයා කැඳවනු ලැබූහ. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමසාරිස්වරයා හා සමග එක්ව, නිවාඩු ලබාදීම පිණිස යෝග්‍ය යෝජනා ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනා පිළිගන්නා ලදුව, කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ කම්කරු කොමසාරිස්වරයාට නිර්දේශයක් නිකුත් කරන ලදී. අවසානයේදී, ඡන්දය භාවිතා කිරීම සඳහා පෞද්ගලික අංශ සේවකයින්ගේ නිවාඩු හිමිකම සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යවරයා විසින් සියලුම පෞද්ගලික අංශ සේවකයින් වෙත ප්‍රසිද්ධ දැන්වීමක් නිකුත් කරන ලදී.

### III - පුද්ගල ඡායාරූප සහ පතාක ආදිය ඉවත් කිරීම

මැතිවරණ කොමසාරිස්ගේ සහ දේශපාලනඥයින්ට අනුග්‍රහය දැක්වෙන ධජ පතාකාදිය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇති බවට මැතිවරණ නිරීක්ෂකයින්ගේ චෝදනාවන්ට ලක්වූ ප්‍රධානතම රාජ්‍ය ආයතනවල සහභාගිත්වයෙන් රැස්වීමක් පැවැත්විණ. රජය සතු පරිශ්‍රයන්හි එසේ ප්‍රදර්ශනය කර ඇති සියලුම ධජ පතාකාදිය ඉවත්කිරීමට රාජ්‍ය නිලධාරීහු එකඟ වූහ.

### IV - මැතිවරණ සමය තුළ මාධ්‍ය භාවිතය

ජනමත විචාරණයක් හෝ මැතිවරණයක් හෝ පැවැත්වෙන කාලය තුළ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය අංශ විසින් අනුගත විය යුතු උපදෙස් සහ පිළිපැදිය යුතු ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා, මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සහාය මැතිවරණ කොමිෂන් සභාවට ලබා දෙන ලදී.

### V - දේශපාලනයෙහි කාන්තා සහභාගිත්වය

දේශපාලනයෙහි කාන්තා සහභාගිත්වය සම්බන්ධයෙන් "කාන්තාවන්ට එරෙහි සෑම අන්දමකම වෙනස්ව සැළකීම් ඉවත්කිරීමේ එක්සත් ජනපද සම්මුති" (CEDAW) නිර්දේශයන්ට අදාළ පසුවිපරම සම්බන්ධයෙන් සහ කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වයේ මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම සඳහා 2015.06.23 වන දින, මැතිවරණ කොමසාරිස්, ජනාධිපති ලේකම් කාර්යාලයේ, අග්‍රාමාත්‍ය කාර්යාලයේ, කාන්තා කටයුතු

අමාත්‍යාංශයේ සහ අධිකරණ අමාත්‍යාංශයේ නියෝජිතයින් සහ සිවිල් සමාජ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් රැස්වීමක් පැවැත්විණ. නාම යෝජනා ලැයිස්තු සම්පාදනයේදී කාන්තාවන් ඇතුළත් කිරීම දැඩිව සළකා බලන ලෙස ඉල්ලා සිටිමින් සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත ලිපි (2015 ජූලි මස 07 දාතමින්) නිකුත් කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

### VI - ආන්තරිකව ස්ථානගත කණ්ඩායමක ඡන්දය භාවිතා කිරීමේ අයිතිවාසිකම

කල්පිටිය අර්ධද්වීපයෙහි දූපත්වල ජීවත්වන ධීවර ජනතාවගේ ඡන්දය භාවිතා කිරීමේ අයිතිවාසිකම සහතිකවීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිය වුවමනාවෙන්ම මැදිහත් වන ලදී. ඔවුන්ට ඡන්ද මධ්‍යස්ථාන කරා ප්‍රවාහන පහසුකම් සැපයීමට අවශ්‍ය පියවර ගන්නා ලද බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් කොමිෂන් සභාව වෙත දන්වා සිටින ලදී.

### VII - පවිත්‍ර දේශපාලනය උදෙසා මාර්තු 12 ව්‍යාපාරය

මානව හිමිකම් කොමිෂන් සභාවේ පොදු දැනුවත් කිරීමේ වැඩසටහන්වල, සිවිල් සමාජය විසින් සම්පාදනය කරන ලද මාර්තු 12 ප්‍රකාශනයෙහි දක්වා ඇති දේශපාලන නියෝජිතයින් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට කොමිෂන් සභාවෙහි අනුබලය පළ විය.

### VIII - පැමිණිලි හසුරුවීම

පාර්ලිමේන්තු මැතිවරණ ආශ්‍රිත පැමිණිලි වලට අදාළ කටයුතු කඩිනම් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් විශේෂ ඒකකයක් ස්ථාපිත කෙරිණ. පැමිණිලි 10ක් ගොනු කරන ලද අතර, ඉන් දෙකක් ඉදිරිපත්ව ඇත්තේ මැතිවරණ කොමසාරිස්වරයාට විරුද්ධවය. එකී පැමිණිලි දෙක ගොනු කර ඇත්තේ හිටපු ජනාධිපතිවරයාගේ වරප්‍රසාද සම්බන්ධයෙන් සහ පාර්ලිමේන්තු අපේක්ෂකයෙකුගේ හිමිකම සම්බන්ධයෙනි. හිටපු ජනාධිපතිවරයාට අදාළ ප්‍රශ්නය දැනට ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විභාග වෙමින් පවතින නිසා, එම පැමිණිල්ල විලම්භනය කෙරිණ. තවත් පැමිණිලි දෙකක් මාධ්‍ය ආයතනයන්ට විරුද්ධවය. ඉන් එකක් පෞද්ගලික මාධ්‍ය ආයතනයකට විරුද්ධව හෙයින්, එය මැතිවරණ කොමසාරිස් වෙත යොමු කරන ලද අතර, අනෙක් කාරණය සමථයට පත් කෙරිණ. කාරණා හතරක් අදාළ වූයේ මැතිවරණ සමය තුළ රාජ්‍ය ආයතනයන්හි සිදු වූ ස්ථාන මාරු කිරීම් සහ බඳවා ගැනීම්වලටය. පැමිණිලි දෙකක් පාර්ලිමේන්තු අපේක්ෂකයෙකු වන, රාජ්‍ය සෞඛ්‍ය අංශයෙහි වෘත්තීය සමිති ක්‍රියාකාරකයෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙනි. ඔහුට විරුද්ධව ඉදිරිපත් වූ චෝදනාව වූයේ නිල පරිශ්‍රයක මැතිවරණ දැන්වීම් ඇලවීමයි.

IX - **මහා මැතිවරණය සඳහා විශේෂ ඒකකයක්**

ඡන්දය දීම කෙරෙන අතරතුර සිදු කෙරෙණ මැතිවරණ ආශ්‍රිත මූලික අයිතිවාසිකම් කඩවීම් වළක්වාලීම පිණිස විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කර ඇත. ලේකම් කාර්යාලය කොමිෂන් සභාවෙහි කොමසාරිස්වරයකුගෙන්, ලේකම්වරයාගෙන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම ඒකකය 2015 අගෝස්තු මස 17 මැතිවරණ දින පස්වරු 04.00 වන තෙක් ක්‍රියාත්මක විය

## 4.4 බණ්ඩාරවෙල ජල ප්‍රශ්නය

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ අභිප්‍රාය වූයේ ජාතික විදුලිබල පද්ධතියට වාර්ෂිකව සැපයෙන ගි.වො.පැ. 230 ක් සහිත මෙ.වො. 120ක් විදුලිබල උත්පාදන ක්‍රමවේදයට එකතු කිරීමයි. මෙමගින් ඉඩම් හෙක්ටෙයාර 4,500ක් සංවර්ධනය කෙරෙන අතර, සංවර්ධිත ඉඩම් හෙක්ටෙයාර 1,500ක් තවදුරටත් සංවර්ධනය කෙරෙනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය හා සමග සම්බන්ධීකරණයෙන්, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය විසිනි. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය 2008 ජූලි මස 20 වන දින ආරම්භ වූ අතර, පසුව, මූලික සාක්‍යතා අධ්‍යයන වාර්තාව මහබ්ගොඩ්ස් උපදේශක ඉංජිනේරු සමාගම විසින් සකස් කරන ලද අතර, පාරිසරික බලපෑම් ඇගයීම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සිදු කරන ලදී. ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කරන ලද්දේ මධ්‍යම පරිසර අධිකාරියයි. කෙසේවුවද, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය 2008 ජූලි මස 08 වන ආරම්භ වූ අතර, පසුව මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව මහබ්ගොඩ්ස් සමාගම විසින් ද, පාරිසරික බලපෑම් ඇගයීම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ද සකස් කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය ව්‍යපෘති අනුමත කිරීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කරන ලදී. කෙසේවුවද, පාරිසරික නිශ්කාශනය ලැබීමටත් පෙර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ විය. 1991 වසරේදී, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය විසින් සකස් කරන ලද මූලික උමා ඔය ව්‍යාපෘති යෝජනාව, මූල්‍ය සහාය ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවට ඉදිරිපත් කරන ලද නමුදු, අන්තර් ද්‍රෝණි ජල හැරවුමෙහි ජනතාවගේ ජල අයිතිවාසිකම් කඩවීම කරණකොට ගෙන, ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘති යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

2014 දෙසැම්බර් මස 26 වන දින, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි හීල්ඔය සහ පල්ලේපේරුව යන ගම්වල සහ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මකුල්ඇල්ල, එගොඩගම සහ වෙහෙරගලතැන්න යන ගම්වල ගම්වැසියන්ගේ නිවෙස්වල බිත්ති ඉරිතැලීම් සමග ප්‍රදේශයේ භූගත ජල මට්ටමෙහි අඩුවීමක් නිරීක්ෂණය විය. මාධ්‍ය වාර්තාවල සඳහන් වූයේ, තත්පරයට ලීටර් 250ක ජලය ව්‍යාපෘතියේ භූගත උමං පද්ධතියට කාන්දු වන බවයි. ඉහත සඳහන් ප්‍රදේශ වල පදිංචි ගම්වාසීන් 2014 දෙසැම්බර් මස 26 වන දින බණ්ඩාරවෙල නගරයට රැස් වී උමාඔය ව්‍යාපෘතියට

ස්වකීය විරෝධය ප්‍රකාශ කළහ. ඔවුන්, 'අසාර්ථක උමාඔය ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ජනතා එකමුතුව' නමින් සංවිධානයක් ගොඩනගා, එම නමින්ම ෆේස්බුක් පිටුවක් ද විවෘත කළහ. බණ්ඩාරවෙල ජනතා විරෝධතාවයෙන් පසු, මෙම කාරණයට මැදිහත් වීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තීරණය කෙරිණ. පළමුව, අදාළ බලධාරීන් වන බණ්ඩාරවෙල නගර සභාව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව, ඇල්ල ප්‍රාදේශීය සභාව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, භූ විද්‍යා සමීක්ෂණ සහ කැණීම් කාර්යාංශය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වැනි සංවිධාන වලින් වාර්තා කැඳවූ මානව හිමිකම් කොමිෂන් සභාව, 'අසාර්ථක උමාඔය ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ජනතා එකමුතුව' නමැති සිවිල් සමාජ සංවිධානයෙන් ද විස්තර රැස් කර ගන්නා ලදී.

කොමිෂන් සභාව විසින් 2015 මාර්තු මස 6 වන සහ 7 වන දිනවලදී, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ නියෝජිතයින්, වෙනත් පාර්ශ්වකරුවන් සහ ප්‍රදේශයේ පීඩාවට පත් ගම්වැසියන් සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. මෙම රාජ්‍ය නිලධාරි රැස්වීමට අතිරේක දිස්ත්‍රික් ලේකම්/බදුල්ල, ප්‍රාදේශිය ලේකම්/බණ්ඩාරවෙල, ප්‍රාදේශිය ලේකම්/ඇල්ල, ප්‍රාදේශීය දේශපාලනඥයින් සහ උමා ඔය ව්‍යාපෘතියේ නියෝජිතයෙකු සහභාගී වූහ. ඉන් අනතුරුව, මානව හිමිකම් කොමිෂන් සභා නියෝජිතයෝ පීඩාවට පත් ප්‍රදේශවල සංචාරයක නිරත වූ අතර, පීඩාවට පත් ගම්වැසියන් ද හමුවී, හානියට පත් නිවාස, භූගත ජල මූලාශ්‍ර සහ පාඨශාලා නැරඹීමෙන් අනතුරුව ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හීල්ඔය සහ පල්ලේපේරුව ගම්වැසියන් සහ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 'මකුල්ඇල්ල, එගොඩගම සහ වෙහෙරගලතැන්න ගම්වැසියන් ද හමුවීමෙන් පසු, "අසාර්ථක උමාඔය ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ජනතා එකමුතුව" සංවිධානයේ නියෝජිතයින් සහ ප්‍රදේශයේ ආගමික නායකයින් සමග රැස්වීමකට සහභාගී වන ලදී.

2015 ජූනි මස 29 දින, මානව හිමිකම් කොමිෂන් සභා නියෝජිත කණ්ඩායමක් නැවත බණ්ඩාරවෙලට පැමිණ, ප්‍රදේශයේ නිලධාරීන් සහ පීඩාවට පත් ගම්වැසියන් හමුවී, ප්‍රදේශයේ තත්ත්වය ලේඛනගත කරන ලදී. බණ්ඩාරවෙල දෙවන සංචාරයට පෙර, පීඩාවට පත් ප්‍රදේශවල සිදු කෙරෙන සහන සේවාවන් කොමිෂන් සභාවේ සමීපස්ථ අධීක්ෂණයට භාජනය කරන ලදී. සංචාරයෙන් පසු, මානව හිමිකම් කොමිෂන් සභා නියෝජිත කණ්ඩායම ගම්වැසියන්ගේ දුක්ගැනවිලි රජයේ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී.

## 4.5 ශ්‍රී ලංකා ආදිවාසීන්ගේ අයිතිවාසිකම්

ශ්‍රී ලංකාවේ කඩිනම් සංවර්ධන ව්‍යාපෘතීන් නිසා, ස්වකීය පාරම්පරික ප්‍රදේශවල ජීවත් වූ ආදීවාසීන්ට සිය ගම්බිම් අතහැර අලුත් මහවැලි ඉඩම්වල පදිංචියට යාමට සිදුවිය. ඔවුන්ට මහවැලි ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ හිමි වූ අතර, මෙතෙක් කල් පවත්වා ගෙන ආ වනවාසී ජීවන ක්‍රමය අත්හැරදමා වගාකරුවන්/ගොවියන් බවට පරිණාමනය වීමට සිදු විය. ආදීවාසීන්ගේ මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිතයා විසින් 2007 නොවැම්බර් මස 01 වන දින නිකුත් කරන ලද වාර්තාවට අනුව 'සංවර්ධන ව්‍යාපෘති, වතුයාය බඳු දීම්, විශේෂිත කරුණු සඳහා ඉඩම් භාවිතයේ සහන සහ ආරක්ෂිත කලාප පිහිටුවීම්' වැනි ප්‍රධානතම සාධකයන් හේතු කොට ගෙන, ආදිවාසීන් බරපතල ලෙස අස්ථානගත වූ අතර, පාරම්පරික පරිසරය සෝදාපාළුවට භාජනය වී, ස්වකීය පාරම්පරික පරිසරය සහ ගම්බිම් අත්හැර දමා, ඉස්මතුව එන දරිද්‍රතාවයත් සමග සංක්‍රමණය වීමට සිදුවිය.[2]

බහුකාර්ය මහවැලි සංවර්ධන ව්‍යාපතිය යටතේ, ශ්‍රී ලංකා රජය විසින් මාදුරුඔය ජාතික වනෝද්‍යානය වැනි ජාතික වනෝද්‍යාන කිහිපයක් පිහිටුවන ලද අතර, එවැනි ජාතික වනෝද්‍යානයක් වූ මාදුරුඔය, ජාතික වනෝද්‍යානය මනුෂ්‍ය පරිභෝජනය සඳහා තහනම් කලාපයක් බවට පරිවර්තනය විය. මේ නිසා මෙම වනාන්තර ඉඩම් ස්වකීය දඩයම් කලාප ලෙස භාවිතා කළ ආදිවාසීන් කෙරෙහි බරපතල බලපෑමක් ඇති විය. වසර කිහිපයකට පෙර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැදි ජනයාට හැඳුනුම්පත් නිකුත් කරන ලදී. ඔවුන්ට මෙම හැඳුනුම්පත් භාවිතා කරමින් තහනම් ජාතික වනෝද්‍යාන වලට ඇතුල් වී යම් සීමිත ප්‍රමාණයකට ස්වකීය හුරුපුරුදු ජීවන ක්‍රමය පවත්වා ගෙනයාමට හැකිවූ නමුදු, යම් යම් ප්‍රායෝගික ගැටලු නිසා මෙම ක්‍රමය සුමටව ක්‍රියාත්මක නොවේ.

අධ්‍යාපන අංශයෙහි ලා වැදි ජනයාගේ සහභාගිත්වය අවම මට්ටමක පවතී. නව භාෂාවකට අනුගත වීම ආදිවාසී ජනයා අතර බරපතල ගැටලුවකි. එසේම ලබා ගත හැකිව තිබෙන සම්පත් සම්බන්ධයෙන් ද විශාල ගැටලුවක් පවතී. සිංහල සහ දමිළ භාෂා ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වන හෙයින්, වැදි ජනයාගේ දරුවන්ට ද සිංහල හෝ දමිළ භාෂාවෙන් ස්වකීය අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට සිදු වෙයි. වැදි ජනයාගේ දරුවන් අධ්‍යාපනය ලබන පාසල්වල අධ්‍යපනික පහසුකම් අවම මට්ටමක පවතින අතර, ගුරු හිඟය ද පවතී.

ජාතික සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් පාරම්පරික ඉඩම් වලින් ඉවත්ව යාමට සිදුවීම නිසා ආදිවාසීන්ගේ අධ්‍යාත්මික ජීවිතයට ඇති වී ඇති බරපතල බලපෑම ද නොසළකා හැරිය නොහැකිය. බොහෝ ආදිවාසී කණ්ඩායම්වල මුල් ඇදහීම වූයේ අජීවී සජීවී සෑම දෙයකටම ආත්මයක් ඇත යන ජීවවාද විශ්වාසයයි. එය පාරම්පරික ඉඩම් හා සමග බැඳී පවතින්නකි. ස්වකීය ආගමික හා ඇදහීම්

[2] ආසියාවේ ආදිවාසීන්ගේ මානව හිමිකම් තත්ත්වය සහ මූලික නිදහස පිළිබඳ විශේෂ නියෝජිතයාගේ වාර්තාව - 2007 නොවැම්බර් මස 01

ක්‍රමයන්ට අනුව, ආදිවාසී ජනතාව විසින් ශුද්ධභූමි ලෙස සළකන ලද ඉඩම් දැන් විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති නිසා කෙළෙසීමට ලක් වී ඇත. ආදිවාසී ප්‍රජාවගේ සාමාජිකයින් අභ්‍යන්තර සංක්‍රමණයට භාජනය වී ඇති බැවින්, පාරම්පරික වැදි නායකයින්ට ස්වකීය පාරම්පරික පරිපාලනය පවත්වා ගෙන යාමට නොහැකි වී තිබේ.

මෙහෙයුම් සහ පර්යේෂණ අංශය විසින් ශ්‍රී ලංකාවේ ආදිවාසීන් පිළිබඳ පළාත් සමීක්ෂණයක් ආරම්භ කරන ලද අතර, එයින් ඌව, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වෙයි. මෙම සමීක්ෂණයට අනුව, ඉහත සඳහන් පළාත් තුනෙහි ආදිවාසීන් 12096ක් සිටිති. ඔවුහු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක පදිංචිව සිටිති. සවිස්තරාත්මක දත්ත එක්රැස් කර ගැනීමට සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි තොරතුරු සෙවීමේ ප්‍රයත්නයක් දියත් කළ යුතු වෙයි. සමීක්ෂණයෙන් වාර්තා වූ ආදිවාසී ජනගහනයේ විස්තර පහත වගුවෙහි දැක්වෙයි.

**ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතා සමීක්ෂණය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ස්ත්‍රී | පුරුෂ | එකතුව | දිස්ත්‍රික් එකතුව |
|---|---|---|---|---|---|
| මොණරාගල | මඩුල්ල | 160 | 168 | 328 | **328** |
| බදුල්ල | මහියංගනය | 180 | 165 | 345 | **345** |
| මඩකලපුව | මන්මුණෛයි-බටහිර-නාවත්කාඩු | 39 | 37 | 76 | |
| | කෝරළේපත්තු උතුර-වාකාරි | 1633 | 822 | 2455 | |
| | කෝරළේපත්තු දකුණ-කිරාන් | 374 | 383 | 757 | **3288** |
| ත්‍රිකුණාමලය | මුත්තූර් | 1289 | 1215 | 2504 | **2504** |
| අම්පාර | මහඔය | 452 | 320 | 772 | |
| | දෙහිඅත්තකණ්ඩිය | 747 | 831 | 1578 | **2350** |
| අනුරාධපුරය | කහටගස්දිගිලිය | 506 | 487 | 993 | |
| | හොරොව්පොතාන | 441 | 366 | 807 | |
| | මහවිලච්චිය | 180 | 165 | 345 | **2145** |
| පොළොන්නරුව | වැලිකන්ද | 95 | 96 | 191 | |
| | දිඹුලාගල | 414 | 531 | 945 | **1136** |
| එකතුව | | 6562 | 5645 | 12096 | **12096** |

මූලාශ්‍රය: ශ්‍රී ලාංකික ආදිවාසීන් පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සමීක්ෂණය-2015:
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## 4.6. භාෂා අයිතිවාසිකම්

සිංහල හා දමිළ භාෂාවන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවන් බව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ[3] - IV වන පරිච්ඡේදයේ දැක්වෙයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයට අනුව, භාෂාව මත පදනම්ව වෙනස්ව සැළකීම මූලික අයිතිවාසිකම් උල්ලංඝණයකි.[4] 2015 වසරේදී, කොළඹ ස්ථාපිත සිවිල් සමාජ සංවිධානයක් වන, ප්‍රතිපත්ති විකල්ප මධ්‍යස්ථානයෙන් භාෂා ආශ්‍රිත පැමිණිලි 50ක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. පැමිණිලි වර්ගීකරණය පහත දැක්වෙයි.

**භාෂා ආශ්‍රිත පැමිණිලි - පැමිණිලිවල ස්වභාවය අනුව - 2015**

| පැමිණිලි ස්වභාවය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| නාම පුවරු / ලේබල | 22 |
| ලිපි/චක්‍රලේඛ/ඇගයීම් | 07 |
| ආකෘති /අයදුම්පත්/දැන්වීම් | 03 |
| සාවද්‍ය දමිළ අනුවාද | 01 |
| සිංහළ භාෂාවෙන් නිකුත්කරන ලද බලපත්‍ර/අවසර පත්‍ර/ටිකට් | 03 |
| වෙබ් අඩවි | 12 |
| නිෂ්පාදන දිනය/අවලංගු වන දිනය /පරිභෝජන විස්තර | 02 |
| එකතුව | 50 |

මූලාශ්‍රය: භාෂා අයිතිවාසිකම් ලිපිගොනු-ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව-2015

## 4.7.කොළඹ නගරයේ හා තදාසන්න ප්‍රදේශ වල වාහන තදබදය

කොළඹ සහ උප නගර ප්‍රදේශයන්හි වාහන තදබදය සම්බන්ධයෙන් බහු ආංශික පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2015 ඔක්තෝබර් මස 08 වන දින මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. මෙම රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ, පුරවැසියන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් වලට බාධා පමුණුවන සහ එමගින් ඔවුන්ගේ ජීවනෝපායයන් කෙරෙහි නිෂේධන බලපෑමක් ඇති කරවනසුළු කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි වාහන තදබදය ඇති කරවන නිධාන හේතු හඳුනා ගැනීමයි.

මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්, මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.) නියෝජ්‍ය

[3] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදය
[4] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය

පොලිස්පති (රථවාහන), කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පොලිස් දිශාවල සියලුම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් සහ මොරටුව විශ්ව විද්‍යාලයේ නගර සහ ග්‍රාම සැලසුම් අංශයේ විද්‍යාර්ථීන් ආරාධිතයින් අතර වූහ.

**ආරාධිතයින් විසින් ගැටලු ගණනාවක් හඳුනා ගන්නා ලදී. එනම්:**

1. ප්‍රමාණවත් නොවූ පොදු ප්‍රවාහන ක්‍රමවේදය
2. කොළඹ නගරය හරහා කෙරෙන ගමනාගමනය වැඩිවීම
   කොළඹ වරාය ආශ්‍රිත සමහර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන්නේ කොළඹ වරායෙන් බැහැරවය. උදහරණයක් වශයෙන්, බහාළුම් ස්ථානගත කර ඇත්තේ වරාය පරිශ්‍රයේ නොව ඔරුගොඩවත්ත ස්ථානයකය. මේ නිසා අතිරේක රථවාහන තදබදයක් ඇතිවෙයි.
3. මාර්ග දෙපස සිදු කෙරෙන සුළු වෙළඳාම්.
4. අදාළ ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිව කෙරෙන මාර්ග ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් (උදා: ටෙලිකොම්, ජලසම්පාදන මණ්ඩලය, පළාත් පාලන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය)

ඉහත සඳහන් කපොළු මගහරවා ගැනීම සඳහා ක්‍රමවේද සහ යෝජනා

1. කොළඹ නගරය මගහරිමින් යාම සඳහා නව බස් මාර්ග හඳුන්වා දීම
2. වාහන ආනයන ප්‍රතිපත්තිය සමාලෝචනයට භාජනය කිරීම.
3. වරාය අධිකාරිය සහ රේගු දෙපාර්තමේන්තුව හා සමග සහයෝගයෙන් බහාළුම් සඳහා කොළඹ වරාය තුළ පහසුකම් සැලසීම
4. පදිකයින් සඳහා විදුලි සෝපාන හඳුන්වාදීම.
   බොරැල්ල සුසානභූමි හන්දිය, ඔරුගොඩවත්ත සහ මැලිබන් හන්දිය යන ස්ථානවල ගුවන්පාලම් ඉදි කිරීම.
5. ආකල්ප වෙනසක් සඳහා රියැදුරන් පුහුණු කිරීම.
6. රථවාහන පාලනය සඳහා පරිගණකගත කැමරා ක්‍රමවේදයක් හඳුන්වාදීම.
7. නගරය පවිත්‍ර කිරීම සහ මාර්ග අලුත්වැඩියාව රාත්‍රි කාලයේදී සිදු කිරීම.
8. පවත්නා නීති හා රෙගුලාසි වලට අනුගතවීම සහතික වීම.
9. ත්‍රී වීලර් සඳහා නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම.
10. සියලුම මාර්ග අලුත්වැඩියාවන් සහ ඉදිකිරීම්, මාර්ග සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය සහ පළත් පාලන ආයතන අතර දැඩි සම්බන්ධීකරණයකින් යුක්තව ඉටු කිරීම.

## 4.8. විශේෂ සිද්ධීන්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් සමග, ඌව පළාත් සභා මැතිවරණ කටයුතු අධීක්ෂණය සඳහා වවුනියාවට ගොස් ආපසු පැමිණෙමින් සිටි අතරතුර, 2014 සැප්තැම්බර් මස 21 වන දින අභාවප්‍රාප්ත වූ, හිටපු අධ්‍යක්ෂිකා (මෙහෙයුම් සහ සමාලෝචන) තුසිතා සමරසේකර මෙනෙවියගේ පළමුවන මරණ සංවත්සරය කොමිෂන් සභාව විසින් සමරණ ලද අතර, මානව හිමිකම් සුරකින්නෙකු වශයෙන් ඇය විසින් ලබා දෙන ලද දායකත්වය සිහිපත් කරමින්, ඇය ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම මානව හිමිකම් සුරකින්නන් අනුස්මරණය සඳහා අනුස්මරණ ක්‍රියාදාමයක් යෝජනා කෙරිණ. ඇයගේ අනුස්මරණය වෙනුවෙන් නීතිඥ එස්.ජී.පුංචිහේවා මහතා විසින් විශේෂ දේශනයක් පවත්වන ලදී.

# පස්වන පරිච්ඡේදය : පාලන හා මුදල් අංශය

පාලන හා මුදල් අංශයේ ප්‍රධානතම වගකීම වන්නේ මානව සම්පත් හා මුදල් කළමනාකරණයයි. කොමිෂන් සභාවෙහි අරමුණු සාක්ෂාත්කර ගැනීමෙහි ලා මානව සම්පත් කළමනාකරණය ඉතා වැදගත් සාධකයකි.

## 5.1. පාලන අංශය

කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය පාලන අංශයේ කාර්ය භාරයකි. ප්‍රාදේශීය කාර්යාල ඇතුළු සමස්ත කාර්යාල සංකීර්ණයෙහි කළමනාකරණය මෙන්ම ආරක්ෂක පද්ධතිය නඩත්තු කිරීම ද අංශය විසින් ඉටු කෙරේ.

(ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය උදෙසා 2015 වසරේදී ගනු ලැබූ පියවර පිළිබඳ විස්තර සඳහා 3.4 ඡේදය - කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය - බලන්න.)

## 5.2. මුදල් අංශය

කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය සකස් කරනු ලබන මුදල් අංශය, ප්‍රාදේශීය කාර්යාලවල ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සලසා දීම ඇතුළු සියලුම මූල්‍ය කාරණා භාරව ක්‍රියා කරයි. තීරණ ගැනීමේ ක්‍රියාදාමය සඳහා මූල්‍ය තොරතුරු සම්පාදනයද මෙම අංශය විසින් සිදු කෙරේ.

(ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2015 වසරේ වාර්ෂික වියදම් වලට අදාළ සවිස්තරාත්මක ප්‍රකාශනය සඳහා මෙම වාර්තාවට යා කර ඇති **ඇමුණුම් 1ඒ** බලන්න.)

පාලන සහ මුදල් අංශය 2015 වසරේදී පහත දැක්වෙන ක්‍රියාකාරකම් ද ඉටු කිරීම සඳහා පියවර ගන්නා ලදී.

සියලුම ප්‍රාදේශීය කාර්යාල වල පැමිණීම සහ පිටවීම සළකුණු කෙරෙන ඇඟිලි සළකුණු ගැනීමේ යන්ත්‍ර සවි කරන ලදී. නිලධාරීන් අතර අන්තර් සන්නිවේදනය පහසුකරවීම පිණිස ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය සඳහා අවශ්‍ය වෙනස්කිරීම් සිදු කරන ලදී. කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා කැබ්රථ 03 ක් මෝටර් කාර් 03 ක් ඇතුළු නව වාහන මිලදී ගන්නා ලදී. මෝටර්කාර් 03 මිලදී ගන්නා ලද්දේ 2015 ජනවාරි මස 01 වන දින වන අතර, කැබ්රථ මිලදී ගන්නා ලද්දේ 2015 ජනවාරි මස 03 වන දිනය.

# හයවන පරිච්ඡේදය : ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන ව්‍යාපෘතිය - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය

(මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය: 2 වන අදියර - 2013 ජූනි සිට 2016 ජූනි දක්වා)

## 6.1. ව්‍යාපෘතියේ පසුබිම

මෙම ව්‍යාපෘතිය වූ කලී, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, ජනගහන ක්‍රියාකාරකම් සඳහා වූ එක්සත් ජාතීන්ගේ අරමුදල සහ සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය යන ආයතනවල ඒකාබද්ධ සහාය ඇතිව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ 1 වන අදියර 2010 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක කරන ලද අතර, දෙවන අදියර 2013 ජූනි සිට 2016 ජූනි දක්වාය.

2008 වසරේදී, මානව හිමිකම් කවුන්සිලයේ විශ්ව සාමයික සමාලෝචන ක්‍රියාදාම අවස්ථාවේදී පහත දැක්වෙන ක්‍රියාදාමයන්ට අනුගතවීමට ශ්‍රී ලංකාව ගිවිස ගෙන ඇත.

අ) ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මක් සහ අතුරුදහන්වීම් දත්ත පද්ධතියක් සම්පාදනය කිරීමට; සහ

ආ) දිවයින තුළ මානව හිමිකම් ආරක්ෂාව සහ වැඩිදියුණුව සඳහා අභ්‍යන්තර යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

මෙම අවස්ථාවේදී, ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි මූල්‍යමය හා තාක්ෂණික සහාය අපේක්ෂා කරන ලද අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ එක්සත් ජාතීන් විසින් මෙම ව්‍යාපෘතිය ඒකාබද්ධව සැලසුම් කරන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බී ශ්‍රේණියට පහත හෙළීමට හේතු පාදක වූ කරුණු ලෙස ජාතික මානව හිමිකම් ආයතනය ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුව විසින් 2007 සහ 2009 දී හඳුනා ගන්නා ලද පරතර සහ ගැටලු ; මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී, ආසියා ශාන්තිකර සංසදය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ කලාපීය කාර්යාලය සහ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් 2012 වසරේදී ක්‍රියාත්මක කරන ලද ධාරිතා ඇගයීමේ නිර්දේශ; ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම; උගත් පාඩම් සහ සංහිඳියා කොමිෂන් සභා වාර්තාවේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිකුත් කරන ලද නිර්දේශ; ව්‍යාපෘතියේ 1 වන අදියරේදී පවත්වන ලද පාර්ශ්වකරුවන්ගේ උපදේශන/රැස්වීම්වලදී රැස් කර ගන්නා ලද ආදාන සහ උගත් පාඩම් පළපුරුද්ද සැළකිල්ලට ගන්නා ලදී.

මෙම කාර්ය භාරයේ පළමුවන අදියර මෙන්ම දෙවන අදියර ද සැලසුම් කරන ලද්දේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සක්‍රියත්වය සහ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීම පිණිස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති එදිනෙදා ක්‍රියාකාරකම් වලට ව්‍යාපෘතිය ඒකාබද්ධ කර ගැනීම පිණිසය. 2010 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා වූ කාල පරාසය තුළ ක්‍රියාත්මක වූ, එක්සත් ජාතීන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පිරිනමන ලද ඒකාබද්ධ සහාය ක්‍රියාදාමයේ පළමුවන අදියරේදී, 2007 වසරේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ශ්‍රේණිය පහත හෙළීම සඳහා ජාත්‍යන්තර අපරාධ විනිශ්චය කිරීමේ උසාවිය (ICC) විසින් හඳුනා ගන්නා ලද ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අවශ්‍ය විය. එහි අරමුණ වූයේ, නැවත ඒ ශ්‍රේණිය දිනා ගැනීම සඳහා පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමය.

එමනිසා, පළමුවන අදියර ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද කරුණු වූයේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළත සම්බන්ධීකරණය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, තොරතුරු ප්‍රචාරණය සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වීම, සිවිල් සමාජ සංවිධාන හා රාජ්‍ය ආයතන සමග වඩාත් සක්‍රීය සහයෝගිතාවයක් පවත්වාගෙන යාම සඳහා කොමිෂන් සභාවට සහාය වීම සහ ජාතික නීති සහ පරිපාලන ව්‍යවහාරයන් ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස කොමිෂන් සභා ධාරිතාවය ගොඩනැගීමය.

එහි ප්‍රතිඵලයක් ලෙස, ඉහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ක්ෂේත්‍රයන් යටතේ, ජනවාරි, 2010 සිට දෙසැම්බර් 2012 දක්වා කල වකවානුව තුළ, එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘතියේ පළමුවන අදියර තුළ පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් / ප්‍රතිදාන සාක්ෂාත් කර ගන්නා ලදී. කෙසේවුවද, විශේෂයෙන්ම මානව හිමිකම් ආශ්‍රිත මැදිහත්වීම් සඳහා අනුබලදෙන හෝ හේතුභූත වන පරිසරයක් නොතිබූ එම වකවානුවේදී පැවති දේශපාලනමය වාතාවරණය නිසා, ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඉටු කිරීම අතිශයින් අභියෝගාත්මක අභ්‍යන්තර මෙන්ම බාහිර අභියෝග විය.

## 6.2. ක්‍රියාකාරකම් -අදියර 1

ව්‍යාපෘතියේ පළමුවන අදියරේදී, පවරා ඇති කාර්යභාරය සක්‍රීයව ඉටු කිරීමට හැකිවන පරිදි, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළත සම්බන්ධීකරණය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ යාන්ත්‍රණයන් ශක්තිමත් කෙරිණ.

ව්‍යාපෘති අපදානයන් පහත දැක්වෙන පරිදි වේ.

අ) ඒකාබද්ධ ත්‍රෛමාසික සම්බන්ධීකරණයට සහායවීම, ප්‍රාදේශීය සම්බන්ධීකාරකයින් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය හා කොමසාරිස්වරුන් අතර රැස්වීම් සමාලෝචනය හා අධීක්ෂණය කිරීම සහ එමගින් 2010ට පෙර සිටම අක්‍රීයව පැවති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අභ්‍යන්තර සම්බන්ධීකරණ ක්‍රියාදාමය ප්‍රකෘතිමත් කිරීම.

ආ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඇතුළත සම්බන්ධීකරණය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා, කොමසාරිස්වරුන් සහ කොමිෂන් සභා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය කලාප වලට යාම.

ඇ) ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ධාරිතා ඇගයීම් වලට අනුව, ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 10 සඳහා උපකරණ/වාහන සහාය ( ලිබඩු සහ තො.තා. මී.09; යතුරු පැදි මී.2.6).

ඈ) ඔවුන් විසින් හඳුනා ගනු ලබන තේමාවන් යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩල සඳහා පුහුණුව (භාෂා පුහුණුව, මෙහෙයවීම් හා ඇගයීම්, පෞරුෂත්වය ගොඩනැගීම, විමර්ශන ශිල්පීය ක්‍රම, මනෝ-සමාජීය කුසලතා, නායකත්ව කුසලතා)

ඉ) නීති නිලධාරීන් නොමැතිව කටයුතු කරන ප්‍රාදේශීය කාර්යාල 07 සඳහා නීති උපදේශක සේවා ලබා ගැනීම සඳහා සහාය.

ඊ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යක්ෂම සහ සක්‍රීය ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන ගැටලු හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වීම පිණිස, කොමිෂන් සභා කොමසාරිස්වරුන්ට ආසියා ශාන්තිකර සංසදය විසින් පත්කරනු ලබන විශේෂඥයන් හා සමග සතියක "ඉහළ මට්ටමේ සංවාදයක්" ද, ආසියා ශාන්තිකර සංසදය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ කලාප කාර්යාලය සහ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා දින 21ක ධාරිතා තක්සේරු කිරීමක් ද, සංවිධානය කර වැඩිදියුණුව සඳහා නිර්දේශයන් ද යෝජනා කෙරිණ.

උ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාල නොමැති ප්‍රදේශ වල පැවැත්වෙන ජංගම කාර්යාල සහ ජංගම සායන සඳහා සහාය දක්වන ලදී.

ඌ) කිලිනොච්චියේ ජංගම කාර්යාලයක් විවෘත කිරීමට සහ ප්‍රාදේශීය කාර්යාල ඔස්සේ ආවරණය කිරීමට අපහසු ප්‍රදේශ වල ජංගම සායන පැවැත්වීමට ද ව්‍යාපෘතියේ සහාය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලැබුණි.

එ) මැතිවරණ අධීක්ෂණ චාරිකා 03කට සහාය ලබා දෙන ලදී.

**6.2.1. තොරතුරු ප්‍රචාරණය සඳහා මානව හිමිකම් කවුන්සිලයට සහාය ලබා දෙන ලද අතර, පහත දැක්වෙන ප්‍රතිදානයන්ටද සහාය දැක්විණ.**

අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය අධි ශ්‍රේණිගත කිරීම සහ නඩත්තුව ( 2010 සිට 2016 දක්වා)

ආ) වාර්ෂික වාර්තා පරිවර්තනය කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට සහාය (2008, 2009, 2010 සහ 2011).

ඇ) පුවත්පත් සාකච්ඡා පැවත්වීමට සහාය (2011- 2, 2012-2)

ඈ) අත් පත්‍රිකා, පොත්පිංච සහ වෙනත් අධ්‍යාපන තොරතුරු සහ ලේඛන පරිවර්තනය කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වීම

ඉ) ජාත්‍යන්තර මානව හිමිකම් දින සැමරුම් උත්සව පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වීම ( 2010,2011,2012)

ඊ) මාධ්‍ය නීති උපදේශකයෙකුගේ සේවය ලබාදීමෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වීම .

උ) මානව අයිතිවාසිකම් අමාත්‍යාංශය විසින් සකසන ලද (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි සහාය ඇතිව) අතුරුදහන් වූවන්ගේ දත්ත පද්ධතිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට මාරුකිරීමේ ක්‍රියාදාමයට සහාය වීම.

**6.2.2. සිවිල් සමාජ සහ රාජ්‍ය ආයතන සමග වඩාත් සක්‍රිය සහයෝගිතා පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වන ලදී.**

පහත දැක්වෙන ප්‍රතිදානයන් සඳහා සහාය සැපයිණ.

අ) මානව හිමිකම් ආශ්‍රිත ගැටලු සම්බන්ධව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, සිවිල් සමාජ සහ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය වැඩි කිරීම පිණිස, සිවිල් සමාජ සහ රාජ්‍ය ආයතන සමග උපදේශන / සංවාද සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වීම (2010 - ජාතික මට්ටමින් 02, ප්‍රාදේශීය මට්ටමින් 17 ; 2011 - ජාතික මට්ටමින් 01, ප්‍රාදේශීය මටටමින් 29 ; 2012 - ජාතික මට්ටමින් 02, ප්‍රාදේශීය මට්ටමින් 34).

ආ) රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සඳහා දින දෙකක නේවාසික මානව හිමිකම් පුහුණු වැඩසටහන්.

ඇ) මාධ්‍යකරුවන් (ප්‍රවෘත්ති ලේඛකයින්) සඳහා ජාතික මට්ටමේ දින දෙකේ නේවාසික මානව හිමිකම් පුහුණුව සහ තරුණ කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා සමග සහයෝගිත්වයෙන් තාරුණ්‍යය සඳහා නුවරඑළියේදී දින තුනේ නේවාසික මානව හිමිකම් පුහුණුව.

**6.2.3. ජාතික නීති සහ පරිපාලන ව්‍යවහාරයන් ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූල බවට සහතික වීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීමේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා සහාය**

පහත දැක්වන ප්‍රතිදානයන් සඳහා සහාය සැපයිණ.

අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, 2012 වසරේදී, එක්සත් ජාතීන් සහ පාර්ලිමේන්තුව සමග එක්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා එක්දින මානව හිමිකම් අධ්‍යාපන සම්මන්ත්‍රණයක් සංවිධානය කර, කතානායකගේ සහ නියෝජ්‍ය කතානායකගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී (පැමිණීම - මන්ත්‍රීවරුන් 74).

ආ) 2012 වසරේදී, අන්තර් ක්‍රියාකාරී සංවාදයක්/ සාකච්ඡාවක් සංවිධානය කර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා කාර්යාලය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහභාගීත්වයෙන් හා කතානායකගේ සහ නියෝජ්‍ය කතානායකගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී (පැමිණීම - මන්ත්‍රීවරුන් 53).

ඇ) 2012 වසරේදී, මානව අයිතිවාසිකම් පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සාමාජිකයින් මුණගැසී අදහස් හුවමාරුකර ගැනීම සඳහා සහ මානව අයිතිවාසිකම් පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් අපගේ පාර්ලිමේන්තුවේ ද ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර, පිලිපීන පාර්ලිමේන්තු කතානායකගෙන් ආධාන ලබා ගැනීම සඳහා, පිලිපීන පාර්ලිමේන්තුවට යාම පිණිස නියෝජ්‍ය කතානායකවරයාට සහ එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අධ්‍යාපන චාරිකාවක් සඳහා සහාය වීම.

ඇ) සිවිල් සමාජ, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, වැඩිහිටි කණ්ඩායම්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් හා සමග ප්‍රාදේශීය මට්ටමේ උපදේශන 10ක් ද, වැඩිහිටි ජනගහන ගැටලු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ එක් උපදේශනයක් ද සංවිධානය කර පවත්වන ලදී. මෙම උපදේශන සභායෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද නිර්දේශයන්, වැඩිහිටි මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී (2011/2012).

## 6.3. ක්‍රියාකාරකම් - අදියර 2

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට එක්සත් ජාතීන්ගේ සහාය - දෙවන අදියර 2013 ජූනි සිට 2016 ජූනි දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහළ ශ්‍රේණියක ශ්‍රේණිගත කිරීම සිදු කරන ලද අවස්ථාවේදී, ජාත්‍යන්තර අපරාධ විනිශ්චය උසාවිය (ICC ) විසින් හඳුනා ගන්නා ලද පරතරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට පමණක් නොව, මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට අපහසු වූ කොමිෂන් සභාවේ යම් යම් තීරණාත්මක කාර්ය භාරයන් සඳහා සහාය ලබා ගැනීමට ද හැකි වන අයුරින් ව්‍යාපෘතිය නිර්මාණය විය යුතු යැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දෙවන අදියරේදී ඉල්ලා සිටින ලදී.

එමනිසා, දෙවන අදියරේදී ක්‍රියාකාරකම් ප්‍රධාන ක්‍රියාකාරකම් ප්‍රතිඵල කාණ්ඩ 05ක් යටතේ වින්‍යාසගත කරමින් ව්‍යාපෘති සැලැස්ම නිර්මාණය කරන ලදී. ඒවා නම්:

- මානව හිමිකම් සම්බන්ධයෙන් වඩාත් සක්‍රීය පුහුණුව සහ දැනුවත් වීම සැපයීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් වීම;
- ප්‍රධානතම තීරණ ගන්නන් සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් බව නංවන සහ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහායවීම;
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියකාරිත්ව ධාරිතාවය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාලවල මෙහෙයුම් ධාරිතාවය වර්ධනය කිරීම;
- මානව හිමිකම් ගැටලු සහ උද්දේශයන් සොයාබලා හසුරවීම සහ වාර්තාකරණයෙහිලා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම;
- සිවිල් සමාජ සංවිධානයන් හා සමග ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගනුදෙනු වර්ධනය සඳහා ප්‍රාදේශීය සහ ජාතික යන දෙමට්ටමින් ම සහාය; සහ
- මානව හිමිකම් පදනම් කොටගත් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනයේ ප්‍රවර්ධනය උදෙසා නීති සම්පාදකයින්, රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සමග ක්‍රියා කිරීම.

යථෝක්ත තේමාත්මක ක්ෂේත්‍රයන් යටතේ වර්ගීකරණය කරන ලදුව, පහත දැක්වෙන ප්‍රතිදානයන් සලසාලීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ව්‍යාපෘතියේ සහාය පළවිය.

### 6.3.1. මානව හිමිකම් සම්බන්ධයෙන් වඩාත් සක්‍රීය පුහුණුව සහ දැනුවත් වීම සැපයීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් වීම;

**1) විවිධ තේමාවන් යටතේ, විවිධ ඉලක්කගත කණ්ඩායම් වල මානව හිමිකම් පිළිබඳ දැනුවත් බව ඉහළ නැංවීම සහ පුහුණු කිරීම් සඳහා විෂයමාලා සම්පාදනය කිරීමට**.

**ආවරණය කෙරෙන ඉලක්කගත කණ්ඩායම් -** සිවිල් සමාජ සංවිධාන, බහු ආගමික නායකයින්, වෘත්තීය සමිති, මාධ්‍යවේදීන්, පොලිසිය, හමුදා, පළාත් පාලන දේශපාලනඥයින්, පළාත් සභා මන්ත්‍රීවරුන්, තාරුණ්‍යය, රාජ්‍ය නිලධාරීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෙර පාසල් ගුරුවරුන්)

**ආවරණය කෙරෙන මාතෘකා -** සමාජභාවිත්වය පදනම් කොටගත් ප්‍රචණ්ඩත්වය, ආගමික අයිතිවාසිකම්, භාෂා අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම්.

මෙකී විෂයමාලා සම්පාදනය 2013 වසරේදී ආරම්භ කරන ලද අතර, මුලින්ම සම්පාදනය කරන ලද විෂයමාලා, 2013 සහ 2014 වසරවලදී, සමහර ඉලක්කගත කණ්ඩායම් සඳහා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද දැනුවත්කිරීම් සහ පුහුණුකිරීම් වැඩසටහන්වලදී භාවිතා කරන ලදී. ඉන්පසු, උගත් පාඩම් සහ මෙම පුහුණු කිරීම් වලට සහභාගීවූවන්ගේ අදහස් උදහස් මත පදනම්ව, මුලින් සම්පාදනය කරන ලද විෂයමාලා සංශෝධනය කෙරිණ.

**2) දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී සහ පුහුණු වැඩසටහන්වලදී භාවිතා කිරීම පිණිස අධ්‍යාපනික ද්‍රව්‍ය (පත්‍රිකා, පොත් පිංචවල් සහ පොත්) සම්පාදනය සහ මුද්‍රණය**

**6.3.2. ප්‍රධානතම තීරණ ගන්නන් සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් බව ඔප්නංවන පුහුණුකිරීම් වැඩසටහන් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහායවීම;**

i) විවිධ ආගම්වල ආගමික නායකයින් 353ක් සහ ආගමික නායිකාවන් 31ක් ප්‍රාදේශීය මට්ටමින් (කිලිනොච්චි, අනුරාධපුරය, අම්පාර, කල්මුණේ, මාතර, වවුනියාව, මහනුවර, මඩකලපුව) උපදේශන සංවාද සහිතව පවත්වන ලද වැඩසටහන් 08ක් ඔස්සේ, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම ගැන සහ ස්වකීය භූමිකාව ගැන වඩාත් හොඳින් දැනුවත් වීම. (2013)

ii) වෘත්තීය සමිති ක්‍රියාකාරීන් 267ක් සහ ක්‍රියාකාරිනියන් 41ක්, මඩකලපුව, මහනුවර, මාතලේ, නුවරඑළිය, අනුරාධපුරය හා පොළොන්නරුව, යාපනය හා කිලිනොච්චි සහ කල්මුණේ පවත්වන ලද පුහුණු වැඩසටහන් 05ක් ඔස්සේ, කම්කරු ගැටලු සහ මානව අයිතිවාසිකම් ගැන පුහුණුව සහ නිපුණත්වය ලබා ගැනීම. (2013)

iii) පළාත් පාලන දේශපාලනඥයින් - පුරුෂ 32ක් හා කාන්තා 52ක්, ප්‍රාදේශීය මට්ටමින් (නුවරඑළිය, මාතර, යාපනය/කිලිනොච්චි, වවුනියාව, මුලතිව්, මන්නාරම, අනුරාධපුරය) පළාත් සභා මන්ත්‍රීවරුන්, මහනගර සභා සභිකයින් සහ නගර සභා සභිකයන් සඳහා පවත්වන ලද මානව හිමිකම් වැඩසටහන් 09ක් සහ ත්‍රිකුණාමලයේ (සිංහල හා දමිළ මාධ්‍යයෙන්) පවත්වන ලද වැඩසටහන් 02ක් ඔස්සේ මානව හිමිකම් පිළිබඳ පුහුණුව ලැබීම. ( 2013)

iv) වවුනියාවේ, අනුරාධපුරයේ, යාපනයේ සහ කිලිනොච්චියේ පවත්වන ලද පුහුණු වැඩසටහන් 04ක් සහ සාකච්ඡා ඔස්සේ, පොලිස් සහ සන්නද්ධ හමුදා සාමාජිකයින් 35කට මානව අයිතිවාසිකම් සහ මානුෂික නීති සම්බන්ධයෙන් වැඩිදියුණු වූ දැනුවත් වීමක් ලබාදීම. (2013)

v) ග්‍රාමීය ළමා අයිතිවාසිකම් මෙහෙයුම් කමිටුවල සාමාජිකයින් 92කට සහ සාමාජිකාවන් 57කට සහ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියා කරන රාජ්‍ය නිලධාරීන්ට කිලිනොච්චියේ සහ මඩකලපුවේ පවත්වන ලද පුහුණු වැඩසටහන් 02ක් ඔස්සේ, වැඩිදියුණු වූ දැනුවත් වීමක් ලබාදීම. (2013)

vi) මධ්‍යම පළාතේ පළාත් සභිකයින් සහ පළාත් සභා නිලධාරීන්ට (65), මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන් සහ පසුවිපරම් සාකච්ඡාවලදී, මානව අයිතිවාසිකම් පිළිබඳ වැඩිදියුණු වූ දැනුවත් වීමක් ලබාදීම. (2014)

vii) ග්‍රාමීය ළමා අයිතිවාසිකම් මෙහෙයුම් කමිටුවල සාමාජිකයින් 500කට වැඩි සංඛ්‍යාවක්, පොලිස් නිලධාරීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් පිරිසක්, මඩකලපුව, කිලිනොච්චි, වවුනියාව, මන්නාරම,

යාපනය සහ මුලතිව්හි පවත්වන ලද ළමා අයිතිවාසිකම් ආරක්ෂාව සහ මෙහෙවීමට අදාළ පුහුණු වැඩසටහන් 06කදී සහ ප්‍රදේශයේ ඇති ගැටලු සම්බන්ධයෙන් පවත්වන ලද පසුවිපරම් සාකච්ඡාවලදී ළමා අයිතිවාසිකම් ආක්ෂාකිරීම සම්බන්ධයෙන් වැඩිදියුණු වූ දැනුමක් ලබා ගැනීම. (2014)

viii) මඩකලපුවේ දිස්ත්‍රික් ළමා අයිතිවාසිකම් මෙහෙයුම් කමිටුවල සාමාජිකයින් 40ක් පුහුණු වැඩසටහන් ඔස්සේ ළමා අයිතිවාසිකම් ආරක්ෂාව සහ මෙහෙයවීම පිළිබඳ වැඩිදියුණු වූ දැනුම ලබා ගැනීම. (2014)

ix) කල්මුණේ ආගමික නායකයින් 100ක්, සිවිල් සමාජ සාමාජිකයින් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ඔස්සේ, ළමා අයිතිවාසිකම් ආරක්ෂාව සහ මෙහෙයවීම පිළිබඳ වැඩිදියුණු වූ දැනුම ලබා ගැනීම සහ ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සම්බන්ධීකාරකයින් සමග කටයුතු කිරීම. (2014)

x) නුවරඑළියේ පෙර පාසල් ගුරුවරුන් 200ක් ළමා අයිතිවාසිකම් සහ ළමා මනෝවිද්‍යාව සම්බන්ධයෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන් 02කදී ස්වකීය එදිනෙදා වැඩකටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ලත් වැඩිදියුණු වූ දැනුම. (2014)

xi) පොලිස් නිලධාරීන් 320ක පිරිසක් විසින් (මඩකලපුව - 40, යාපනය - 125, කිලිනොච්චි - 155) පුහුණු වැඩසටහන් 03ක් ඔස්සේ ස්වකීය එදිනෙදා වැඩකටයුතු වලදී උපයෝගී කර ගැනීම සඳහා ළමා අයිතිවාසිකම් ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩිදයුණු වූ දැනුමක් ලබා ගැනීම. (2014)

xii) උසස් පොලිස් නිලධාරීන් (ස්ථානාධිපති තනතුරින් ඉහළ) 242ක් (මධ්‍යම පළාත - 143, අම්පාර - 89, මඩකලපුව - 60, ත්‍රිකුණාමළය - 100) පුහුණු වැඩසටහන් 04ක් සහ පසුවිපරම් සාකච්ඡා ඔස්සේ, මානව අයිතිවාසිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය සම්බන්ධයෙන් සහ මෙම මූලධර්ම පොලිස් රාජකාරිවලදී ප්‍රායෝගිකව භාවිතා කිරීම සම්බන්ධයෙන් වැඩිදියුණු වූ දැනුමක් ලබා ගැනීම. (2014)

xiii) මුලතිව්හි යුද හමුදා නිලධාරීන් 256කගේ මානව අයිතිවාසිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ දැනුම පුහුණු වැඩසටහන් මාලාවකදී වැඩිදියුණු වීම. ( 2014)

xiv) අම්පාර දිස්ත්‍රික්කයේ, පළාත් පාලන දේශපාලනඥයන් සහ නිලධාරීන් 100ක්, (මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා), ප්‍රදේශයේ මානව අයිතිවාසිකම් ගැටලු සම්බන්ධයෙන් පැවති පුහුණු වැඩසටහන් සහ පසුවිපරම් සාකච්ඡා වලදී වැඩිදියුණු වූ දැනුවත් වීමක් ලබා ගැනීම. (2014)

xv) රජයේ නිලධාරීන් 25ක් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් 25ක් සඳහා අම්පාරේදී ද, රාජ්‍ය නිලධාරීන් 30ක් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් 30ක් සඳහා මාතරදී ද පවත්වන ලද දෙදිනක නේවාසික වැඩමුළුව ඔස්සේ, මානව හිමිකම්වලට අදාළව රාජ්‍ය නිලධාරීන්ගේ සහ සිවිල් සමාජයේ ධාරිතා වර්ධනයට තදනන්තරව, මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස රජයේ කාර්යාල සහ සිවිල් සමාජ

ඒකාබද්ධ කරමින් අම්පාර, මාතර, කල්මුණේ සහ යාපනයේදී ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටු ස්ථාපිත කෙරිණ. (2015)

### 6.3.3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරිත්ව ධාරිතාවය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාලවල මෙහෙයුම් ධාරිතාවය වර්ධනය කිරීම;

i) දෙදිනක නේවාසික පුහුණුව ඔස්සේ මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලීය සාමාජිකයින් 60කගේ කළමනාකරණ, නායකත්ව, කණ්ඩායම් ගොඩනැගීම්, ධනාත්මක චින්තන, අනුග්‍රාහක සංස්ථාන සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම**.** (2013)

ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රජයේ පාර්ශ්වකරුවන්, දේශීය ආබාධිතත්ව ව්‍යාපාරය සහ ආබාධිතත්ව ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන/ දේශීය රාජ්‍ය නොවන සංවිධාන අතර, ආබාධිතත්ව ප්‍රතිපත්ති හා නීති පැනවීම සම්බන්ධයෙන් සංවිධානය කරන ලද ජාතික උපදේශන හා සංවාදයෙන් අනතුරුව, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අපරානුමත කිරීමට ශ්‍රී ලංකාවට හැකිවන පරිදි ආබාධිතත්ව නීති මාලාවන්ට ගෙන ආ යුතු සංශෝධන සම්බන්ධයෙන් පොදු එකඟතාවයකට එළඹීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහාය ඇතිව රැස්වීමක් සංවිධනය කිරීම. (2013)

iii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සඳහා මානව සම්පත් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම පිණිස උපදේශකයින් තෝරා ගෙන අවබෝධතා ගිවිසුම් අත්සන් තබා ඇත. උපදේශක කණ්ඩායම සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අතර සාකච්ඡා ගණනාවකින් පසු ප්‍රතිපත්ති කෙටුම්පත සම්පාදනය කෙරිණ.( 2013-2014)

iv) නීති නිලධාරීන් නොමැතිව කටයුතු කරනු ලබන මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාල (අනුරාධපුර, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර, කල්මුණේ, වවුනියාව) සඳහා නීති උපදේශක සේවා සැපයීමට ප්‍රාදේශීය කාර්යාල වඩා හොඳින් සංවිධානව ඇත.

v) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද අවශ්‍යතා ඇගයීමකින් පසු, ස්වකීය ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කර ගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාල, ප්‍රධාන කාර්යාලය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ජංගම කාර්යාල සඳහා තොරතුරු තාක්ෂණ උපකරණ සහ ලී බඩු සපයා ඇත. (2013)

vi) කිලිනොච්චි, මන්නාරම, මුලතිව් සහ පුත්තලම ජංගම කාර්යාල සහ සහායක මෙහෙයුම් ස්ථාපනය කිරීම මගින්, ස්වකීය ප්‍රාදේශීය කාර්යාල විසින් ආවරණය නොකෙරෙන ප්‍රදේශ සම්බන්ධ කර ගැනීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය වී ඇත. (2013)

vii) ක්‍රියාදාමය ආරම්භ කරමින් සහ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල අතර රැස්වීම් දෙකක් පැවැත්වීමට සහාය දීම මගින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ ත්‍රෛමාසික සමාලෝචන සහ ප්‍රගති මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට සහාය දීම. (2013)

viii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කොමසාරිස්වරුන්, ප්‍රධාන කාර්යාලීය කාර්ය මණ්ඩලය සහ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය අතර රැස්වීමක් මගින් 2014 ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. (2014)

ix) සමාජභාවී ප්‍රචණ්ඩත්ව පුහුණු අත්පොත යාවත්කාලීන කිරීම, පරිවර්තනය, තාක්ෂණික සමාලෝචනය සහ මුද්‍රණය සඳහා, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල හා එක්ව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සම්බන්ධීකරණ සහාය සපයා ඇත. (2014)

xi) සමාජභාවී ප්‍රචණ්ඩත්ව පුහුණු අත්පොත තාක්ෂණික සමලෝචනයට භාජනය කර යාවත්කාලීන කර, පරිවර්තනය කිරීමෙන් අනතුරුව මුද්‍රණය කර ඇත. (2016)

xii) ජනතාවට වැඩි වැඩියෙන් සමීපවීම සඳහා ස්ථාපිත කරන ලද ජංගම කාර්යාල මෙහෙයුම් සඳහා, ව්‍යාපෘති සහකාරවරුන් සේවයේ රඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහයෝගය දීම මගින් සහාය වී ඇත. (2014/2015/2016)

### 6.3.4. මානව හිමිකම් ගැටලු සහ උද්දේශයන් සොයාබලා හසුරුවීම සහ වාර්තාකරණයෙහිලා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම;

i) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, උතුරු, මධ්‍යම සහ වයඹ පළාත් සභා මැතිවරණ සමයේදී මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් සේවයේ යොදවන ලද රාජ්‍ය නිලධාරීන් සඳහා මැතිවරණ ක්‍රියාදාමය සම්බන්ධයෙන් මාර්ගෝපදේශන නිකුත් කිරීම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනෙකුත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමග පවත්වන ලද "මැතිවරණ අධීක්ෂණ මෙහෙයුම්" ඔස්සේ, මැතිවරණ අවකල් ක්‍රියාවන් අවම කිරීමට දායක වීම සඳහා ඡන්ද පොළවල් සහ ගණන් කිරීමේ මධ්‍යස්ථාන අහඹු ලෙස පරීක්ෂා කිරීම. (2013)

ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් බන්ධනාගාර වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශන ක්‍රියාත්මක වීම පිළිබඳව, පොලිස් ස්ථාන සහ බන්ධනාගාර වෙත කෙරෙන කලින් දැනුම්දීමකින් තොර පරීක්ෂණ චාරිකා සිදු කිරීම මගින් අධීක්ෂණය කිරීම. (2013)

iii) 2012 වාර්ෂික වාර්තාව පරිවර්තනය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදාහැරීම මගින් තොරතුරු ප්‍රචාරණය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහායවීම සහ වෙබ් අඩවිය නඩත්තු කිරීම පිණිස බාහිර සහාය සැපයීම. (2013)

iv) මානව හිමිකම් සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කොටසක් පමණක් සම්පාදනය කරන ලද අතුරුදහන් වූවන්ගේ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම පිණිස පොලිස් දෙපාර්තමේන්තුව සහ යුද හමුදාව සමග උපදේශනයන්ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහාය. (2013)

v) දේශපාලන පක්ෂ, මැතිවරණ කොමිෂන් සභාව, සිවිල් සමාජ පාර්ශ්වකරුවන් හා සමග පෘථුල උපදේශනයන් පවත්වීම සහ මැතිවරණ අධීක්ෂණය හරහා දකුණු, වයඹ සහ ඌව පළාත් සභා මැතිවරණ සමයේදී ප්‍රචණ්ඩත්වය සහ අවකල් ක්‍රියාවන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද දායකත්වය, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ස්වකීය නිල වාර්තාවෙහි ප්‍රශංසාවට ලක් කර ඇත. (2014)

vi) මැතිවරණ කොමිෂන් සභාව විසින් උපදෙස් මාලාවක් ලෙස මැතිවරණ රාජකාරිවල යෙදෙන නිලධාරීන්ට නිකුත් කරන ලද්දේ, පසුගිය පළාත් පාලන මැතිවරණ සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදුව, පසුව දකුණු, වයඹ සහ ඌව මැතිවරණවලදී කරන ලද නිරීක්ෂණයන් මත පදනම්ව සංශෝධනය කර, ව්‍යාපෘතියේ සහාය ඇතිව මුද්‍රණය කරන ලද **"**මැතිවරණ මාර්ගෝපදේශන**"** යයි. (2014)

vii) රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාකාරකම්වල / අකර්මණ්‍යතාවයන්ගේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ මැතිවරණ ආශ්‍රිත ගැටලු සමථයට පත් කිරීම සඳහා, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිල වශයෙන් පිළිගන්නා ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ද ආරාධනය කරන ලදී. (2014)

viii) මනෝ විද්‍යාඥයින්ගෙන් සහ සාමාජීය සත්කාරක ක්‍රියාකාරීන්ගෙන් සමන්විත උපදේශක කණ්ඩායමක් සමග, පළාත් පහක් ආවරණය වන පරිදි, නිදහස උල්ලංඝණය වූ ළමයින් වෙසෙන ආයතන 18ක් සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනය මත පදනම්ව, **නීති අර්බුදවල විපාකයක් ලෙස නිදහස අහිමිවූ දරුවන්ගේ තත්ත්වය මත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද නිර්දේශයන් සහිත අධ්‍යයන වාර්තාව.** (2016)

### 6.3.5: සිවිල් සමාජ සංවිධානයන් හා සමග ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගනුදෙනු වර්ධනය සඳහා ප්‍රාදේශීය සහ ජාතික යන දෙමට්ටමින්ම සහාය ලැබීම

i) මානව හිමිකම් ගැටලු වලට විසඳුම් සෙවීම මත සංවාද සහිතව සිවිල් සමාජ ක්‍රියාකාරීන් සඳහා/සමග පවත්වන ලද රැස්වීම්/පුහුණු කිරීම්/දැනුවත් කිරීමේ වැඩසටහන් 29ක්:

යාපනය - 2, කිලිනොච්චිය - 1, වවුනියාව - 1, මුලතිව් - 1, මන්නාරම - 1, අනුරාධපුරය - 2,

පොළොන්නරුව - 1 හිඟුරක්ගොඩ - 1, ත්‍රිකුණාමලය - 2, අම්පාර - 3, මහනුවර - 3,බදුල්ල - 3

කලමුණේ - 3, මඩකලපුව - 3, මානව අයිතිවාසිකම් මත තෙදින වැඩමුළුව හා සංවාදය - පුත්තලම -1 (2013)

ii) යාපනයේදී, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සාමාජිකයින් 148ක් භාෂා අයිතිවාසිකම් ආශ්‍රිත ගැටලු සාකච්ඡා කිරීමට සහ විසඳුම් සොයා පැමිණි අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැදහත්වී කටයුතු කරන ලදී. (2014)

iii) යාපනයේ, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සාමාජිකයින් 60කට භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩිදියුණු කළ දැනුම ලබා දෙන ලදී. (2014)

iv) සිවිල් සමාජ සාමාජිකයින් හා නිල දරන්නන් 80ක් අතර මානව හිමිකම් සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වා, දිස්ත්‍රික්කයේ ගැටලු විශාල සංඛ්‍යාවකට විසඳුම් ලබාදීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි. (2014)

v) කල්මුණේ සිවිල් සමාජ සාමාජිකයින් හා රාජ්‍ය නිලධාරීන් 125ක් එක් දින පුහුණු වැඩසටහනක් හරහා භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩිදියුණු වූ දැනුමක් ලැබූහ. (2014)

vi) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමාජභාවී පදනමින් වන ප්‍රචණ්ඩත්වය ගැන ක්‍රමික අන්තර්ක්‍රියා පද්ධතියක් සකස් කර ඇති අතර, කල්මුණේ සිවිල් සමාජ සාමාජිකයින් හා රාජ්‍ය නිලධාරීන් 120ක් ඒ ඔස්සේ ස්වකීය දැනුම වර්ධනය කර ගත් අතර, ආශ්‍රිත ගැටලු සාකච්ඡාවට භාජනය කළහ. (2014)

vii) බේරුවල සහ අළුත්ගම ජනවාර්ගික කොටස් අතර ඇතිවූ කළකෝලාහල වලින් පසුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, සිවිල් සමාජ සාමාජිකයින්, පොලිසිය, යුද හමුදාව, රජයේ සේවකයින් සහ මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වයෙන් කළුතර දිස්තික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද රැස්වීමක් හරහා ගැටලුවලට විසඳුම් සෙවීමට මුල පුරනු ලැබීය. සිවිල් සමාජ සාමාජිකයින්, ප්‍රජා නියෝජිතයින්, බෞද්ධ හා මුස්ලිම් ආගමික නායකයින් සහ පළාත් පාලන දේශපාලනඥයින්ගේ සහභාගිත්වයෙන් රැස්වීමක් බේරුවල/අළුත්ගම පැවැත්විණ. (2014)

viii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සාමාජිකයින් හා ආගමික නායකයින් 89ක් මානව අයිතිවාසිකම් පිළිබඳව වැඩිදියුණු වූ දැනුවත්කම ලබාගත් අතර, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ප්‍රදේශයේ ආරක්ෂාවට අදාළව සිවිල් සමාජ සාමාජිකයින්ගේ (විශේෂයෙන් ආගමික නායකයින්ගේ) වගකීම් සාකච්ඡා කළහ. (2014)

ix) වවුනියාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහසුකරණය කරන ලද පරිදි, සිවිල් සමාජ සාමාජිකයින් 90ක් මානව හිමිකම් ගැටලු නිරාකරණය කර ගන්නා අන්දම ගැන සාකච්ඡා කළහ. (2014)

x) නුවරඑළිය තරුණයින් 200ක් සහ බදුල්ල තරුණයින් 40ක් දෙදිනක නේවාසික පුහුණුවක් හරහා මානව අයිතිවාසිකම් පිළිබඳ ස්වකීය දැනුම වර්ධනය කර ගත්හ. (2014)

xi) වලපනේ පෙර පාසල් ගුරුවරු 125ක් එක් දින පුහුණු වැඩසටහනක් හරහා මානව අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් ගැන ස්වකීය දැනුම වර්ධනය කර ගත්හ. (2014)

xii) අම්පාර පෙර පාසල් ගුරුවරු 100ක් දෙදින නේවාසික පුහුණු වැඩසටහනක් සහ සාකච්ඡා මගින් මානව අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් ගැන වැඩිදියුණු වූ දැනුවත් බව ලබා ගත්හ. (2014)

xiii) පුත්තලම ආගමික නායකයින් හා කාන්තා නායිකාවන් 100ක් එක්දින පුහුණු වැඩමුළුවක් හරහා සමාජභාවී ප්‍රචණ්ඩත්වය ගැන ස්වකීය දැනුම වැඩි දියුණු කර ගත්හ. (2014)

xiv) බදුල්ලේ සිවිල් සමාජ සමාජිකයින්, රාජ්‍ය නිලධාරීන් හා මාධ්‍යවේදීන් 90ක් සම්ප්‍රතිකරණය හරහා ප්‍රදේශයේ ප්‍රධානතම මානව අයිතිවාසිකම් ගැටලු වලට විසඳුම් සොයා ගැනීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ සිවිල් සමාජ ඒකාබද්ධව සංවිධානය කරන ලද සාකච්ඡාවකට සහභාගී වූහ. (2014)

xv) පොළොන්නරුව ප්‍රදේශයේ ප්‍රධානතම මානව අයිතිවාසිකම් ගැටලු වලට විසඳුම් සොයා ගැනීම පිණිස සහ ගතයුතු ක්‍රියමාර්ග සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් දීම සඳහා රාජ්‍ය නිලධාරීන් හා මාධ්‍යවේදීන් 90ක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පහසුකරණයෙන් පවත්වන ලද ඒකාබද්ධ සාකච්ඡාවකට සහභාගී වූහ. (2014)

xvi) පොළොන්නරුවේ පොලිස් නිලධාරීන් 200ක්, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සාමාජිකයන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මැතිවරණ මාර්ගෝපදේශන සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි ලා ප්‍රගතිය සහ ප්‍රායෝගික අභියෝග සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ මැතිවරණ කොමසාරිස් ඒකාබද්ධව සංවිධානය කරන ලද සාකච්ඡාවකට සහභාගී වූහ.(2014)

xvii) ප්‍රාදේශීය මට්ටමින් (පොළොන්නරුව, බදුල්ල, මහනුවර) තෝරා ගන්නා ලද සිවිල් සමාජ ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයින් හා සමග පැවැත්වෙන සම්බන්ධීකරණ රැස්වීම් වලදී මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සිවිල් සමාජ හා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම සාකච්ඡා විය. (2014)

### 6.3.6. මානව හිමිකම් පදනම් කොටගත් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනයේ ප්‍රවර්ධනය උදෙසා නීති සම්පාදකයින්, රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සමග ක්‍රියා කිරීම.

අ) සාමාන්‍ය පාසල් විෂය මාලාවට මානව හිමිකම් අධ්‍යාපනය ඇතුළත් කිරීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන වෘත්තිකයින්ගේ සංගමය සමග ආරම්භ කරන ලද වැඩකටයුතු සම්පූර්ණ කිරීම පිණිස කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාදාමය ඔස්සේ, මානව හිමිකම් අධ්‍යාපනය පාසල් විෂය

මාලාවට ඇතුළත් කර ගැනීම පිණිස රජයේ පාර්ශ්වයන් සමග කටයුතු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් සහාය ලබා දෙන ලදී. (2013/2015)

ආ) අමාත්‍යාංශ ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩලයන්හි සාමාජිකයින් 25ක්, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහනක් හරහා මානව හිමිකම් සහ පරිපාලන නීති පිළිබඳ ස්වකීය දැනුම වර්ධනය කර ගනිමින් සිටිති. (2014)


ඇ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආබාධිතත්වයට අදාළ බහුවිධ පාර්ශ්වකරුවන් හා සමග උපදෙස් ලබාගැනීමේ සැලසුම්ගත ක්‍රියාකාරකම් මාලාවකට අනුගත වීම සහ 2016 දී පාර්ලිමේන්තුව විසින් පැනවීමට නියමිත අබාධිතත්ව පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ස්වකීය නිර්දේශයන් රජයට ඉදිරිපත් කිරීම අරමුණු කොට ගෙන, ආබාධිතත්වයට අදාළ ජාතික ප්‍රතිපත්ති සහ නීති මාලාවන් සකස් කිරීම, ඒවා අනුමත කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ස්ථීතිය, ආබාධිත්වයට අදාළ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ බාහිර උපදේශකයෙකු හරහා කාන්තාවන්ට එරෙහිව සෑම ආකාරයකම වෙනස්ව සැළකීම් මුලිනුපුටා දැමීමේ එක්සත් ජනපද ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ අපරානුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සහ එහි ඉදිරි ගමන්මග හුවා දක්වමින් සංක්ෂිප්ත උපදේශන ලේඛනයක් සම්පාදනය කිරීමේ කාර්යය සඳහා, 2015 වර්ෂයේදී ව්යාපෘතිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ස්වකීය සහාය ලබා දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ආබාධිතත්ව ප්‍රජාව, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ විද්වතුන් හා සමග උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාදාමයකින් පසු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කෙරෙන උපදෙස් සහ නිර්දේශයන් සහ යෝජනා කෙරෙන සංශෝධනයන් ජනාධිපතිතුමන්ට, අග්‍රාමාත්‍යතුමන්ට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත. (2016)

ඇ) මානව හිමිකම් සම්බන්ධයෙන් ස්වකීය දැනුම තවදුරටත් ශක්තිමත් කරලීමේ වැඩසටහනකට පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 29ක් සහභාගී වූ අතර, ශ්රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමියගේ සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කතානායකවරයාගේ සම සභාපතිත්වයෙන් නුවරඑළියේදී පවත්වන ලද නේවාසික අධ්‍යයන සම්මන්ත්‍රණයකට සහභාගීවීමෙන් පසු, විෂයය කෙරෙහි මෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා සමග අඛණ්ඩ සහයෝගිතාවක් පවත්වා ගෙන යාම කෙරෙහි ස්වකීය බලවත් උනන්දුව ප්‍රකාශ කර සිටියහ.(2016)

පළමුවන පරිච්ඡේදයේ ඇමුණුම්
ඇමුණුම් 1 ඒ

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාල නිරූපනය කෙරෙන ශ්‍රී ලංකා සිතියම**



## පළමුවන පරිච්ඡේදයේ ඇමුණුම්

## ඇමුණුම: 1 බී

### ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී වූ රැස්වීම් - 2015

| | දිනය | විස්තරය | ස්ථානය | සහභාගිත්වය | අරමුණ |
|---|---|---|---|---|---|
| 1 | 2015.01.27 | රොබට් සින්ක්ලෙයා මහතා කැනඩාවේ වි.ක., වෙළඳ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ/ දකුණු ආසියා | මා.හි.කො. | සභාපති, කොමසාරිස් ජෙසීමා ඉස්මායිල් මිය. සහ ටී. ඊ. ආනන්දරාජා මහතා | |
| 2 | 2015.01.30 | සර්ව පාක්ෂික පාර්ලිමේන්තු, කණ්ඩායමේ සමසභාපති, නේස්බි සාමිවරයා, අධි. නී.,සැන්ඩිහි බැරන්වරයා | මා.හි.කො. | සභාපති, ලේකම් | සුහද බැහැදැකීම |
| 3 | 2015.02.11 | ඇ. එ. ජා. සං. නි. | මා.හි.කො. | සභපති, කොමසාරිස්වරුන් හා ලේකම් | ශ්‍රී ලංකාවේ සංවර්ධන සන්දර්භ සමාලෝචනය සඳහා ඇගයීමක් |
| 4 | 2015.03.04 | රයිට්ස් නව් | යාපනය ප්‍රා.කා. | ප්‍රා. සම්බන්ධීකාරක සහ සහභාගීවන්නන් | ශ්‍රී ලං.මා.හ.කො.ස. කාර්යභාර්ය සහ ක්‍රියාකාරකම් |
| 5 | 2015.03.12 | පැෆ්රල් සංවිධානය | බණ්ඩාරනායක අනුස්මරණ ජා.ස.ශා. | ලේකම් අධ්‍යක්ෂ/ප.ප. (වැ.බ) | ශ්‍රී ලංකා පුරවැසියන් සමග පවත්වන ලද සංවාද මාලාවක් මත පදනම්ව ජනතාව නියෝජනය කිරීම සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීම |
| 6 | 2015.03.12 | නීති හා සමාජ භාරකාරය | හෙක්ටර් කොබ්බෑකඩුව ගො.ප.ආ. | ලේකම්, පර්යේෂණ නිලධාරි | අළුත්ගම කෝලාහලය සහ පශ්චාත් විපාක සම්බන්ධයෙන් ප්‍රසිද්ධ සාකච්ඡාව |
| 7 | 2015.03.16 | හෙල්වෙටාස් ස්විස් අන්තර් සහයෝගිතාව | ශ්‍රී ලං.මා.හි.කො.ස. | | |
| 8 | 2015.03.20 | සි.ඉ.ආ. | සි.ඉ.ආ. ශ්‍රවණාගාරය | ලේකම් සහ රෝෂිණී හෙට්ටිගේ මහත්මිය | “මානව හිමිකම් ඉතිහාසයේ සමකාලීන වාද විවාද” සම්මන්ත්‍රණය |
| 9 | 2014.03.27 | වාර්ෂික වාර්තාව වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කිරීම | | | |
| 10 | 2015.03.28 | වි.ප්‍ර.ම. | ජානකී හෝටලය | ලේකම් සහ රෝෂිණී හෙට්ටිගේ මහත්මිය | එච්අයිවී/ඒඩ්ස් හා ආශ්‍රිත ගැටලු පිළිබඳ නීතිමය හා ප්‍රතිපත්තිමය කාර්යරාමුව |
| 11 | 2014.04.07 | ජාතික කාන්තා කමිටුව | ශ්‍රී ල.පදනම්.ආ. | ලේකම් | ‘ලිංගික සම්බන්ධතා නීත්‍යානුකූල වයස් සීමාව’සාකච්ඡාව |
| 12 | 2015.04.24 | රොටරි සමාජය | | ව්‍යාපාරික ප්‍රජාව | ‘ යහ පාලනය’ |
| 13 | 2015.05.12 | පාසල් දැරියන් | මා.හි.කො. | ලේකම් | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | 2015.05.14 | මා.හි. අධ්‍යයන මධ්‍යස්ථානය | මා.හි.කො. | ලේකම් | |
| 15 | 2015.05.14 | යුරෝපා සංගමයේ නියෝජිත පිරිස | මා.හි.කො. | ලේකම්, කොමසාරිස් ජෙසීමා ඉස්මායිල් මිය. නීති උපදේශක, අ (ප. හා වි.) වැ.බ. | |
| 16 | 2015.05.15 | මා.හි. අධ්‍යයන මධ්‍යස්ථානය | නීති ආධාර කාර්යාලය | අ(පා. හා මු.) වැ.බ. | |
| 17 | 2015.05.21 | මාධ්‍ය පිරිස් සහ රාජ්‍ය නිලධාරීන් | මා.හි.කො. | සභාපති, කොමසාරිස්වරු, ලේකම්, නීති උපදේශක, මැ.කො. සහ මාධ්‍ය පිරිස් | මැතිවරණය - පොදු ස්ථාන අවභාවිතය |
| 18 | 2015.05.25 | හොල්සිම් ලංකා | මා.හි.කො. | අ(පා. හා මු.) වැ.බ. | ව්‍යාපාර ආශ්‍රිත මා.හි.බලපෑම |
| 19 | 2015.05.26 | ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා | සි.ඉ.ආ. | සුජීවා මිය කනගරාජ් මයා ශ්‍රියානි මිය. ශිරෝමි මිය. | 'පශ්චාත් යුද ප්‍රවණතා - ශ්‍රී ලංකාවේ ළමා විවාහ' |
| 20 | 2015.05.28 | මාධ්‍ය පිරිස් - මාධ්‍ය සාකච්ඡාව | මා.හි.කො. | සභාපති, කොමසාරිස්වරු, ලේකම්, නීති උපදේශක, මැ.කො. සහ මාධ්‍ය පිරිස් | මාධ්‍ය අවභාවිතය |
| 21 | 2015.06.12 | ඇ. එ. ජා. සං. නි. | මා.හි.කො. | සභාපති, කොමසාරිස් ආනන්දරාජා මහතා, ලේකම් | |
| 22 | 2015.06.19 | සමාජ සේවා දෙපා. | සෙත්සිරිපාය | ලේකම්, අ(මෙ. හා ප.)වැ.බ. | මෙත්සෙවන රැඳවුම් මධ්‍යස්ථානය |
| 23 | 2015.06.25 | පුරුෂ සමලිංගික හා සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් කෙරෙහි බලපෑම් ඇතිකරවන ගැටළු වැඩමුළුව | උපත්පාලන සංගම් ශ්‍රවණාගාරය | දිලිහි මිය. අහමඩ් මහතා නිහාල් මහතා නීති උපදේශක | |
| 24 | 2015.06.30 | මැ.කො. | මා.හි.කො. | සභාපති, ලේකම්, නීති උපදේශක | 2015 මහ මැතිවරණය |
| 25 | 2015.07.06 | මැ.කො., මාධ්‍ය අමාත්‍යවරයා, වි.සං.නි.කො.ස., මාධ්‍ය | මා.හි.කො. | සභාපති, කොමසාරිස් | මැතිවරණ සමයේ පෞද්ගලික මාධ්‍ය ගැන සාකච්ඡාව |
| 26 | 2015.07.22 | මානව හිමිකම් හා සංවර්ධන නීතිඥවරු | බණ්ඩාරනායක අනුස්මරණ ජා.ස.ශා. | ලේකම් | ළමා අයිතිවාසිකම් පාලනය පිළිබඳ ජාතික වැඩසටහන දියත් කිරීම |
| 27 | 2015.07.23 | රජයේ වෘත්තීය සමිති සමග පැෆ්රල් රැස්වීම | හෙක්ටර් කොබ්බෑකඩුව ගො.ප.ආ. | ලේකම් | පාර්ලිමේන්තු මැතිවරණ විකාශයේ වගකීම් සහ ප්‍රතිචාරය |
| 28 | 2015.07.24 | ජාතික වැටුප් කොමිෂන් සභාව | | ලේකම්, අ(ප.හා මු.) වැ.බ. කුමාරි මිය. | |
| 29 | 2015.07.27 | විගණකාධිපති දෙපා. | | ලේකම්, අ(ප.හා මු.) වැ.බ. කුමාරි මිය. | |
| 30 | 2015.07.27 | එ.ජ. රාජ්‍ය දෙපා. කාර්යාලය | මා.හි.කො. . | සභාපති, ජෙසීමා ඉස්මායිල් මිය, ලේකම්, නීති උපදේශක | නීතියේ ආධිපත්‍යය සහ දූෂණ විරෝධතා |
| 31 | 2015.07.30 | යුරෝපා සංගම් මැතිවරණ නිරීක්ෂකයෝ | මා.හි.කො. | සභාපති, ජෙසීමා ඉස්මායිල් මිය, නීති උපදේශක අ(මෙ.හා.ප.) වැ.බ. අ(අධ්‍යාපන) වැ.බ. | ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණ වලට අදාළ නීති ගැටලු |

| | | | | | |
|---|---|---|---|---|---|
| 32 | 2015.08.03 | පුවත්පත් සාකච්ඡාව | මා.හි.කො. | | |
| 33 | 2015.08.07 | යමක ප්‍රකාශන එළිදැක්වීම | බණ්ඩාරනායක අනුස්මරණ ජා.ස.ශා. | ලේකම් | |
| 34 | 2015.08.15 | යුරෝපා සංගම් මැතිවරණ නිරීක්ෂණ දූත පිරිස | ගලදාරි හෝටලය | ලේකම් | |
| 35 | 2015.08.18 | පැෆරල් රැස්වීම | ගලදාරි හෝටලය | කොමසාරිස් ජෙසීමා ඉස්මායිල් මිය, ලේකම්, අ(මෙ. හා ප.) වැ.බ. | මැතිවරණ ඇගයීම් |
| 36 | 2015.09.02 | ඉන්දියාවේ ජාතික ඩැලිට් කොමිෂන් සභාව සමග රැස්වීම | ශ්‍රී.ලං.මා.හි.කො.ස. | කොමසාරිස් ජෙසීමා ඉස්මායිල් මිය, ලේකම්, අ(මෙ. හා ප.) අ(ප. හා වි.) අ(පා. හා මු.) අ(අධ්‍යා. හා වි.වැ.) | |
| 37 | 2015.09.28 | ආචාර්ය පියසිරි වික්‍රමසේකර මහතා, ජා. කම්කරු සං. | ශ්‍රී ලං.මා.හි.කො.ස. | සභාපති, නීති උපදේශක, අ(බ. හා වි.) වැ.බ. අ(මෙ. හා ප.) වැ.බ. | |
| 38 | 2015.09.29 | ජීවිත හිමිකම | මහවැලි කේන්ද්‍රය | නිමල් පුංචිහේවා මහතා, නීති උපදේශක | |
| 39 | 2015.10.011 | ද.ආ.මැ.ක.සං. | ගලදාරි හෝටලය | සභාපති | |
| 40 | 2015.10.06 | ශ්‍රී ලංකාවේ, ආසියා-ශාන්තිකර පර්යේෂණ කොමිසම් දූතමණ්ඩලය | ශ්‍රී ලං.මා.හි.කො.ස. | සභාපති, කොමසාරිස් ජෙසීමා ඉස්මායිල් මිය, ලේකම්, එ.ජා.සං.වැ., අ(මෙ.හා ප.) වැ.බ., අ(පා.හා මු.) | |
| 41 | 22015.10.16 | ඇ.එ.ජ. තානාපති කාර්යාලය - දේශපාලන නිලධාරි | ශ්‍රී ලං.මා.හි.කො.ස. | සභාපති සහ ලේකම් | |
| 42 | 2015.10.20 | ලෝක සංඛ්‍යාලේඛන දිනය - 2015 | හිල්ටන් කලම්බු රෙසිඩන්සිස් | ලේකම් | |
| 43 | 2015.11.03 | ජෝන් වොච් මහතා ආචාර්ය චන්ද්‍රානි ලියනගේ මිය. | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස් අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 44 | 2015.11.06 | නව කොමිෂන් සභාවේ පුවත්පත් සාකච්ඡාව සහ සිවිල් සමාජ සමග රැස්වීම සමස්ත කාර්ය මණ්ඩලය සමග රැස්වීම | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්වරුන් | |
| 45 | 2015.11.13 | ප්‍රාදේශීය සම්බන්ධීකාරක රැස්වීම | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්වරුන්, ලේකම් සහ අධ්‍යක්ෂවරුන් | |
| 46 | 2015.11.17 | සුබිනෝ නැන්ඩි, නේවාසික සම්බන්ධීකාරක සහ ජෝන් සොරෙන්සන්, රාෂ්ට්‍ර අධ්‍යක්ෂ | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති කොමසාරිස්වරුන් | |
| 47 | 2015.11.17 | යුවරාජ් ජෝෂි මහතා හියුමන් රයිට්ස් වොච් | ශ්‍රී ලං.මා.හි.කො.ස | මේනකා හේරත් මිය, අ/අධ්‍යා. හා වි.වැ.) වැ.බ. කපිලාන් මහතා, අධ්‍යාපන නිලධාරි | |
| 48 | 2015.11.19 | ඉගෝර් වෙට්කොවිස්කි මහතා, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස්,අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 49 | 2015.11.23 | ඇ.එ. රාජ්‍ය දෙපා. ප්‍රජාතන්ත්‍රවාදය, | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අයිතිවාසිකම් හා කම්කරු කාර්යාංශය විසින් අනුග්‍රහය දැක්වූ ඇගයීම් නියෝජිත පිරිස | | | |
| 50 | | ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 51 | 2015.11.24 | සක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂාව - එ.ජා.කණ්ඩායම | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 52 | 2015.11.24 | ආචාර්ය පද්මිණී මෙන්ඩිස් මිය. | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස්,අම්බිකා සත්කුණනාදන් මිය. තනුජා නවරත්න මිය,එ.ජා.සං.වැ. | |
| 53 | 2015.11.24 | ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, අම්බිකා සත්කුණනාදන් මිය. සහ ආචාර්ය යු. විදානපතිරණ කොමසාරිස්වරුන් | |
| 54 | 2015.11.27 | මානව අයිතිවාසිකම් මහ කොම. කාර්යාලය | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 55 | 2015.11.27 | සක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරීමේ නීති සමාලෝචනය පිළිබඳ සාකච්ඡාව | විදේශ කටයුතු අමාත්‍යාංශය | ගසාලි හුසේන් මහතා, කොමසාරිස් | |
| 56 | 2015.12.01 | එක්.ජා. ව්‍යාපෘති රැස්වීම | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 57 | 2015.12.02 | කන්තා ජාතික කමිටුව | කැළණිය විශ්ව වි. | සභාපති | |
| 58 | 2015.12.03 | එ.ජා. ජොෂ්ඨ මා.හි. උපදේශක | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 59 | 2015.12.03 | එක්සත් අරාබි එමීර්.රා. 44 වන නිදහස් දිනය | කලම්බු හිල්ටන් | ගසාලි හුසේන් මහතා, කොමසාරිස් | |
| 60 | 2015.12.04 | හිංසන විරෝධ කමිටුවට ඉදිරිපත් කෙරෙන ශ්‍රී ලංකාවේ 5 වන සාමයික වාර්තාව සාකච්ඡා කිරීමේ රැස්වීම | වි.ක.අමාත්‍යාංශය | කපිලන් විල්ලවරාජන් මහතා, අධ්‍යාපන නිලධාරි | |
| 61 | 2015.12.07 | සරණාගත උපදේශක කණ්ඩයම | ශ්‍රී ලං.මා.හි.කො.ස | කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 62 | 2015.12.10 | පැතිකඩ | සිරස | ගසාලි හුසේන් මහතා, කොමසාරිස් | |
| | | නිව්ස්ලයින් | එම්ටීවී | කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| | | නිස්කලංක හතහමාර | ස්ව.රූ.සේ. | සභාපති | |
| | | නුගසෙවන | රූපවාහිණී | සභපති | |
| 63 | 2015.12.11 | ඉන්ටනැෂනල් ක්‍රයිසිස් කණ්ඩායම | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභපති | |
| 64 | 2015.12.11 | නීතියේ ආධිපත්‍යය ඒකකයේ එ.ජා. කණ්ඩයම | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 65 | 2015.12.16 හා 18 | යාපනයේ ක්ෂේත්‍ර චාරිකාව | | සභාපති, කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |
| 66 | 2015.12.21 | කාන්තාවන්ගේ සාමදූත මෙහෙවර | ශ්‍රී ලං.මා.හි.කො.ස | සභාපති, කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් මිය. | |

# පළමුවන පරිච්ඡේදයේ ඇමුණුම්
# ඇමුණුම් 1 සී - 2015 වසර සඳහා වියදම් ප්‍රකාශනය

2015 වසර සඳහා වියදම් ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

වියදම් ශීර්ෂය අංක: 013

| විෂය සංකේතය | විස්තරය | (1) අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදන | (2) පරිපූරක ප්‍රතිපාදන | (3) මු.රෙ. 66 මාරු කිරීම් | (4) මුළු ශුද්ධ ප්‍රතිපාදන (1+2+3) | (5) සමස්ත වියදම | (6) ශුද්ධ ඉතිරිය (අතිරික්ත) (4-5) | සමුච්චිත | ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. |
| | පුනරාවර්තන | | | | | | | | |
| | **පුද්ගලික පඩිනඩි** | | | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 45,500,000 | | | 45,500,000 | 4,320,034 | 4,179,966 | | 4,179,966 |
| 1002 | අතිකාල සහ විවේක දින වැටුප් | 2,000,000 | | | 2,000,000 | 1,365,400 | 634,600 | 93,226 | 541,374 |
| 1003 | වෙනත් දීමනා | 51,900,000 | | | 51,900,000 | 51,287,872 | 612,128 | 16,839 | 595,289 |
| | **ගමන් වියදම්** | | | | | | | | |
| 1101 | ගෘහස්ත | 800,000 | | | 800,000 | 611,035 | 188,965 | 38,682 | 150,284 |
| 1102 | විදේශීය | 1,100,000 | | | 1,100,000 | 433,441 | 666,559 | | 666,569 |
| | **සැපයුම්** | | | | | | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 2,000,000 | | | 2,000,000 | 1,330,218 | 669,782 | 9,501 | 660,281 |
| 1202 | ඉන්ධන | 3,700,000 | | | 3,700,000 | 2,800,734 | 899,266 | 44,117 | 855,149 |
| 1203 | පාරිභෝගික ද්‍රව්‍ය | 300,000 | | | 300,000 | 173,424 | 126,576 | | 126,576 |
| | **නඩත්තු වියදම්** | | | | | | | | |
| 1301 | වාහන | 2,600,000 | | | 2,600,000 | 2,007,897 | 592,103 | 50,110 | 541,993 |
| 1302 | යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800,000 | | | 800,000 | 581,584 | 218,416 | | 218,416 |
| 1303 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 150,000 | | | 150,000 | 23,850 | 126,150 | | 126,150 |
| | **සේවා** | | | | | | | | |
| 1401 | ප්‍රවාහන සහ වාහන කුලී | 3,250,000 | | -1,000,000 | 2,150,000 | 1,117,429 | 1,032,571 | 55,000 | 977,571 |
| 1402 | තැපැල් හා සංනිවේදන | 4,000,000 | | | 4,000,000 | 3,188,396 | 811,604 | 164,064 | 647,540 |
| 1403 | විදුලි බලය හා ජලය | 9,500,000 | | -880,000 | 8,620,000 | 7,538,935 | 1,081,065 | 603,366 | 477,699 |
| 1404 | කුලී හා දේශීය බදු (සටහන් 2) | 37,000,000 | | 880,000 | 37,880,000 | 37,878,389 | 1,611 | | 1,611 |
| 1405 | වෙනත් | 6,000,000 | | 600,000 | 6,600,000 | 6,231,132 | 368,868 | 221,231 | 147,637 |
| | **මාරු කිරීම්** | | | | | | | | |
| 1502 | විශ්‍රාම ප්‍රතිලාභ ( පාරිතෝෂික) | 1,350,000 | | 500,000 | 1,850,000 | 1,810,611 | 39,389 | | 39,989 |
| 1505 | දායක මුදල් සහ ගාස්තු | 250,000 | | | 250,000 | 207,348 | 42,652 | | 42,652 |
| | අනු එකතුව (පුනරාවර්තන) | **172,200,000** | **0** | **0** | **172,200,000** | **159,907,729** | **12,292,271** | **1,296,137** | **10,996,134** |
| | **ප්‍රාග්ධන** | | | | | | | | |
| | **ප්‍රාග්. වත්කම් පුනරු. හා වැඩි දියුණු කිරීම** | | | | | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 500,000 | | | 500,000 | 249,849 | 250,151 | | 250,151 |
| 2002 | යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 150,000 | | | 150,000 | 460 | 149,540 | | 149,540 |
| | **ප්‍රාග්. වත්කම් අත්පත් කර ගැනීම** | | | | | | | | |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 5,000,000 | | | 500,000,000 | 1,334,724 | 3,665,276 | | 3,665,276 |
| 2103 | යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 150,000 | | | 150,000 | 87,249 | 62,751 | | 62,751 |
| | **ධාරිතාවය ගොඩනැගීම** | | | | | | | | |
| 2401 | පුහුණු කිරීම් සහ ධාරිතා ගොඩනැගීම | 3,500,000 | | | 3,500,000 | 2,346,400 | 1,153,600 | | 1,153,600 |
| | **අනෙකුත් ප්‍රාග්ධන වියදම්** | | | | | | | | |
| 2502 | වෙනත් ආයෝජන | 5,000,000 | | | 5,000,000 | 4,712,018 | 287,982 | | 287,982 |
| | **මා.හි. කොමිෂන් සභාවට සහාය** | | | | | | | | |
| 2502 | | | | | | | | | |
| | අනු එකතුව(ප්‍රාග්ධන) | **14,300,000** | **0** | **0** | **14,300,000** | **8,730,700** | **5,569,300** | **0** | **5,569,300** |
| | | | | | | | | | |
| | මුළු එකතුව | **186,500,000** | **0** | **0** | **186,500,000** | **168,638,429** | **17,861,571** | **1,296,137** | **16,565,434** |
| | | | | | | | | | |

# 2 වන පරිච්ඡේදයේ ඇමුණුම්

## ඇමුණුම 2ඒ

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලය ලද පැමිණිලි - 2015**

| පැමිණිල්ලේ ස්වාභාවය | කලාපය | | | | | | | | | | | ප්‍රාදේශීය එකතුව | ප්‍ර. කා. | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චි උප කාර්යාලය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමළය | වවුනියාව | | | |
| පෞද්ගලිකනිදහස | 13 | 114 | 50 | 122 | 65 | 23 | 40 | 93 | 148 | 22 | 112 | 802 | 965 | 1,767 |
| හිංසනය(ශාරීරික හා මානසික) | 2 | 38 | - | 7 | 3 | 1 | - | 18 | 22 | 2 | 10 | 103 | 312 | 415 |
| හිරිහැර කිරීම් | | | | | | | | | | | | | | |
| සාමාන්‍ය හිරිහැර | 3 | 37 | 2 | 57 | 49 | 20 | 29 | 28 | - | 13 | 40 | 278 | 375 | 653 |
| ලිංගික හිරිහැර | - | - | - | - | - | | - | - | - | - | - | - | 4 | 4 |
| තර්ජන | - | - | 37 | - | - | | - | - | 64 | - | 27 | 128 | - | 128 |
| අපහාසාත්මකව සැලකීම | | | | | | | | | | | | - | | - |
| බලහත්කාර අත්ඩංගුවට ගැනීම්/රඳවා ගැනීම් | 8 | 36 | 11 | 48 | 7 | 2 | 8 | 42 | 57 | 6 | 18 | 243 | 247 | 490 |
| රැඳවීම් කොන්දේසි | - | - | - | - | - | - | - | - | - | - | - | - | 8 | 8 |
| අත්අඩංගුවේදී මරණය | - | 2 | - | - | - | | - | - | 1 | - | - | 3 | 4 | 7 |
| බලහත්කාරයෙන් හෝ අනිච්ඡානුගත අතුරුදහන්වීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පැහැරගැනීම් | - | - | - | - | - | | - | 1 | - | - | 1 | 2 | 2 | 4 |
| අධිකරණ - බාහ්‍ය ඝාතන | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පීඩාකාරී මරණ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| සිරකරුගේ හිමිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අතුරුදහන්වූවන් * | - | 1 | - | 10 | 6 | | 3 | 4 | 4 | 1 | 16 | 45 | 13 | 58 |
| වෙනත් සිවිල් හා දේශපාලනික හිමිකම් | - | - | - | - | - | - | - | 2 | - | - | - | 2 | 7 | 9 |
| අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස | - | - | - | - | - | | - | 1 | - | - | - | 1 | 3 | 4 |
| ඒකරාශීවීමේ නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| සාංගමික නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ආගමික නිදහස | - | - | - | - | - | | - | 1 | - | - | - | 1 | 4 | 5 |
| සංචලන නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| සේවා නියුක්තිය | 52 | 141 | 90 | 51 | 47 | 11 | 74 | 191 | 149 | 34 | 39 | 879 | 1,084 | 1,963 |
| අධ්‍යාපනය | 3 | 45 | 17 | 23 | 18 | 12 | 13 | 73 | 67 | 2 | 2 | 275 | 272 | 547 |
| රාජ්‍ය සුබසාධන සේවා | 18 | 15 | 2 | 29 | 65 | 7 | 18 | 18 | 10 | 2 | 10 | 194 | 30 | 224 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යටිතල උපයෝගිතා | 5 | 21 | 12 | 1 | - | - | 1 | 15 | 24 | - | 9 | 88 | 79 | 167 |
| ඡන්දය ලියාපදිංචිය පිළිබඳ පැමිණිලි | - | 4 | - | 2 | - | - | - | 1 | 2 | - | - | 9 | 25 | 34 |
| රාජ්‍ය ආයතන වල අක්‍රියත්වය පිළිබඳ පැමිණිලි | 6 | 119 | 18 | 136 | 74 | 8 | 48 | 204 | 46 | 52 | 37 | 748 | 644 | 1,392 |
| ළමා අයිතිවාසිකම් | - | 2 | - | 3 | 2 | - | 4 | 2 | 2 | - | 1 | 16 | 12 | 28 |
| වෙනස් වූ හැකියාවන් සහිතවූවන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2 | 2 |
| භාෂා හිමිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 3 | 3 |
| සංක්‍රමණ ශ්‍රමික හිමිකම් | - | 3 | - | 19 | - | - | 3 | 6 | 2 | - | - | 33 | 18 | 51 |
| ස්ත්‍රී /පුරුෂ සමලිංගික, ද්විලිංගික හා සංක්‍රාන්තික සමාජභාවී අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1 | 1 |
| සෞඛ්‍යය | 1 | 6 | 1 | 5 | 2 | 2 | 6 | 1 | 2 | 1 | - | 27 | 6 | 33 |
| ඉඩම් හා දේපළ හිමිකම් | 36 | 148 | 52 | 33 | 17 | 30 | 33 | 61 | 103 | 20 | 64 | 597 | 266 | 863 |
| අභ්‍යන්තරව අස්ථානගත වූවන් ආපසු පැමිණෙන සරණාගතයින් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පාරිසරික | 4 | 1 | - | 8 | 1 | - | 2 | 14 | 17 | 1 | 3 | 51 | 19 | 70 |
| පරිපාලන කරුණු | 3 | 23 | - | 1 | - | - | 3 | 29 | 61 | - | - | 120 | 54 | 174 |
| කාන්තා අයිතිවාසිකම් | - | - | - | - | - | - | 1 | - | - | - | - | 1 | - | 1 |
| වැඩිහිටි අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2 | 2 |
| කාර්යභාරයෙන් බාහිර/පිළිනොගත් | - | 11 | 31 | - | 24 | - | 4 | 168 | 17 | 17 | 7 | 279 | 1,235 | 1,514 |
| එකතුව | **242** | **653** | **273** | **433** | **315** | **93** | **250** | **878** | **650** | **151** | **284** | **4,222** | **4,724** | **8,946** |

ප්‍රභවය: ශ්‍රී ලං.මා.හි.කො. දත්ත මූල - 2015 සහ ශ්‍රී ලං.මා.හි.කො. ප්‍රාදේශීය මට්ටමේ වාර්ෂික වාර්තා - 2015

*පීඩාවට පත්වූ බව කියැවෙන වින්දිතයින් ඉච්ඡානුගතව අතුරුදහන් වූවන් බව (පවුල් ආරාවුල්, රහසේ පැනයාම්) හෝ රාජ්‍ය ආයතනවල සම්බන්ධතාවයක් නොමැති බව හෝ හෙළිදරව් වීම නිසා, මෙම ගණය යටතේ මුලින් භාර ගන්නා ලද පැමිණිලි, පසුව, ශ්‍රී ලං.මා.හි.කො. කාර්ය භාරය යටතේ නොගැනෙන කාරණා බවට තීරණය විය.

# ඇමුණුම 2බී

## ලද පැමිණිලිවල වර්ගය සහ ප්‍රභේදය අනුව පැමිණිලි සංහිතාව සහ පැමිණිලි වර්ග සහ සමස්ත පැමිණිලි සංඛ්‍යාවෙන් ප්‍රතිශතය - 2015

| පැමිණිලි වර්ගය | පැමිණිලි ප්‍රභේදය | ප්‍රාදේශීය කාර්යාල එකතුව | | ප්‍රධාන කාර්යාලය | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පෞද්ගලික නිදහස | බරපතළ වධහිංසා | 102 | 2.53 | 311 | 6.58 | 413 | 4.72 |
| | තර්ජනය | 128 | 3.18 | - | - | 128 | 1.46 |
| | මානසික හිරිහැර | 42 | 1.04 | - | - | 42 | 0.48 |
| | ලිංගික අතවර | - | - | 04 | 0.08 | 04 | 0.04 |
| | අතවර | 216 | 5.37 | 375 | 7.93 | 591 | 6.75 |
| | සිරභාරයට ගැනීම/රඳවාගැනීම | 241 | 5.99 | 247 | 5.22 | 488 | 5.57 |
| | රඳවාගැනීම් කොන්දේසි | - | - | 08 | 0.16 | 08 | 0.09 |
| | අත්අඩංගුවේදී මරණය | 03 | 0.07 | 04 | 0.08 | 07 | 0.08 |
| | අතරුදහන් පුද්ගලයන් | 45 | 1.11 | 13 | 0.27 | 58 | 0.66 |
| | පැහැරගැනීම් | 02 | 0.04 | 02 | 0.04 | 04 | 0.04 |
| | වෙඩි තැබීම | - | - | 01 | 0.02 | 01 | 0.01 |
| ක්‍රියා නොකිරීම පිළිබඳ පැමිණිලි | ක්‍රියා නොකිරීම පිළිබඳ පැමිණිලි | 740 | 18.39 | 644 | 13.62 | 1384 | 15.82 |
| සේවා නියුක්තිය | සේවා නියුක්තිය | 867 | 21.55 | 1084 | 22.94 | 1951 | 22.30 |
| අධ්‍යාපනය | අධ්‍යාපනය | 259 | 6.43 | 272 | 5.75 | 531 | 6.07 |
| සෞඛ්‍ය | සෞඛ්‍ය | 25 | 0.62 | 06 | 0.12 | 31 | 0.35 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | ඉඩම් හා දේපළ | 606 | 15.06 | 266 | 5.63 | 831 | 9.50 |
| සමාජ සේවා සහ රාජ්‍ය සුබසාධන | රාජ්‍ය සුබසාධන | 182 | 4.52 | 30 | 0.63 | 212 | 2.42 |
| යටිතල උපයෝගිතා | යටිතල උපයෝගිතා | 87 | 2.16 | 79 | 1.67 | 166 | 1.89 |
| පරිසරය | පරිසරය | 46 | 1.14 | 19 | 0.40 | 65 | 0.74 |
| භාෂණ නිදහස | භාෂණ නිදහස | 01 | 0.02 | 03 | 0.06 | 04 | 0.04 |
| මැතිවරණ සම්බන්ධ පැමිණිලි | මැතිවරණ සම්බන්ධ පැමිණිලි | 09 | 0.22 | 25 | 0.52 | 34 | 0.38 |
| ළමා අයිතිවාසිකම් | ළමා අයිතිවාසිකම් | 16 | 0.39 | 12 | 0.25 | 28 | 0.32 |
| කාන්තා අයිතිවාසිකම් | කාන්තා අයිතිවාසිකම් | 01 | 0.02 | - | - | 01 | 0.01 |
| ආබාධ සහිත පුද්ගල අයිතිවාසිකම් | ආබාධ සහිත පුද්ගල අයිතිවාසිකම් | - | - | 02 | 0.04 | 02 | 0.02 |
| වැඩිහිටි අයිතිවාසිකම් | වැඩිහිටි අයිතිවාසිකම් | - | - | 02 | 0.04 | 02 | 0.02 |
| භාෂා අයිතිවාසිකම් | භාෂා අයිතිවාසිකම් | - | - | 03 | 0.06 | 03 | 0.03 |
| ආගම් ඇදහීමේ නිදහස | ආගම් ඇදහීමේ නිදහස | 01 | 0.02 | 04 | 0.08 | 05 | 0.05 |
| සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් | සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් | 30 | 0.74 | 18 | 0.38 | 48 | 0.54 |
| විවිධ ලිංගික ප්‍රභේද (LGBT) අයිතිවාසිකම් | විවිධ ලිංගික ප්‍රභේද (LGBT) අයිතිවාසිකම් | - | - | 01 | 0.02 | 01 | 0.01 |
| පරිපාලන කරුණු | පරිපාලන කරුණු | 117 | 2.90 | 54 | 1.14 | 171 | 1.94 |
| වෙනත් | වෙනත් | 82 | 2.03 | - | - | 71 | 0.81 |
| වැඩිදුර තොරතුරු ලබා | වැඩිදුර තොරතුරු ලබා ගත යුතුව | - | - | 479 | 10.13 | 479 | 5.47 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ගත යුතුව ඇති පැමිණිලි | ඇති පැමිණිලි | | | | | | |
| මා.හි.කො. විෂය පථයෙන් බැහැර | | 222 | 5.51 | 756 | 16.00 | 978 | 11.18 |
| **ලත් පැමිණිලි එකතුව** | | **4022** | **100.0** | **4724** | **100.0** | **8746** | **100.0** |

**දෙවන පරිච්ඡේදයේ ඇමුණුම්**

**ඇමුණුම් 2සී**

පැමිණිලි අංක: එච්ආර්සී/4429/09 සහ එච්ආර්සී/1188/10

01. ශාස්ත්‍රපති පණ්ඩිත අතිපූජ්‍ය
ඉනාමළුවේ ශ්‍රී
සුමංගල මහානායක ස්ථවිර
රංගිරි දඹුල්ල රජ මහා විහාර
සංඝසභාව
දඹුල්ල

02. මුල්කිරිගල සිලාප්‍රිය මනින්ද්‍රා
සිල්මාතාව
සීලවතී අරාමය
ෆොන්සේකා පාර,
වලපොල,
මාතර

පෙත්සම්කරුවෝ

එරෙහිව:

01. ලේකම්,
බුද්ධ ශාසන
අමාත්‍යාංශය
115, විජේරාම මාවත,
කොළඹ 07

02. කොමසාරිස් ජෙනරාල්,
බෞද්ධ කටයුතු
දෙපාර්තමේන්තුව,
135, සදහම්පාය,
ධර්මපාල මාවත,
කොළඹ 07

වගඋත්තරකරුවන්

**හඳුන්වාදීම**

2015 වර්ෂයේ අගෝස්තු මාසයේ 05 වන දින

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් භික්ෂුණීන්ගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමක් කර ඇති බවටත් ; එනයින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 3 වන ඡේදයේ, 12(1) සහ 14 ව්‍යවස්ථා කඩ වී ඇති බවටත් සියම් නිකායේ, රන්ගිරි දඹුළු කාරක සංඝ සභාවේ මහානායක අතිපූජ්‍ය ඉනාමළුවේ ශ්‍රී සුමංගල ස්ථවිරයන් විසින් 2009.10.20 වන පැමිණිල්ලක් (යොමු අංක: එච්ආර්සී/449/09) ගොනු කර ඇත.

මුල්කිරිගල සිලාප්‍රිය මනින්ද්‍රා සිල්මාතාව විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කර ඇති අංක: 1188/10 දරණ පැමිණිල්ල අංක: එච්ආර්සී/4429/09 දරණ පැමිණිල්ලේ විෂය කාරණාවට අන්තර් සම්බන්ධතාවයක් ඇති හෙයින්, මෙම පැමිණිලි දෙක එක් වරම විභාග කිරීමට තීරණය විය.

**පෙත්සම්කරුවන්ගේ කරුණු**

බුද්ධාගම ගොඩනගා ඇත්තේ සිව් වැදෑරුම් පර්ෂද සංකල්පනාව, එනම් බුදුරජාණන් වහන්සේගේ අනුගාමිකයින් වන, භික්ඛු, භික්ඛුණී, උපාසක හා උපසිකාවන් මතය.

ආගමට සම්පතක් වෙමින්, ශ්‍රී ලංකා ඉතිහාසයෙහි භික්ෂුණී ශාසනය පැවැතියද, අනුරාධපුර රාජධානිය ආක්‍රමණිකයින් යටතට පත්වීමෙන් පසු, භික්ඛුණී ශාසනය තාවකාලිකව අක්‍රීය බවට පත්විය.

පූජ්‍ය ඉනාමළුවේ සුමංගල මහානායක හිමියෝ බොහෝ කාන්තාවන් පැවිදි කරවමින්, භික්ඛුණී ශාසනය යළිත් නගා සිටුවීමට පියවර ගත්හ.

පෙත්සම්කාර හිමියන් ස්වකීය අංක: එච්ආර්සී/4429/09 දරණ සිය පෙත්සමෙහි දන්වා සිටින්නේ, පැවිදි කිරීම පිළිගන්නා ලෙස කරන ලද ඉල්ලීම සහ භික්ෂුණීන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද කෙරෙහි කන්දීමක් සිදුවී නැති බවයි.

පෙත්සම්කාර හිමියෝ දිවුරුම් පෙත්සමක් මගින් දන්වා සිටින්නේ, රන්ගිරි දඹුල්ල රජ මහා විහාර සංඝ සභාව ලියාපදිංචි වූ හා පිළිගත් රජයේ ආගමික සංවිධානයක් වන අතර, සංඝ යන්නට භික්ෂූන් හා භික්ෂුණියන් යන දෙපළම අයත් වන බවයි.

ඔවුන් තවදුරටත් සඳහන් කර සිටින්නේ, ඔවුන්ගේ ආරාම ලියාපදිංචි කිරීමට ඉඩ නොදීමෙන් සහ ඔවුන්ගේ හැඳුනුම්පත් වල භික්ඛුණී යන්න සඳහන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් ඔවුන්ගේ සිවිල් හා ආගමික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවයි. දිවයිනෙහි භික්ෂුණීන් 2500ක් පමණ සිටින අතර භික්ඛුණී ආරාම 450ක් පමණ තිබෙන බවත්, භික්ෂූන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිගන්නා අතර, භික්ෂුණීන්ගේ එම අයිතිවාසිකම් හා වරප්‍රසාද අහිමි කිරීමෙන්, වගඋත්තරකරුවන් විසින් සාධාරණත්වයේ නීතියට විරුද්ධව කටයුතු කර ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ වී ඇත.

පෙත්සම්කාර හිමියෝ තවදුරටත් දන්වා සිටින්නේ, රන්ගිරි දඹුල්ල රජ මහා විහාර සංඝ සභාව යටතේ භික්ඛුණී ආරාම ගණනාවක් ඇති අතර, ඒවා ලියපදිංචි කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවයි.

අංක: එච්ආර්සී/1188/10 දරණ පෙත්සම යටතේ, භික්ෂුණීන් හා භික්ෂුණී ආරාමයන් පිළිගැනීම ගැන තමන්ගේ විරුද්ධත්වය පෙන්වා දෙන මුල්කිරිගල, සීලප්‍රිය මනින්ද්‍රා සිල්මාතාව, ඔවුන් සමහර අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ අදහනු ලබන ථේරවාද සම්ප්‍රදායට අනුගත නොවන බවද පෙන්වා දෙති.

**වගඋත්තරකරුවන්ගේ කරුණු**

බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා විසින් ඉදරිපත් කර ඇති 2010 පෙබරවාරි මස 24 දින දරණ වාර්තාව අනුව, ඔහු කටයුතු කරනු ලබන්නේ 1931 අංක 19 දරණ බෞද්ධ විහාර හා දේවාලගම් පනතට අනුව බවත්, එහි භික්ෂුණීන් ගැන සඳහනක් නොමැති බවත්, එකී ආඥා පනතෙහි එවැනි

සඳහනක් නොමැති හෙයින්,පෙත්සම්කරුවන්ගේ ඉල්ලීමට තමන්ට එකඟ විය නොහැකි බවත්ය. මෙම කාරණය සම්බන්ධයෙන් අතිපූජ්‍ය මහානායක හිමිවරුන් නොවිමසා, තමන්ට නිදහසේ තීරණයක් ගැනීමට නොහැකි බව ද ඔහු සඳහන් කර ඇත.

භික්ෂුණී ශාසනය යළි ස්ථාපිත කිරීම බුද්ධ ශාසනයේ ථේරවාද සම්ප්‍රදායේ වර්ධනයට හා පාලනයට බාධාවක් වන බව වගඋත්තරකරුවන්ගේ මතය වේ. වගඋත්තරකරුවන් විසින් මතු කර ඇති තවත් වැදගත් සාධකයක් වන්නේ මෙසේ පැවිදි බව ලබා ගත් සමහර දෙනෙකු ඔවුන් වෙත සපයෙන විදේශීය දිරිදීමනා නිසා හිතුවක්කාර අන්දමට කටයුතු කරන බවයි.

<u>කොමිෂන් සභාවෙහි නිගමනයන්</u>

1. අංක: **එච්ආර්සී/449/09** හා අංක: **එච්ආර්සී /1188/10** දරණ පැමිණිලි දෙකෙහිම දක්වා ඇති කරුණු එක්ව සැළකිල්ලට ගන්නා ලදී.

2. අංක: **එච්ආර්සී/449/09** පැමිණිල්ලෙහි, අතිපූජ්‍ය ඉනාමළුවේ ශ්‍රී සුමංගල ස්ථවිරයන් විසින් කරුණු ඉදිරිපත්කර ඇත්තේ, අතීතයේදී නිකුත්කර ඇති අධ්‍යාපන සහතික වැනි අධිසංඛ්‍යාත ලේඛන වල දකින්නට ඇති පරිදි සහ වෙනත් ලේඛන වල නායක ස්ථවිරයන් වහන්සේලා විසින් භික්ඛුණී යන නාමය සඳහන් කර ඇති පරිදි, භික්ඛුණී යන්න මෙරට පිළිගත් ව්‍යවහාර නාමයක් බවයි.

3. භික්ෂුණී ශාසනය තාවකාලිකව අත්හිටුවන ලද්දේ වී නමුදු, 1998 වසරේදී පමණ එය පැහැදිලිවම යළිත් ස්ථාපිත කර ඇති අතර, දැනට භික්ෂුණීන් 2500කට වැඩි සංඛ්‍යාවක් ද, භික්ෂුණී ආරාම 450ක් ද ඇති අතර, භික්ෂුණීන් 600කට වැඩි සංඛ්‍යාවක් උපසම්පදාව ලබා ඇත.

4. භික්ෂුණී හැඳුනුම්පත් නිකුත් කිරීමෙන් වළකින ලෙස, බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලිඛිත උපදෙස් නිකුත් කර ඇත. තවද, භික්ෂුණී ආරාම ලියාපදිංචි කිරීම ද ඔහු විසින් ප්‍රතික්ෂේප කර ඇත.

5. ශ්‍රී ලංකාවේ ත්‍රිවිධාකාර ප්‍රජාවන් 31ක් සිටින අතර, මහා නායක හිමිවරු 31ක් ද සිටිති. ජාතික වැදගත්කමකින් යුත් මෙම ප්‍රශ්නය සමථයකට පත්කිරීම සඳහා වගඋත්තකරුවන් විසින් උපදෙස් පතා ඇත්තේ මහනායකවරුන් සිව් දෙනෙකුගෙන් පමණකි.

6. භික්ෂුණීන් පැවිදි කරවීමේ අවශ්‍යතාවය බරපතල විරුද්ධතාවයන් මැද කරෙන දීර්ඝකාලීන අරගලයකි.

7. **අංක: 1188/10 දරණ පැමිණිල්ල**ට අනුව, භික්ෂුණී ශාසනය පිළිගත යුතු බවට එකඟ වී ඇති පාර්ශ්වයන් සිල් මාතාවන්ට ද භික්ෂුණී ශාසනයට ඇතුළත්විය හැකි බවත්, එවිට ඔවුන්ට ද ආගමෙහි කාන්තාවකට ලැබිය හැකි උසස්ම තත්ත්වයට පත්විය හැකි බවත් සිල් මාතාවන්ට දන්වා ඇති නමුදු, භික්ෂුණී ප්‍රජාව පවත්වා ගෙන යාම ගැන ඔවුහු අකමැති වෙති.

8. භික්ෂුණීන් හා සිල් මාතාවන් සම්බන්ධයෙන් තීරණයකට එළඹීම සඳහා වගඋත්තරකරුවන් හා සමග කටයුතු කිරීමට යෝග්‍ය ආගමික මණ්ඩලයක්/කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.

9. පෙත්සම්කරුවන්ගේ අයැදුම නිෂ්ප්‍රභා කරන ලෙස අස්ගිරි මහා නායක, රාමඤ්ඤ නිකායේ මහනායක, මල්වතු මහානායක ස්වාමීන් වහන්සේලා මානව හිමිකම් කොමිෂන් සභාවට ලිඛිතව ප්‍රකාශ කර ඇත. ඔවුන්ගේ මතය වන්නේ ශ්‍රී ලංකාව ථේරවාද සම්ප්‍රදායේ රටක් බවත්, භික්ෂුණී සම්ප්‍රදාය යළිත් හඳුන්වා දීම පිළිගත නොහැකි බවත්ය. එයට අමතරව, ජාතික යහපතක් සේ සළකා, ථේරවාද සම්ප්‍රදාය ආරක්ෂා කිරීමට රාජ්‍ය නායකයින් බැඳී ඇත.

10. සියලු නායකයින් විසින් බුද්ධාගම රාජ්‍ය ආගම සේ පිළිගෙන, එය ආරක්ෂා කර ඇත. එමනිසා, භික්ෂුණී ක්‍රමයට අදාළ කරුණු තීරණය කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු වේ.

11. ඉතිහාසය පුරා නිරීක්ෂණය වී ඇත්තේ, කාන්තාවන් පැවිදි වී ඇති බවත්, හැකි ඉහළම ආගමික තත්ත්වයට ඔවුන් පත්වී ඇති බවත්ය.

12. වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති 2002 වර්ෂයේ බුද්ධ ශාසන ජනාධිපති කමිටු වාර්තාවේ, සිල් මාතාවන් වෙනුවෙන් විධිවිධාන සලසා ඇත. කෙසේවුවද, භික්ෂුණීන් සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැන සඳහනක් නැත.

13. **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ** වගන්ති සහ ආගම හා කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් සඳහා විධිවිධාන සලසා ඇති **මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය** ද සැළකිල්ලට ගනිමින් මෙම කාරණය ගැන සොයා බලන බව දෙපාර්ශවයටම දන්වන ලදී.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ**

1. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II පරිච්ඡේදයේ 9 වන ව්‍යවස්ථාව සහ 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේපළ සහ දේවාල ගම් පනත** අනුව, සියල්ලෝම බුද්ධ ශාසනය ආරක්ෂා කර පෝෂණය කිරීම සඳහා එක හා සමානවම බැඳී සිටිති.

2. තවද, **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව** අනුව, තම අභිමතය පරිදි ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස තහවුරු කර ඇත.

3. මෙයටත් අතිරේකව, **12(1) හා 12(2)**ට අනුව, සියල්ලන්ම නීතිය ඉදිරියේ එක සමාන වන අතර, යමෙකුගේ ස්ත්‍රී පුරුෂ භාවය නිසා වෙනස්ව සැළකීමකට භාජනය නොවිය යුත්තේය.

4. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(ඉ) ව්‍යවස්ථාව** තවදුරටත් සඳහන් කරන්නේ, සෑම කෙනෙකුටම තම ආගම හෝ විශ්වාසය ඇදහීමේ, පිළිපැදීමේ, ප්‍රගුණ කිරීමේ හෝ ඉගැන්වීමේ නිදහස තිබිය යුතු බවය.

5. මෙම ආරාවුල සමථයට පත් කිරීමෙහි ලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මෙම ව්‍යවස්ථා පිළිපැදීමට වගඋත්තරකරුවන් බැඳී සිටින බව කොමිෂන් සභාව සැළකිල්ලට ගනී.

6. ශ්‍රී ලාංකීය කාන්තා ප්‍රඥප්තියෙහි 14 වන කොටස අනුව "ලිංගභේදය මත පිහිටා පහත් හෝ උසස් වීමේ අදහස මත පදනම් වූ පක්ෂපාතකම, ව්‍යවහාරික සහ අනෙකුත් සියලු ප්‍රගුණකිරීම් සහ මිනිසුන් සහ ගැහැණුන් සඳහා වෙනස් නොවන ඒකීය භූමිකා අත්හැර දැමීම මුදුන්පත්

කර ගැනීමේ අරමුණින් සාමාජීය හා සංස්කෘතික ආකල්පයන් ප්‍රවර්ධනයට රජය විසින් යෝග්‍ය පියවර ගත යුතුය.''

7. ජාතික නීති සහ පරිපාලනමය ව්‍යවහාරයන් ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන් හා ප්‍රමිතීන්ට අනුකූල බවට සහතික වීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම කොමිෂන් සභාවෙහි කාර්ය භාරයන්ගෙන් එකක් බව **1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 10 වන ඡේදයේ** දැක්වෙයි.

8. කාන්තාවන්ට විරුද්ධව ඇති සියලු ආකාරයේ වෙනස්ව සැළකීම් මුලිනුපුටා දැමීමේ ප්‍රඥප්තිය ඇතුළු ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති කිහිපයක් සැළකිල්ලට ගැනීමෙන් මානව හිමිකම් කොමිෂන් සභාව ස්වකීය නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි.

**නිර්දේශ**

1. රංගිරි දඹුල්ල රජමහා විහාර සංඝ සභාවේ අයදුම්පතෙහි විෂය කාරණය සම්බන්ධයෙන් විධිමත් පියවර හෝ විධිමත් යාන්ත්‍රණයක් නොගැනීමෙන් සහ මිත්‍රශීලීව සමථයට පත්වීම සඳහා ගැඹුරු සාකච්ඡාවක් පැවැත්වීම සඳහා කමිටුවක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම මගින් පූජ්‍ය, අදාළ හා බලයලත් පිරිස්වල සහභාගිත්වය නොමැතිව, එය එකහෙළා ප්‍රතික්ෂේප කිරීමෙන්, වගඋත්තරකරුවන් විසින් ශ්‍රී ලංකා **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ව්‍යවස්ථා 12 (1 සහ 2) සහ 14** උල්ලංඝණය කර ඇත.

2. ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවෙහි ප්‍රකාශයට පත් කර ඇති කාරණය, එනම් බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය පියවර ගන්නා ලෙස වගඋත්තරකරුවන්ට උපදෙස් දෙනු ලැබේ. මෙම උද්දේශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් හා ගිහියන්ගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත් කරන ලෙස සහ අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරන ලෙස ද ඔවුන්ට තවදුරටත් උපදෙස් දෙනු ලැබේ.

3. යම් යම් ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙස රටෙහි නීතිය සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර ප්‍රඥප්තීන් උල්ලංඝණය වී ඇති බව නිරීක්ෂණය කළ හැකි බැවින්, සංවාද ඔස්සේ විසඳිය යුතු, මෙම රටෙහි ආගමික කටයුතු සම්බන්ධයෙන් සෘජුව මැදිහත් නොවීමට මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කරනු ලබයි.

සභාපති
ශ්‍රී ලං.මා.හි.කො.ස.

කොමසාරිස්
ශ්‍රී ලං.මා.හි.කො.ස

## ඇමුණුම් 2ඩී

පැමිණිලි අංක: එච්ආර්සී/630/15/1-14

ඒ. කේ. ඩී. සී. සුභාෂිණී
9/1, ගෝමස් පාත්,
බම්බලපිටිය
කොළඹ 05

පෙත්සම්කරු

එදිරිව

විදුහල්පතිනි
විශාඛා විද්‍යාලය
වජිර පාර
කොළඹ 05

වගඋත්තරකාරිය

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය 2015 පෙබරවාරි මස 23 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරිපිට මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ, වෙනස් වූ හැකියාවන් ඇති තම දරුවා විශාඛා විද්‍යාලයේ 8 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන බවයි.

ස්වකීය ශාරීරික තත්ත්වය නිසා ඇයට පඩි පෙළෙහි නැගීමට නොහැකි බව ඇය කියා සිටී. 8 වන ශ්‍රේණිය තුන්වන මහලේ ස්ථාපිත කර ඇති අතර, තම දරුවාට එහි ප්‍රවේශ වීම දුෂ්කරය. දරුවා සීඝ්‍රයෙන් වැඩෙන නිසා ඇයගේ බර වැඩි හෙයින්, මවට ඇය 3 වන මහලට රැගෙන යාම ද කළ නොහැකිය.

පෙත්සම්කාරිය සඳහන් කරන්නේ තමා මෙම ගැටලුව කිහිපවතාවක්ම විදුහලේ විදුහල්පතිනියට ඉදිරිපත් කළද, තම දියණියට අධ්‍යාපනය කර ගෙනයාමට හැකි වන පරිදි, බිම් මහලෙහි පන්තියක් ආරම්භ කිරීමට කිසිම පියවරක් ගෙන නොමැති බවයි.

කොමිෂන් සභාව 2015 අප්‍රියෙල් මස 21 වන දින මෙම පැමිණිල්ල විභාග කරන ලදී.

පරීක්ෂණයේදී ද පැමිණිලිකාරිය මෙම ගැටලුව ඉදිරිපත් කරන ලදී.

වගඋත්තරකරිය විසින් මේ සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම එකී දරුවාගේ අධ්‍යාපන අයිතිවාසිකම බරපතල ලෙස උල්ලංඝණය වීමක් බව නිගමනය කළ කොමිෂන් සභාව, දරුවාට ප්‍රශ්නයකින් තොරව සිය අධ්‍යාපනය කර ගෙන යාමට හැකි වන පරිදි, බිම් මහලේ 8 වන ශ්‍රේණියේ පන්ති කාමරයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස වගඋත්තරකාරියට නියම කරන ලදී.

කොමිෂන් සභාව විසින් නියම කරන ලද පරිදි, වගඋත්තරකාරිය දරවාට සහනයක් ලබා දීමට පියවර ගෙන ඇති බවත්, ඇය දැන් පාසලට යමින් සිය අධ්‍යාපන කටයුතු කර ගෙන යන බවත් කොමිෂන් සභාවට දැනගන්නට ලැබී ඇත.

## ඇමුණුම් 2ඊ

**2015 ඔක්තෝබර් මස 29 වන දින පොලිස් බලකාය විසින් ගිණුම්කරණ උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍යයින්ට පහර දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්තාව**

01. "ජාතික බලය"
47/ඒ, පළමුවන පටුමග
රාවතාවත්ත
මොරටුව

02. ලහිරු වීරසේකර සහ අනෙකුත් අය
කොත්මලේ පාර
මාවතුර
ගම්පොළ

**පෙත්සම්කරුවෝ**

එදිරිව

01. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01

02. පූජිත ජයසුන්දර
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
(බස්නාහිර පළාත භාර)
පොලිස් මූලස්ථානය
කොළඹ 01

03. ගාමිණී මතුරට
ජ්‍යෙ. පොලිස්පති
(කොළඹ භාර)
331, ඔල්කොට් මාවත
කොළඹ 01

04. චම්පික සිරිවර්ධන
ජ්‍යෙ. පො. අ. (මධ්‍යම)
පොලිස් මූලස්ථානය
කොළඹ 01

05. පාලිත පනාමල්දෙනිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

06. පොලිස් ස්ථානාධිපති
පොලිස් ස්ථානය
පිටකොටුව

07. පොලිස් ස්ථානාධිපති
පොලිස් ස්ථානය
කොටුව

08. පොලිස් ස්ථානාධිපති
පොලිස් ස්ථානය
මරදාන

09. ස්ථානාධිපති
පොලිස් ස්ථානය
දෙමටගොඩ

10. ස්ථානාධිපති
පොලිස් ස්ථානය
බොරැල්ල

11. ස්ථානාධිපති
පොලිස් ස්ථානය
කුරුඳුවත්ත

12. ලේකම්
උසස් අධ්‍යාපන හා මහාමාර්ග
අමාත්‍යාංශය
වෝඩ් පෙදෙස
කොළඹ 07

**වගඋත්තරකරුවන්**

2015 දෙසැම්බර් මස 04 වන දින

ගිණුම්කරණය ජාතික උසස් ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයින් විසින් දියත් කරන ලද වර්ජනය සහ පොලිස් දෙපාර්තමේන්තුව විසින් එම ශිෂ්‍යයින්ට පහරදීම සම්බන්ධයෙන් ස්වයංනිර්ණයට (suo moto) අනුව කටයුතු කිරීමෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් පනතේ 14 වන කොටසින් තමා වෙත පැවරී ඇති බලතල භාවිතා කරන ලදී. මේ අතරතුර, මෙම කාරණයට අදාළව ජාතික බලය සංවිධානය විසින් අංක: එච්ආර්සී/3824/15 දරණ පැමිණිල්ල ද, ගිණුම්කරණ ජාතික උසස් ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයින් විසින් අංක: එච්ආර්සී/3827/14 දරණ පැමිණිල්ල ද ගොනු කරන ලදී.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන ලද පරීක්ෂණවලට තදනන්තරව, මෙම පැමිණිල්ලට අදාළ පාර්ශ්වයන්ට 2015/11/03 සිට 2015/11/05 දක්වා කාලය තුළ සිතාසි නිකුත් කිරීමට නියමිතව තිබුණි. මෙම ගැටලුවට අදාළව වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත ප්‍රකාශයන් කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලදී.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම වාර්තාව පිළියෙළ කිරීමේදී, සියලුම පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත ප්‍රකාශ, මාධ්‍ය වාර්තා, වෛද්‍ය නීති වාර්තා, පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද වීඩියෝ පට, අනවසර රංචුගැසීම් විසුරුවා හැරීමට අදාළ නීති හා කොන්දේසි සහ ජාත්‍යන්තර ප්‍රඥප්ති යන සියල්ල සැළකිල්ලට ගන්නා ලදී.

## 1. පළමුවන පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු

මෙම කාරණයට අදාළ ලිඛිත සහ වාචික පැමිණිලි ඉදිරිපත්ව ඇති අතර, මුල් වාර්තාවේ (ඇමුණුම් 1) දක්වා ඇති සහනය ලෙස, කරන ලදැයි කියන මෙම හිතුවක්කාර කුරිරු පහර දීමට වගකිව යුතු පොලිස් නිලධාරීන්ට විරුද්ධව විනය පියවර ගන්නා ලෙස එමගින් ඉල්ලා ඇත. සියලුම පාර්ශ්වයන් කැඳවමින්, 2015.11.05 වන දින පවත්වන ලද පරීක්ෂණය ප්‍රකාර, 1 වන පැමිණිල්ලේ පෙත්සම්කරු සඳහන් කරනු ලබන්නේ කඳුළු ගෑස් හෝ ජල ප්‍රහාර භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ප්‍රතික්ෂේප කිරීමක් නොමැති නමුත්, පොලිස් නිලධාරීන්ගේ දරදඬු හිතුවක්කාර ක්‍රියා සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවයි.

## 2. දෙවන පෙත්සම්කරු (ශිෂ්‍යයින්) ඉදිරිපත් කරන ලද කරුණු

ස්වකීය දුක්ගැනවිලි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා සමග ඍජු සාකච්ඡාවක් පැවැත්වීම් අරමුණින්, ගිණුම්කරණ ජාතික උසස් ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයින් 1500ක් පමණ, කොටුවේ දුම්රිය ස්ථානයේ සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය කරා සාමකාමී පාගමනක නිරත වූහ. ඔවුන්ගේ ගමන වළක්වමින් පොලිසිය විසින් මාර්ගයේ ස්ථානගත කර තිබූ මාර්ග බාධක ශිෂ්‍යයින්ට හමුවිය. අමාත්‍යවරයා හමුවීමේ අදහස පෙරදැරිව, තමන්ගේ අරමුණ පොලිස් නිලධාරීන්ට දැන්වීමෙන් අනතුරුව, ඔවුහු සාමකාමීව මාර්ග බාධක අසළට ඒකරාශී වීම අඛණ්ඩව කරගෙන ගොස් ඇත.

මේ අවස්ථාවේදී මෙහි පැමිණි වෙනත් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් පිරිස විසුරුවා හැරීමට කටයුතු කර ඇත. ශිෂ්‍යයින්ට අමාත්‍යවරයා හමුවීමට නොහැකි බවත්, මෙම පරිශ්‍රයෙන් ඉවත් වීම ඔවුන් ප්‍රතික්ෂේප කරන්නේ නම් තමන් බලය භාවිතා කරන බවත් පොලිසිය විසින් නිවේදනය කර ඇත. තමන්ට අමාත්‍යවරයා හමුවීමට අවශ්‍ය බව ශිෂ්‍යයින් තරයේ ඉල්ලා සිටින ලද අතර, කිසිම දැනුම් දීමකින් තොරව කඳුළු ගෑස් සහ ජලප්‍රහාර ඔවුන් වෙත එල්ල විය. මේ අවස්ථාවේදී, ශිෂ්‍යයින් කඳුළු ගෑස් එල්ලවීම නිසා තම ඇස් සෝදමින් සිටින විට, 200ක පමණ පොලිස් නිලධාරීහු බැටන් පොළු වලින් පහර දීම ආරම්භ කළහ. සමහර ශිෂ්‍යයින්ට නොකඩවා පහර දෙන ලදී. ශිෂ්‍යයින් 30ක් පමණ බරපතල ලෙස පහරදීම් වලට ලක් වූහ. ඇපමත මුදා හැරීමට පෙර, ශිෂ්‍යයන් 39ක් පමණ නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගනු ලැබූහ.

ශිෂ්‍යයින්ට කෲර ලෙස පහරදීම, හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීම සහ පොලිසිය විසින් සිවිල් උද්ඝෝෂණ පාලනය කිරීම සහ අදහස් ප්‍රකාශ කිරීමේ හා සාමකාමීව එක්රැස්වීමේ නිදහස සීමා කිරීම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමකට මග පැදිණ. (මුල් වාර්තාවේ සඳහන් ඇමුණුම් 2)

තවදුරටත් සඳහන් වූයේ, අදාළ නිලධාරීන් හමුවීමට, කලින් දින වෙන්කර ගැනීමක් හෝ අවසරය ලබා ගැනීමක් කල්තියා සිදුකර නොමැති බවයි. (මුල් වාර්තාවේ සඳහන් ඇමුණුම් 2)

## 3. පෙත්සම්කරුවන්ගේ පැමිණිලි සනාථ කිරීමේ සහයෝගී සාක්ෂි

### 3.1 වෛද්‍ය නීති වාර්තා

පහරදීමේ ප්‍රතිඵලයක් ලෙස ආරෝග්‍ය ශාලාවට ඇතුළත් කරන ලද ශිෂ්‍යයින්ට අදාළ වෛද්‍ය නීති වාර්තා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කැඳවන ලදී. රෝගීන්ගේ කෙටි විස්තරයක් සහිත වාර්තාවේ සාරාංශය මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරිණ. (මුල් ලේඛනයේ ඇමුණුම 4)

පහත දැක්වෙන විස්තර වෛද්‍ය නීති වාර්තා සාරාංශයෙහි ඇතුළත් කර ඇත.

#### 3.1.1 ජීවා රූපසිංහ (වෛ. නී. ගොනු අංක: 48/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, 2015.10.29 වන දින පස්වරු 2.30ට පමණ ඇය හදිසියේ බිම ඇද වැටී ඇත.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය, තුවාල ස්ථානය

1. තැල්ම, දකුණු උරහිස් සන්ධිය මුදුනේ, සෙ.මී. 3 x 3 ක ප්‍රමාණය
2. සීරීම, වම් පාදයේ දණහිසට පහළින් අණ්ඩාකාර හැඩයක සෙ.මී. 3 x 2 ක ප්‍රමාණය. අංක: 85271 දරණ එක්ස්රේ ඡායාරූපයට අනුව යට අස්ථි බිඳීමක් නැත.

#### 3.1.2 සඳුනී චන්ද්‍රසිරි (වෛ. නී. ගොනු අංක: 31/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

2015.10.29 වන දින පස්වරු 3.30ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, සිහි විසඥ වීම සහ ගෑස් වලට නිරාවරණය වීමේ හේතුවෙන් ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ දුෂ්කරතාවය වර්ධනය විය.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

බාහිර තුවාල නැත. දැඩිව ඉදිමීම නිසා උගුර රත් පැහැ ගැන්වී ඇත.

#### 3.1.3 ෆාතිමා හනීනා හුසේන් (වෛ. නී. ගොනු අංක: 32/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

2015.10.29 වන දින පස්වරු 3.40ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් බැටන් පහර එල්ල කරන ලදී.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. හිස පිටුපස දකුණු පස පැරීටල් කලාපයේ සමේ තැල්ම
2. සීරීම - දකුණු උරහිස සන්ධියේ පිටුපස අණ්ඩාකාර හැඩයක සෙ.මී. 3 x 2 ක ප්‍රමාණය. අංක: 85219 දරණ එක්ස්රේ ඡායාරූපයට අනුව යට අස්ථි බිඳීමක් නැත.

3.1.4 සශිනී සන්දීපනී කුමාරසිරි (වෛ. නී. ගොනු අංක: 33/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

2015.10.29 වන දින පස්වරු 3.00ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරින් විසින් පොලිස් බැටනයකින් හිසට සහ පපුවේ පිටුපසට පහර දෙන ලදී. ඇය ආරෝග්‍යශාලාවෙන් නිදහස් කරන ලදුව, හිස පිටුපස වරින්වර ඇතිවන වේදනාව නිසා 2015.11.01 වන දින නැවත ආරෝග්‍යශාලාවට ඇතුළත් කරන ලදී.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. හිස පිටුපස වම් අංශයේ පැරීටල් කලාපයේ නෙරීම අසළ සමේ තැල්ම. නැවත ආරෝග්‍යශාලාගත කිරීමෙන් පසු, මොළය පරිලෝකනය කරන ලද අතර, අංක: 6694 දරණ පරිලෝකන වාර්තාවට අනුව හිස්කබලේ අස්ථි බිඳීමක් නැති අතර, කපාල කුහරයට ලේ කාන්දු වීමක් නොපෙනේ.
2. දකුණ උරහිස් තලයේ, ලම්බාකාර සමාන්තර රේඛා දෙකක් වැනි සෙ.මී. 2 x 1.5 ක සීරීමක්, සීරීම් දෙක අතර දිගටම සෙ.මී. 1 ක පරතරය. එක්ස්රේ ඡායාරූප අංක: 85226 අනුව, අස්ථි බිඳීමක් නැත.
3. දකුණු උරහිස් තලයේ, ඉහත 2හි සඳහන් තුවාලයට ඉහළින් සෙ.මී. 2 x 1 ප්‍රමාණයේ අණ්ඩාකාර තැල්ම,

.

3.1.5 බුද්ධිකා උක්වත්ත (වෛ. නී. ගොනු අංක: 44/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

2015.10.29 වන දින පස්වරු 3.00ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් බැටනයකින් පහර දෙන ලද අතර, ඇය බිම ඇද වැටිණි. ගැස්වලට නිරාවරණය වීම නිසා උගුරේ වේදනාව ඇති විය.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. දකුණු අතේ යටි පැත්තේ, මැණික් කටුව සන්ධියට එපිටින් සෙ.මී. 0.5 x 0.5.1 ප්‍රමාණයේ තැල්ම
2. දකුණු උරහිස් සන්ධියේ මුදුනේ මොළොක් බව. අංක: 85263 එක්ස්රේ ඡායරූපයට අනුව අස්ථි බිඳීමක් නැත.
3. කටී ප්‍රදේශයේ නහර හා ස්නායු මධ්‍යයේ මොළොක් බව.
4. උගුර ඇඩිව ඉදිමීම නිසා උගුර රතු වී ඇත.

3.1.6 අයේෂ් රත්නායක (වෛ. නී. ගොනු අංක: 44/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

පහරදීම

2015.10.29 වන දින පස්වරු 4.00 – 4.30ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරින් කිහිප දෙනෙකු විසින් පොලිස් බැටන් වලින් පහර දෙන ලදී.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. හිසේ දකුණු පස සෙ.මී. 5 ක් දිග විදාරණය වූ තුවාලය
2. නළලේ වම්පස සෙ.මී. 1 x 1 ප්‍රමාණයේ සීරීම
3. දකුණු පස පා ඇඟිලිවල සෙ.මී. 1.5 x 0.5 ප්‍රමාණයේ සීරීම

3.1.7 සුපුන් එෂාන් (වෛ. නී. ගොනු අංක: 35/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

2015.10.29 වන දින පස්වරු 4.00 – 4.30ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරින් කිහිපදෙනෙකු විසින් පොලිස් බැටන් වලින් පහර දෙන ලදී.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. දකුණු අග්‍රබාහුවේ යට පැත්තේ දකුණු වැළමිටට මඳක් යටින් සෙ.මී. 4 ක් දිග විදාරණය වූ තුවාලය

3.1.8 ඒ. ලසිත ප්‍රදීප් අතුකෝරළ (වෛ. නී. ගොනු අංක: 46/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

පහර දීම

2015.10.29 වන දින පස්වරු 4.00 – 4.30ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරින් කිහිප දෙනෙකු විසින් පොලිස් බැටන් වලින් පහර දෙන ලදී.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. දකුණු අග්‍රබාහුවේ පිටුපස සෙ.මී. 5ක් දිග විදාරණය වූ තුවාලය
2. දකුණු අත පිටුපස සෙ.මී. 1 x 2 ප්‍රමාණයේ සීරීම
3. දණහිස් සන්ධි දෙකෙහිම තැලීම්

3.1.9 ගෙමිලිකා නිලුකා නයනා (වෛ. නී. ගොනු අංක: 45/15)

රෝගියා විසින් දෙන ලද කෙටි විස්තරය

2015.10.29 වන දින පස්වරු 3.00ට පමණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියෙහි විරෝධතාවයේ යෙදී සිටියදී, පොලිස් නිලධාරියෙකු විසින් පහර දෙන ලද, ඇය බිම ඇද වැටිණ.

තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය සහ තුවාල ස්ථානය

1. දකුණු මැණික් කටුව සන්ධියෙහි, ප්‍රසාරක මතු පෘෂ්ඨයෙහි අණ්ඩාකාර හැඩයක සෙ.මී. 0.5 x 0.5ක ප්‍රමාණයක සීරීම.

2. දකුණු අත, දකුණු මැණික් කටුව සන්ධියට එපිටින් අල්ල තුළ සෙ.මී. 0.5 x 0.5ක ප්‍රමාණයක සීරීම. අංක: 85270 එක්ස්රේ ඡායරූපයට අනුව අස්ථියේ බිඳීමක් නැත.

3.1.10 ප්‍රතිකාර සඳහා ආරෝග්‍යශාලාවට ඇතුළත් කරන ලද ශිෂ්‍යයින්ගේ 10 දෙනෙකුගේ ලැයිස්තුවෙහි 09 දෙනෙකුගේ වෛ. නී. වාර්තා පමණක් ලැබී ඇති බව පොලිස් ආරෝග්‍යශාලාවෙහි කාර්ය භාර නිලධාරියා විසින් 2015 නොවැම්බර් මස 12 වන දින කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදී. ශිෂ්‍යයින් 10 දෙනෙකු ආරෝග්‍යශාලාවට ඇතුළත් කරන ලද බව සඳහන් වන නමුත්, 10 වන ශිෂ්‍යයා ලෙස චිත්‍රා වෛද්‍යසූරිය නමින් දන්නා ශිෂ්‍යයෙකු ආරෝග්‍යශාලාවට ඇතුළත් කර නැත. (ඇමුණුම් 5)

3.2 පුවත්පත් වාර්තා

මෙම සිද්ධියට අදාළ, ශිෂ්‍යයින්ට පහර දෙන ඡායාරූප ඇතුළත් පුවත්පත් වාර්තා, 2015 ඔක්තෝබර් මස 30 වන දින සිට නොවැම්බර් මස 02 වන දින දක්වා ලක්බිම, ලංකාදීප, දිවයින සහ ද අයිලන්ඩ් යන පුවත්පත් වලින් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. (ඇමුණුම් 6)

3.3 ඡායාරූප සහ වීඩියෝ පටි

පොලිස් බලකාය විසින් බැටන් වලින් ශිෂ්‍යයින්ට පහර දීම පෙන්වන ඡායාරූප සහ වීඩියෝ පට මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව ඇත. මෙයට අමතරව, වගඋත්තරකරුවන් විසින් ද වීඩියෝ පට දෙකක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. (මුල් ලේඛනයේ ඇමුණුම් 7)

## 4. වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු

4.1 මෙම සිද්ධියට අදාළව, ජොෂ්ඨ නි. පොලිස්පති, පූජිත ජයසුන්දර, නි. පොලිස්පති (කොළඹ) ගාමිණී මතුරට, ජොෂ්ඨ අධිකාරි, පාලිත සිරිවර්ධන සහ මාධ්‍ය ප්‍රකාශක (දැන් ජො.පො.අ.) අජිත් රෝහණ විසින් 2015.11.05 වන දින කොමිෂන් සභාව හමුවේ වාචික සාක්ෂි ලබා දෙන ලදී.

4.1.1 ජොෂ්ඨ පොලිස් අධිකාරි, අජිත් රෝහණ පොලිස් ආඥා පනතෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි සහ අපරාධ නඩු විධිවිධාන පරිපාටි සංග්‍රහයෙහි අදාළ කොටස් උපුටා දක්වමින් පහත දැක්වෙන පරිදි සඳහන් කරන ලදී.

- රටෙහි අපරාධ, වැරදි සහ ජනතා පීඩාවන්ට පත්කිරීම් වළක්වාලීමෙහි ලා පොලිස් නිලධාරීන්ගේ නිල කාර්ය භාරය පොලිස් ආඥා පනතෙහි 56 වන ඡේදයන් පිළිගෙන ඇත. තවද, සාමය ආරක්ෂාකරලීමෙහි ලා පොලිසියේ කාර්ය භාරය 56(බී) කොටසේ දැක්වේ.
- පොදු ස්ථානයක සංවිධානය කෙරෙණ යම් පෙළපාලියක් සම්බන්ධයෙන්, යටත් පිරිසෙයින් සිද්ධියට පැය හයකටවත් පෙර ලඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිට දැන්විය යුතු බව පොලිස් ආඥා පනතෙහි 77 වන ඡේදයේ දැක්වේ. මෙම ඡේදය කඩකිරීමෙන් පෙළපාලියට සම්බන්ධ වන පාර්ශ්වයන් වරදකට වැරදිකරුවන් වෙති.

දෙහිවලින් ආරම්භ කරන ලද පෙළපාලිය නිසා කි.මී. 3ක් දිග රථවාහන තදබදයක් ඇති විය. පෙළපාලියක් පැවැත්වෙන බව කිසිම පොලිස් නිලධාරියෙකු නොදැන සිටි අතර, පොලිස් ආඥා පනතෙහි සලසා ඇති විධිවිධාන අනුව, මෙම පෙළපාලිය නැවැත්වීමට පොලිස් බලකාය නිල වශයෙන් බැඳී ඇත. එවැනි ක්‍රියාදාමයක් නැවැත්වීමට පොලීසිය අපොහොසත් වුවහොත්, එය පොලිස් ආඥා පනතෙහි 55 වන ඡේදය කඩකිරීමක් වන්නේය.

ඔහු තවදුරටත් සඳහන් කර සිටියේ, අපරාධ නඩු විධිවිධාන පරිපාටි සංග්‍රහයෙහි 95(1) සහ (2) ඡේදයන්හි සලසා ඇති පරිදි, සාධාරණව අවශ්‍ය වන බලය යොදා ගනිමින්, නීති විරෝධීව ඒකරාශී වූ පිරිස විසුරුවා හැරීමට කටයුතු කරන ලද බවය. නීති විරෝධී එක්රැස්වීමකට අදාළ වන දණ්ඩ නීති සංග්‍රහයේ 138 වන ඡේදයට ද කොමිෂන් සභාවේ අවධානය යොමු කරවමින්, ඔහු සඳහන් කරන්නේ, පොලිස් ආඥා පනතෙහි 80 වන ඡේදය ද කඩ වී ඇති බවයි. බලයලත් නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද අදාළ බලපත්‍රයක් නොමැතිව ශබ්ද විකාශන උපකරණ භාවිතා කර, ශබ්ද ඇති කිරීම ද වරදක් වන බවයි. දණ්ඩ නීති සංග්‍රහයේ 138 වන ඡේදය උල්ලංඝණය වූ බව නීතිවිරෝධී ලෙස ඒකරාශීවීම නිසා පොදු මාර්ග අවහිර වූ බව පෙන්වා දීමෙන් සාධාරණීකරණය කළ හැක.

ඔහුගේ මෙම ප්‍රකාශයන් සනාථ කිරීම සඳහා, සාමකාමී ස්වභාවයේ වුවද, එය නොසළකා පොදු ස්ථානයන්හි එක්රැස්වීම නොකළ යුතු බව කියැවෙන, බර්නාඩ් සොයිසා එරෙහිව නීතිපති නඩුවේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ද ඔහු විසින් හුවා දක්වන ලදී. ශිෂ්‍යයින් එකරැස් වූ ප්‍රදේශයෙහි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ මහාරෝග්‍යාශලාව ද පිහිටා ඇති බව ද ඔහු වාර්තා කර සිටියේය. මෙම ප්‍රදේශයෙහි දිනකට ගිලන් රථ 100ක් පමණ එහා මෙහා යන හෙයින්, පොලිසිය මෙම එක්රැස්වීම විසුරුවා නොහරින ලද්දේ නම්, එනයින් මහජනතාවට බරපතල ගැටලු මතුවිය හැකිව තිබුණි.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි 30 වන වගන්තිය සඳහන් කරමින් ඔහු ප්‍රකාශ කරන්නේ කොළඹ ප්‍රධාන කලාපවලින් එකක් වූ ලිප්ටන් වටරවුම භාවිතා කරනු ලබන ලක්ෂ

සංඛ්‍යාත ජනතාවගේ අයිතිය හා නිදහස කඩාකප්පල් කිරීමට ශිෂ්‍යයින් 1200ක එක්රැස්වීමකට ඉඩදිය නොහැකි බවයි.

4.1.2 නියෝජ්‍ය පොලිස්පති (කොළඹ භාර) ගාමිණී මතුරට සඳහන් කර සිටියේ, මෙම පෙළපාලිය නිසා යුනියන් පෙදෙස හා ඩීන්ස් පාර ඔස්සේ උග්‍ර වාහන තදබදයක් ඇති වූ බවයි. එමනිසා, කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර භාවිතා කරමින් සෙනග විසුරුවා හැරීමට කටයුතු කිරීමට පොලීසියට සිදු විය. අවස්ථානුකූලව සහ විසිර යාමට ශිෂ්‍යයින් අපොහොසත් වීම නිසා ඔවුන් විසුරුවා හැරීම සඳහා බැටන් ප්‍රයෝජනයට ගැනීමට ද පොලිසියට සිදුවිය. ඔහු තවදුරටත් සඳහන් කරන්නේ, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු ලෙස, තමා මෙම සිද්ධියේ වගකීම භාර ගන්නා බවයි.

4.1.3 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, පාලිත සිරිවර්ධන සඳහන් කරන්නේ, 1300ක ශිෂ්‍ය පිරිසක් මෙම නීතිවිරෝධී එක්රැස්වීමට සහභාගී වූ බවත්, එවන් ඒකරාශීවීම් වලින් රජයේ කාර්යාල ආරක්ෂා කිරීම පොලිසියේ රාජකාරිය බවත්ය. කෙසේවුවද, වෙනත් බලධාරියෙකු ශිෂ්‍යයින් හමුවන බව දන්වා සිටිය ද, ඔවුහු එය ප්‍රතික්ෂේප කළෝය. එමනිසා, ශිෂ්‍යයින් විරෝධතාවය පළ කරද්දී, පොලිසිය පැය 3ක කාල පරාසයක් තුළ නිහඬව සිටින ලදී.

4.1.4 ජාතික උද්දේශයක් වන මෙම කාරණය පොලිස්පතිවරයා නොදැන සිටීම අඩුපාඩුවක් ලෙස පරීක්ෂණය පැවැත්වෙද්දී සභාපතිතුමිය විසින් දක්නා ලදී. එතුමිය තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ, පොලිස් බලකායේ උසස්ම නිලධාරියා ලෙස, මෙම සිද්ධිය සම්බන්ධයෙන් ජනතාවට නිවේදනයක් කිරීම අත්‍යාවශ්‍යයෙන් කළ යුතුව තිබූ බවයි.

4.2 මානව හිමිකම් කොමිෂන් සභාව 2015.11.03 වන දින ස්වකීය පරීක්ෂණය පැවැත්වූ අතර, වගඋත්තරකරුවෝ 2015.11.05 වන දින ලිඛිතව කරුණු දැක්වූහ. මෙම කාරණය සමථයට පත් කිරීම සඳහා පොලිස් නිලධාරීන් 226ක් සේවයේ යොදවන ලද අතර, පොලිස් ක්ෂේත්‍ර බලකායේ කැරළි මර්දන නිලධාරීන් ද මෙම සිද්ධි කාල පරාසය තුළ සේවයේ යොදවා ඇත.

මෙය සාමකාමී පෙළපාලියක් නම්, පසුපසින් පේළිගත වන ලෙස පොලිස් නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබ ඇත. නොඑසේනම්, විසිර යන ලෙස පිරිසට අනතුරු හැඟවීමක් කරන ලෙස ද ඔවුන්ට දන්වා තිබුණි. එයිනුත් ප්‍රතිඵලයක් නොමැති නම්, ඉනික්බිති ජල ප්‍රහාර එල්ල කරන ලෙස පොලිස් නිලධාරීන්ට උපදෙස් දී ඇත. හේදකාරී හැසිරීම තවදුරටත් පවතින්නේ නම්, පිරිස විසුරුවා හැරීම සඳහා කඳුළු ගෑස් භාවිතා කරන ලෙස පොලිසියට උපදෙස් දී ඇත. ඒ අනුව ද නොකෙරෙන්නේ නම්, ඊළඟට බැටන් ප්‍රහාරය ක්‍රියාත්මක කිරීමට සූදානම් වන බව හැඟවෙන පරිදි ක්‍රියා කරන ලෙසත්, එමගින් විසිර යා යුතු බවට භීතියක් පිරිස තුළ ඇතිකරලීමටත් පොලිස් නිලධාරීන්ට උපදෙස් දී තිබුණි.

මුලදී, පොලිස් නිලධාරීන් යෙදවීම කොළඹ දකුණ පොලිස් ස්ථානයේ, නියෝජ්‍ය පොලිස්පති පාලිත පනාමල්දෙණිය යටතේ සිදුවිය. එමනිසා, මෙම සිද්ධිය අතරතුර, පොලිස් නිලධාරීන් විසින් ජලප්‍රහාරක 03ක්, කඳුළු ගෑස් උණ්ඩ 19ක් සහ කඳුළු ගෑස් බෝම්බ 03ක් භාවිතා කර ඇත. පසුව, පිරිස විසුරුවා හැරීම සඳහා බැටන් ප්‍රහාර ප්‍රයෝජනයට ගන්නා ලදී.

විසුරුවා හැරීම සිදුකරන ලද්දේ පහත දැක්වෙන පනත්වල, දක්වා ඇති ඡේද යටතේය.

| | |
|---|---|
| අපරාධ නඩු විධිවිධාන පරිපාටි සංග්‍රහය | 95 වන ඡේදය |
| ජාතික මංමාවත් පනත | 59( i) වන ඡේදය |
| පොලිස් ආඥා පනත | 77( i), (ii), 78/80 ඡේද 56 |
| දණ්ඩ නීති සංග්‍රහය | 138/140 ඡේදය |
| දෙපාර්තමේන්තු නියෝග | ඒ-18 හා 19 |

ශිෂ්‍යයන් අත්අඩංගුවට ගැනීම සිදු කරන ලද්දේ දණ්ඩ නීති සංග්‍රහයෙහි 2, 140, 188, 314 සහ 316 යන ඡේද සහ 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනතේ, 59(1) දරණ ඡේදය යටතේය.

ශිෂ්‍යයින් 39 දෙනාගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් අනතුරුව, නීතිවිරෝධී ඒකරාශීවීමක සාමාජිකයින් වීම, පොලිස් නිලධාරීන්ට පහර දීම, ප්‍රධාන මාර්ග අවහිර කිරීම, සුළු තුවාල සිදු කිරීම සහ පොලිස් රාජකාරි ඉටු කිරීමට බාධා කිරීම යන චෝදනා යටතේ, 2015.10.30 වන දින බී 40933/1/15 යටතේ, මහේස්ත්‍රාත් ඉදිරියට පමුණුවන ලදී, (මුල් ලේඛනයේ - ඇමුණුම් 8)

4.3 12 වන වගඋත්තරකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් 2015.11.26 වන දින මෙම සිද්ධියට අදාළ වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එහි සඳහන් වන්නේ එදින අමාත්‍යවරයා සමග ස්වකීය ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡාවක් සඳහා ලිඛිත හෝ වාචික ඉල්ලීමක් ගිණුම්කරණ ජාතික උසස් ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයින් විසින් කර නොමැති බවයි.

කෙසේවුවද, මෙම සිද්ධිය වූ දින, පෙරවරු 10.00ට පමණ, මෙම ආයතනයට අදාළ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පිණිස උසස් තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් සහ යම් යම් අනෙකුත් නිලධාරීන් හා සමග අමාත්‍යවරයාගේ රැස්වීමක් පවත්වා ඇත. මහමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනත් රැස්වීමක් පැවැත්වෙද්දී, බත්තරමුල්ලේදී පස්වරු 2.30ට පමණ නිවේදනයක් කෙරෙන තුරු, අමාත්‍යවරයා හෝ ලේකම්වරයා මෙම පෙළපාලිය ගැන දැනසිට නැත. අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සමග ශිෂ්‍ය සාකච්ඡාවක් සඳහා පොලිසිය විසින් කටයුතු සංවිධානය කරන ලද නමුදු, ශිෂ්‍යයින් එයට එකඟ වී නැත.

මෙකී අදාළ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්නය සමථයට පත් කිරීම සඳහා 46/90 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම පිණිස 2015 නොවැම්බර් මස අංක: 22/2015 දරණ චක්‍රලේඛය නිකුත් කර ඇති බවද 12 වන වගඋත්තරකරු විසින් තවදුරටත් සඳහන් කරන ලදී.

## 5 ආශ්‍රිත නීති විධිවිධාන

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය
- 1979 අංක 15 දරණ අපරාධ නඩු විධිවිධාන පරිපාටි සංග්‍රහය
- අංක 19 දරන දණ්ඩ නීති සංග්‍රහය
- 1984 අංක 41 දරණ පොලිස් ( සංශෝධන) පනත
- 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනත
- පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝග
- ජාත්‍යන්තර මානව හිමිකම් සාධන පත්‍ර - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය

## 6 නිරීක්ෂණ

### 6.1. ගණකාධිකරණ උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍යයින් සහ ඒකරාශීවීම;

2015.10.29 වන දින, කොටුවේ දුම්රිය ස්ථානයේ සිට වෝඩ් පෙදෙසේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට කිලෝ මීටර කිහිපයකට දුරින්, මාර්ග බාධක ස්ථානගත කර ඇති ස්ථානය දක්වා පැමිණෙන තුරු, පොලීසිය පෙළපාලිය සමග සහයෝගීව කටයුතු කර ඇත. එවැනි පෙළපාලියක් සම්බන්ධයෙන් නිලධාරීන්ට හෝ පොලිසියට හෝ පූර්ව දැනුම්දීමක් කර නොමැති බව ද පෙනේ.

දෙපාර්ශ්වයෙන්ම සපයන ලද වීඩියෝ පට සහ ප්‍රකාශ වලින් පෙනී යන්නේ පොලිසිය මාර්ගය අසුරාලීමට උත්සාහ කරන ලද්දේ ශිෂ්‍යයින්ගේ ඒකරාශීවීම නිසා බවයි. මෙම ඒකරාශීවීම නිසා දැඩි මාර්ග තදබදයක් ඇති වූ බව ද පෙනී යයි.

අමාත්‍යාංශයේ වඩා උසස් නිලධාරියකු නොව, පොලීසිය කරන ලද ආයාචනය මත, සහකාර ලේකම්වරයෙකු හමුවීම ශිෂ්‍යයින් විසින් ප්‍රතික්ෂේප කරන ලද බව පිළිගැනේ.

ගැටුම ආරම්භ වූයේ, අමාත්‍යාංශයේ උසස් නිලධාරියෙකු හමුවීම සඳහා ශිෂ්‍යයින් විසින් කරන ලද ඉල්ලීම ඉටු නොවීම නිසා බව තහවුරු වී ඇත.

## 6.2. ඒකරාශීවීම විසුරුවා හැරීම

මෙම සිද්ධිය සිදු වූ අවස්ථාවේදී ඉහත කී ප්‍රදේශයෙහි 1,500ක ඇස්තමේන්තුගත ශිෂ්‍යයින් සංඛ්‍යාවක් සිටි බවත්, ජල ප්‍රහාරක 3ක් සමග පොලිස් ස්ථාන 17කින් කැඳවන ලද පොලිස් නිලධාරීන් 257 දෙනෙකු රාජකාරියෙහි යෙදී සිටි බවත් වගඋත්තකරු පවසයි.

මෙම සිද්ධියට අදාළ නියෝග සහ උපදෙස් නියෝජ්‍ය පොලිස්පති (කොළඹ භාර), ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (මධ්‍යම) සහ කොළඹ දිශාව භාර පොලිස් ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් 13 දෙනෙකු විසින් ක්‍රියාත්මක කර ඇත.

කාන්තා පොලිස් නිලධාරීන් සේවයේ නොයොදවන ලද බව තහවුරු වී ඇති අතර, මාර්ගබාධක යෙදවීමට හේතුව වූයේ, ශිෂ්‍යයින් විසින් මීට පෙර දියත් කරන ලද උද්ඝෝෂණ වලින් පසුව සිදු වූ පරිදි, රජයේ ගොඩනැගිලි වලට හානි සිදුවීම වළක්වාලීමේ පූර්වෝපාය පියවරක් ලෙස බව වගඋත්තරතරු සඳහන් කරයි.

මෙගාෆෝන්ස් මගින් නිවේදනය කරන ලද නමුදු, වෙනත් නිලධාරියෙකු හමුවීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුවද, පිරිස විසිරී නොගිය බව ද තවදුරටත් තහවුරු වී ඇත.

මාර්ග බාධක ලෙස ස්ථානගත කරන ලද වැට කඩා බිඳ දැමීමට ශිෂ්‍යයින් උත්සාහ කරන ආකාරය වීඩියෝපට දර්ශන වලින් පෙනේ. ඒ මොහොතේ, ජල ප්‍රහාරක භාවිතයෙන් පිරිස විසුරුවා හැරීමට දරන ලද ප්‍රයත්නය ද නිෂ්ඵල වූයේ ශිෂ්‍යයින් එකට ගොනුවී අත් විහිදුවමින් ජල ප්‍රහාරය වළක්වාලීමට උත්සාහ කිරීම නිසාය.

මේ නිසා, පොලිසිය විසින් කඳුළු ගෑස් ප්‍රහාරය අරඹන ලදී. පුවත්පත් ලිපි, ඡායාරූප සහ වීඩියෝ පටවල, පිරිස වෙත කඳුළු ගෑස් මුදා හැරි වහාම, පිරිස විසිරී යන අයුරක් පෙනෙන්නට තිබුණි. එහෙත්, වීඩියෝ පටවලින් පැහැදිලි වූයේ, සමහර ශිෂ්‍යයින් ගෑස් ප්‍රහාරයෙන් පීඩාවට පත්ව බිම වැටී ඇති ආකාරයයි. ශිෂ්‍යයින් පළවා හැරීම සඳහා පොලිසිය විසින් බැටන් සහ ලී පොළුවලින් පහර දෙන ලදී. මෙම සාක්ෂිවල වගකීම සපයන්නන් විසින් දරණ ලද අතර, ඒවා මාධ්‍යවල පළවිය. පොලිස් නිලධාරීන් විසින් ශිෂ්‍යයන්ගේ ශරීරයේ පසුපස ඉහළ ප්‍රදේශයට පහර දෙන අයුරු වීඩියෝ පටවල දර්ශනය විය. ජනතා ඒකරාශිවීමක් කළමනාකරණයට අදාළ රෙගුලාසි සම්බන්ධයෙන් මූලික පුහුණුවක් හෝ දැනුමක් හෝ පොලිස් නිලධාරීන් සතුව නොමැති බව තහවුරු විය. මේ අවස්ථාවේදී පොලිස් ප්‍රහාරය එල්ල වන්නේ ස්ථානයෙන් පලායන ශිෂ්‍යයින්ට බව දක්නා ලදී.

## 6.3. ශිල්පීකරණ උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍යයින් අත්අඩංගුවට ගැනීම

බම්බලපිටිය, කුරුඳුවත්ත, වැල්ලවත්ත, කිරුළපන, කොල්ලුපිටිය සහ නාරාහේන්පිට පොලිස් ස්ථාන විසින් ශිෂ්‍යයින් 39 දෙනෙකු අත්අඩංගුවට ගෙන සිරභාරයේ තබා ගන්නා ලදී. 2015.10.30 වන දින ඔවුන් බී.40933/1/15 නඩුව යටතේ මහේස්ත්‍රාත් උසාවිය වෙත පමුණුවන ලද අතර, ඇප ලබා දෙන ලදී.

මහේස්ත්‍රාත් උසාවිය වෙත පමුණුවන ලද ශිෂ්‍යයින් 39 දෙනා අත්අඩංගුවට ගන්නා ලද්දේ දණ්ඩ නීති සංග්‍රහයේ ඡේද 140, 153, 14 හා 316 සමග කියැවෙන 32 වන ඡේදය සහ 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනතේ ඡේද 59(1) යටතේ බව පොලිසිය සඳහන් කරන්නේ වී නමුදු, ශිෂ්‍යයින් සඳහන් කරන්නේ අත්අඩංගුවට ගැනීම හිතුවක්කාර ලෙස කරන ලද අතර, අත්අඩංගුවට ගැනීමට හේතුව තමන් වෙත දැනුම් නොදෙන ලද බවයි. අත්අඩංගුවට ගන්නා ලද ආකාරය සම්බන්ධයෙන් නිගමනයකට එළඹීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොමැති බව මානව හිමිකම් කොමිෂන් සභාවේ මතයයි.

## 6.4. අත්අඩංගුවට ගැනීම් කටුක සහ අමානුෂීය වධ හිංසාවලින් තොරව සිදුවිය යුතුය.

අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී ශිෂ්‍යයින්ට වධහිංසා පමුණුවමින්, අමානුෂික ලෙස සළකන ලද බවත්, එවන් සැළකීම් කරණ කොට ගෙන, වීඩියෝ පටවල සහ ඡායාරූවල දැක්වෙන පරිදි, ශිෂ්‍යයින් ශාරීරික තුවාල වලට භාජනය වූ බවත් පෙත්සම්කරු සඳහන් කරයි.

අසරණව තනිවූ ශිෂ්‍යයෙකු වට කර ගත් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ඉතා දරුණු ලෙස නොකඩවා ඔහුට පහරදෙන අයුරු එම වීඩියෝ පටයේ දැක්වෙයි.

කෙසේවුවද, පොලිස් බැටන් ප්‍රහාරයට ලක්වූයේ ශිෂ්‍යයන් 09 දෙනෙකු පමණක් වුවද, හිස හා උරහිස් ඇතුළු ශරීරයේ පසුපස ඉහළ ප්‍රදේශයට පහර එල්ල වූ තවත් බොහෝ ශිෂ්‍යයෝ සිටිති. පොලිස් නිලධාරීන් විසින් පහර දෙන ලද්දේ පොලිසියෙන් පලායන ශිෂ්‍යයින්ට මිස පොලිස් නිලධාරීන්ට එරෙහිව පහරදීමට පැමිණි ශිෂ්‍යයින්ට නොවේ.

## 6.5. වෙනත් සාධක

එවන් සිද්ධීන් නිසා, වගඋත්තරකරුවන් විසින් සඳහන් කරන ලද පරිදි, නිලධාරීන් 6 දෙනෙකු වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආරෝග්‍යශාලාගත කරන ලදී. එමනිසා, ශිෂ්‍යයින් විසින් පොලිස් නිලධාරීන්ට කරන ලද ශාරීරික තුවාල සම්බන්ධයෙන් වාර්තාවක්, 2015.11.24 වන දිනට ප්‍රථම ඉදිරිපත් කරන ලෙස

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින ලදී. අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා, මෙම කාරණය සම්බන්ධයෙන් කිසිම නිගමනයකට නොඑළඹෙන ලදී.

එවන් ඒකරාශීවීමක් විසුරුවා හැරීම වගඋත්තරකරුවන්ගේ රාජකාරිය බවත්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් නෛතිකමය මූලධර්මයන්ට අනුව සිදු කරන ලද බවත් වගඋත්තරකරුවන් පෙන්වා දී ඇත.

## 7. නෛතිකමය නිගමන

### 7.1 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව

### 7.1.1 අත්අඩංගුවට ගැනීම් කුරිරු හා අමානුෂීය වධහිංසාවලින් තොරව සිදුවිය යුතුය.

මෙතෙක් තහවුරුව ඇති කරුණු සහ සාක්ෂි කෙරෙහි යොමුවීමෙන්, ශිෂ්‍යයින්ට අමානුෂික හා කුරිරු අන්දමින් සළකා තිබීම ගැන අවධානය යොමු විය යුතුය. මෙය අදාළ වන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවටය.

පිරිස් විසුරුවා හැරීමෙහි ලා භාවිතා කරන ලද යාන්ත්‍රණය කෙරෙහි අවධානය යොමු විය. බැටන් ප්‍රහාරය එල්ල කරන ලද්දේ ජල ප්‍රහාරයට සහ කඳුළු ගෑස්වලට නිරාවරණය වී බිම ඇද වැටුණු හෝ සිහි විසඥ වූ ශිෂ්‍යයින්ට බව වීඩියෝ පට වලින් සහ ඡායාරූපවලින් තහවුරු වී ඇත. සාක්ෂි වලින් හෙළිවූ පරිදි, පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් කුරිරු සහ අමානුෂික බව පෙනී යයි.

### 7.1.2 නීතිය සහ සාමානාත්මතාව අයිතිවාසිකම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව, නීතිය පසිඳලීම සර්ව සාධාරණ විය යුතුය. එමනිසා, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකාරකම් නීතියේ රෙගුලාසි අනුව සිදු කළේ ද යන්න විභාග කළයුතු වේ.

නීතිවිරෝධී ඒකරාශීවීමක් විසුරුවා හැරීම සඳහා, නීති සීමාවන් ඇතුළත ක්‍රියාකිරීම සඳහා රාජකාරිය රඳා පවත්නේ වගඋත්තරකරුවන් සමගය. එමනිසා, පහත දැක්වෙන සාධකයන් සැළකිල්ලට ගැණෙනු ඇත;

1. එවන් ඒකරාශීවීමක අරමුණ
2. එවන් ඒකරාශීවීමක් විසුරුවා හැරීම පිණිස කළයුතු කටයුතු කවරේද?

දණ්ඩ නීති සංග්‍රහයේ 138 වන ඡේදය සැළකිල්ලට ගැනීමේදී, වගඋත්තරකරුවන් සඳහන් කරන්නේ ශිෂ්‍යයින්ගේ ක්‍රියාකාරකම් ඒකරාශීවීමකට සමාන වන බවය. එය එසේ වන්නේ ඒකරාශීවීමක් නිසා සමාජයේ කැළඹිල්ලක් ඇති කෙරෙන්නේ නම්ය. කෙසේවුවද, පූර්ව දැනුම්දීමක් කළයුතු වන්නේ කවර තරාතිරමක පොලිස් නිලධාරියෙකුට වුවද, පිරිසක් විසුරුවා හැරීමේ රාජකාරිය වගඋත්තරකරු සතුය.

දෙපාර්තමේන්තු නියෝගවල ඊ5 රෙගුලාසිය අනුව, ඒකරාශීවීමකට ප්‍රථම පොලිසිය වෙත දැනුම්දීමක් කර, සැළකිය යුතු කාල පරාසයක් තුළ පොලිස් අනුමැතිය ලබා ගත යුතු වේ. කෙසේවුවද, පොලිසිය විසින් ලබා දෙන ලද අනුමැතියක් නොමැත.

එවන් ඒකරාශීවීමක් හේතු කොටගෙන සමාජයේ සාමය කඩවීමක් සිදුවන හෙයින්, එවන් පිරිසක් විසුරුවා හැරීමට, පොලිස් ආඥා පනතෙහි ඡේද 77(1) සහ 78(1) යටතේ, පොලිසියට බලය ඇත. එවන් ක්‍රියාදාමයක් ආරම්භ කිරීමට ප්‍රථම, පොලිසිය විසින් සිද්ධියට ආසන්නතම පොලිසියට දැනුම්දීමක් කර, එවැනි කැළඹිලි සහිත තත්ත්වයක් අඛණ්ඩව පවත්වා ගෙන යාම ප්‍රතික්ෂේප කළ යුතුය. 78(1) ඡේදයෙහි සඳහන් වන්නේ නීතිවිරෝධී ක්‍රියාවක් විසුරුවා හැරීමේ අරමුණින්, 12 දෙනෙකුට හෝ වැඩි පිරිසක් විසුරුවා හැරීමට පොලිස් කොස්තාපල්වරුන්ට හැකි නමුත්, එසේ කළයුතු වන්නේ පොලිස් පරීක්ෂකවරයාගේ කීර්තියට හානියක් නොවන ආකාරයටය.

ප්‍රශ්නය වන්නේ ලබා දී ඇති කරුණු අනුව, ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරකම් නීතිවිරෝධී ඒකරාශිවීමක තත්ත්වයට පත් වන්නේද යන්නයි? අමාත්‍යවරයා හමුවීමේ අවස්ථාව ශිෂ්‍යයින් වෙතින් ගිලිහීයාමෙන් පසු ජනතාව තුළ කැළඹිල්ලක් ඇති කරවමින් තත්ත්වය උග්‍ර අතට හැරෙන ලද නිසා, දණ්ඩ නීති සංග්‍රහයේ 138 වන ඡේදය සහ පොලිස් ආඥා පනතේ 78(1) ඡේදය යටතේ එය නීතිවිරෝධී ඒකරාශිවීමක් බවට පත් වෙයි.

ඊලඟ උද්දේශය වන්නේ, මෙම නීතිවිරෝධී ඒකරාශිවීම ඇති කරවන පිරිස විසුරුවා හැරීම සඳහා වගඋත්තරකරුවන් අවශ්‍ය සහ සාධාරණ පියවර ගන්නේද යන්නයි. වගඋත්තරකරුවන් සඳහන් කරන්නේ පිරිසක් විසුරුවා හැරීම සඳහා උපදෙස අංක: 18 දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝගයෙහි ඇති බවයි. කෙසේවුවද, මෙම නියෝගය සිවිල් අරගලවලට අදාළ නොවේ. වගඋත්තරකරුවෝ එවිට ඒ 19 දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝගයට අවධානය යොමු කළහ. නීති විරෝධී ඒකරාශිවීමේ අවස්ථාවකදී පොලිස් නිලධාරියෙකුට ක්‍රියාත්මක වීමට උපදෙස් එහි ඇත. කෙසේවුවද, කැළඹිල්ලට පත් පිරිස අතර කිසියම් සන්සුන් ස්වභාවයක් පැවති බවත්, තමන්ට පැවරී ඇති බලය ප්‍රමාණය ඉක්මවා භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් පොලිසියට නොතිබූ බවත් පෙනී යන ලදී.

වගඋත්තරකරුවන් පිරිස විසුරුවා හැරීම සඳහා ජල සහ කඳුළු ගෑස් ප්‍රහාරය ඇරඹූ සැනින්ම, පිරිස විසුරුවා හැරීම සඳහා පොලිසිය බැටන් ප්‍රහාරය ද ආරම්භ කරන ලද බව වීඩියෝ පට ප්‍රදර්ශනයේදී පෙනී යන ලදී. අපරාධ නඩු විවිධාන පරිපාටි සංග්‍රහයේ, ඡේද 98(2) අනුව, බලය භාවිතා කිරීම ප්‍රමාණානුකූල සහ අවශ්‍ය විය යුතුය. ශිෂ්‍යයින් පළා යද්දී, පොලිසිය පළායමින් සිටි ශිෂ්‍යයින්ගේ ශරීරයේ ඉහළ කොටස් වලට (හිස සහ උරහිස් ඇතුළුව) පහර දුන්හ. එමනිසා, පොලිසියේ මෙම කටයුත්ත ප්‍රමාණානුකූල ද නැද්ද යන්න තවමත් සැක සහිතය.

නීතිපති විසින් ඉදිරිපත් කර ඇති 2014.02.19 දින අංක: ඒජී/24/2013 දරන වාර්තාවට අනුව, සිවිල් අරගලයකදී භාවිතා කළයුතු හොඳම විකල්පය රබර් මුනිස්සන් බව කියැවේ. එවන් අවස්ථාවල දැඩි ස්වාභාවය අඩුකිරීම සඳහා අවම බලය භාවිතා කළයුතු බවද සඳහන් කෙරේ. කෙසේවුවද, රබර් මුනිස්සම් භාවිතයෙන්ද තුවාල හෝ මරණ හෝ සිදුවිය හැකිය. එමනිසා, අඩු තුවාල හෝ මරණ සංඛ්‍යාවක් සිදුවන අන්දමට අවම බලය භාවිතා කිරීමේ තීරණයද රඳා පවතින්නේ ද අදාළ බලධාරීන් වෙතම වේ. එමනිසා බලය පාවිච්චි කිරීම මගින් සිදුවන තුවාල හෝ මරණ සංඛ්‍යාව අවම වියයුතු බව එහි සඳහන් වෙයි. මෙම අවස්ථාවේදී  වගඋත්තරකරුවන් විසින් සාධාරණ බල භාවිතයක් සිදු කර නොමැත.

වීඩියෝ වාර්තා වලින් පෙනී ගියේ, පොලිසිය විසින් ජල සහ කඳුළු ගෑස් භාවිතයට ගත් විට පිරිස විසිරෙමින් සිටි අතර, ඔවුන් ක්‍රියාන්විත ප්‍රදේශයෙන් පළා යමින් සිටියහ. මෙම ශිෂ්‍යයින් හට බැටන් ප්‍රහාර එල්ල කිරීම අනවශ්‍ය වූ දෙයක් බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කෙරිණ. එමනිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය කරමින්, පොලිසිය විසින් බලය ඉක්මවා කටයුතු කර ඇත. 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනතේ, ඡේද 59(1) ට අනුව, පොලිසිය කොටුවේ සිට වෝඩ් පෙදෙස දක්වා වූ ශිෂ්‍ය පෙළපාලිය අවහිර කිරීමට කටයුතු නොකළ අතර, එය ඡේද 59(1)  කඩකිරීමක් වන්නේය.

### 7.1.3. කුරිරු හා අමානුෂික ලෙස වධහිංසාවට භාජනය වීමෙන් සහ අවමන් සහගත සැළකීමෙන් නිදහස.

ශිෂ්‍යයින් 39 දෙනෙකු සිරභාරයට පත්කිරීම සඳහා ගැනීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව උල්ලංඝණයක් සිදුවී ඇත් ද යන්න මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක් වෙමින් පවතී. අපරාධ නඩු විධාන පරිපාටි සංග්‍රහයේ ඡේද 23(1) අනුව, යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේදී, සැකකරු අත්අඩංගුවට ගැනීමේ වාචික හෝ ක්‍රියාකාරී ක්‍රියාදාමයන්ට යටත් නොවන්නේ නම්, අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාදාමය සම්පූර්ණ කර ගැනීම සඳහා රුඳවියා ස්පර්ශ කිරීමට හෝ වැටහෙනසුළු පියවරක් ගැනීමට අත්අඩංගුවට ගැනීම ක්‍රියාත්මක කරන පුද්ගලයාට බලය ඇති බව කියැවේ. එවැනි අත්අඩංගුවට ගැනීමක් ප්‍රතික්ෂේප වෙන්නේ නම්, සැකකරු සිරභාරයට ගැනීම පිණිස ප්‍රමාණාත්මක හා ආවශ්‍යක පියවර ගත හැකිය.

එසේම, අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාපරිපාටිය ප්‍රචණ්ඩකාරී නොවිය යුතු බව, 20 වන පොලිස් දෙපාර්තමේන්තු නියෝගයෙහි, ඡේද 1(ඒ)හි කියැවේ. කෙසේවුවද, එවන් අත්අඩංගුවට ගැනීමකට පෙර හෝ පසුව බලය පාවිච්චි කිරීමේ අවශ්‍යතාවයක් පවතින්නේ නම්, බලය පාවිච්චි කිරීම අවම හා ආවශ්‍යක විය යුතුය. ශිෂ්‍යයින් අත්අඩංගුවට ගැනීමේදී පොලිසිය විසින් ඉහත සඳහන් ක්‍රියාදාමය අනුගමනය කරන ලද්දේ ද යන්න ප්‍රශ්න සහගතය.

අත්අඩංගුවට ගැනීමක් කරන ලද කල්හි, එසේ කරනු ලබන්නේ කවර හේතුවක් නිසා ද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව යටතේ රැඳවියාට දැන්විය යුතුවේ.

එවැනි අත්අඩංගුවට ගැනීමක් ක්‍රියාත්මක කිරීමට සිදුවූයේ, දණ්ඩ නීති සංග්‍රහයේ ඡේද 140, 153, 314, 316 සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 59(1) ඡේදය උල්ලංඝණය වීම නිසා බව වගඋත්තරකරු සඳහන් කරයි. කෙසේවුවද, පොලිසිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව අනුව අත්අඩංගුවට ගැනීම සිදු කළේ ද, නොකළේ ද යන්න සඳහන් කිරීමට නොහැකිය.

## 7.1.4. භාෂණයේ නිදහස සහ නිදහසට අයිතිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව භාෂණයේ නිදහසට ද, 14(ආ) ව්‍යවස්ථාව සාමකාමීව රැස්වීමේ නිදහසට සහ 14(ඇ) ව්‍යවස්ථාව සමාගමයේ නිදහසට ද අදාළය.

ශිෂ්‍යයින් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2), 15(3), 15(4) සහ 15(7) දරණ ව්‍යවස්ථා උල්ලංඝණය වී ඇති බව පැමිණිලිකරුවන්ගේ ස්ථාවරයයි. කෙසේවුවද, පැමිණිලිකරුවන් 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනත සහ පොලිස් ආඥා පනතෙහි 77 වන ඡේදය අනුව ලබා දී ඇති කාලපරාසය තුළ එවැනි ඒකරාශිවීමක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පොලිසියට දැනුම්දීමක් නොකරන ලද බව පෙනේ. කෙසේවුවද, ශිෂ්‍යයින් විසින් පෙළපාලිය ආරම්භ කරන අවස්ථාවේ පොලිස් සහයෝගය තිබී ඇත. නොහික්මුණු ආකාරයට කටයුතු කළ ශිෂ්‍යයින් විසුරුවා හැරීම සඳහා පොලිසිය කටයුතු කළ අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය වී නොමැත. කෙසේවුවද, පිරිස විසුරුවා හැරීම සඳහා පොලිසිය විසින් බලය පාවිච්චි කිරීම ප්‍රමාණාත්මකව සිදු නොවූවක් විය හැකිය.

## 7.1.5. ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් වලට අදාළ නීතිය

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව, මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 5 සහ 7 දරණ වගන්ති (කුරිරු හා අමානුෂික ලෙස වධහිංසාවට භාජනය කිරීම සහ අවමානාත්මකව සැළකීම) සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි 7 හා 9 වගන්ති යටතේ වගඋත්තරකරුවන් වගවීමට යටත් කළ හැකිය.

දෙපාර්ශ්වයම විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි සැළකිල්ලට ගැනීමේදී, කුරිරු හා අමානුෂික ලෙස වධහිංසාවට භාජනය කිරීම සහ අවමානාත්මකව සැළකීමට හේතු පාදක වන පරිදි වගඋත්තරකරුවන් විසින් නීතිවිරෝධී ඒකරාශිවීමක් විසුරුවා හැරීම සඳහා වගඋත්තරකරුවන් බලය ඉක්මවා කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාවට නිගමනය කළ හැක. එමනිසා, ශිෂ්‍යයින් සම්බන්ධයෙන් සමනාත්මතාව නිදහස උල්ලංඝණය වී ඇත.

## 8. නිර්දේශ

### 8.1. මානව අයිතිවාසිකම් උල්ලංඝණය

ව්‍යවස්ථා 11 සහ 12(අ) කඩකිරීමෙන් ශිෂ්‍යයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමනය වන අතර, ශාරීරික තුවාල සඳහා ප්‍රතිකාර ලබමින් සිටින ෂශිණී සන්දීපනී කුමාරසිංහ නමැති ශිෂ්‍යාවට රුපියල් 25,000.00ක වන්දියක් සහ පහත නම් සඳහන් කර ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රුපියල් 15,000.00 බැගින් ගෙවීම නිර්දේශ කෙරේ.

1. නුවන් ප්‍රදීප්කුමාර
2. අයේෂ් රත්නසූරිය
3. සුපුන් එෂාන්
4. ෆාතිමා හනීනා හුසේන්
5. සඳුනී චන්ද්‍රසිරි
6. බුද්ධිකා උක්වත්ත
7. නිලුකා නයනා
8. ජීවා රූපසිංහ

### 8.2. අනාගතයේදී මෙවැනි සිදුවීම් වැළැක්වීම

එවන් ගැටලු සම්බන්ධයෙන් වෘත්තීමය ගුණාත්මකභාවයකින් යුක්තව ක්‍රියාකිරීමෙහි ලා ස්වකීය යාන්ත්‍රණයෙහි ඇති අඩුපාඩු දුරලීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිසියට දැන්වීමට සහ උපදෙස් දීමට මානව හිමිකම් කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

#### 8.2.1 සිවිල් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී පොලිසිය ක්‍රියාකළ යුතු ආකාරය සහ පරිපාටි ස්ථාපනය කිරීම

වත්මන් තත්ත්වයන්ට යෝග්‍යවන පරිදි, වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව ගන්නා ලද විනයානුකූල ක්‍රියාදාමය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස ද, අදාළ නිලධාරීන්ට විශේෂ පුහුණුවක් ලබා දෙන ලෙස සහ පුහුණු කිරීම් වලට අදාළ පරිපාටි සංග්‍රහයේ අත්පොතක් සම්පාදනය කරන ලෙස ද මානව හිමිකම් කොමිෂන් සභාව ඉල්ලා ඇත.

මෙවන් අවස්ථාවලදී, පිරිස් විසුරුවා හැරීම සඳහා කාන්තා පොලිස් නිලධාරීන් හෝ කාන්තා පොලිස් කණ්ඩායම් සේවයේ යෙදවීම ද නිර්දේශ කරන අතර, මෙම නිර්දේශය සම්බන්ධයෙන් වාර්තාවක් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු වෙයි.

### 8.3. විනයානුකූල කටයුතු

පවරා ඇති බලතල ඉක්මවා කටයුතු කළ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනයානුකූල පියවර ගැනීම මානව හිමිකම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරෙන අතර, අදාළ පුහුණුව ලබාදීමේ ප්‍රගතිය ද වාර්තා කළ යුතු වේ.

## 8.4. අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු කරුණු

නීතිවිරෝධී ඒකරාශිවීම (2015.10.29) සිදුවීමට පෙර, එවැන්නක් සිදුවිය හැකි බව මාධ්‍යයෙහි ප්‍රකාශයට පත්වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව හෙළිදරව් කර ගෙන ඇත. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම රාජ්‍ය නිලධාරීන් විසින් නොසළකා හැර ඇත. එමනිසා, එවන් ඒකරාශීවීම් ආරම්භ කිරීමටත් පෙර, එය සිදුවීම වළක්වාලීම පොලිසියේ වගකීම වේ.

එමනිසා, අනාගතයේදී මෙවැනි ගැටලු අවම කිරීම සඳහා, අදාළ නිලධාරීන් සහ බලධාරීන් විසින් පූර්වෝපායයන් අනුගමනය කළ යුතු බව නිර්දේශ කරන අතර, එසේ නොකළහොත් ඒ හා සමාන නීතිවිරෝධී ඒකරාශිවීම් ආදිය ඇතිවිය හැකි බව අවධාරණය කරමු.

වගඋත්තරකරුවන් පහරදීම ආරම්භ කරන ලද්දේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ශිෂ්‍යයින් හමුවීමට අකැමති බව ප්‍රකාශ කරන ලද්දේ ඔවුන් සාමකාමී එකරාශිවීමක නියැලී සිටි අවස්ථාවකදී බව ගිණුම්කරණ උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍යයින් සම්බන්ධයෙන් දියත් කරන ලද නිරීක්ෂණයන්ගෙන් පෙනී යයි.

මෙම කාරණය අදාළ බලධාරීන් සමග සාකච්ඡා කිරීමේ අවස්ථාව උදාකර දී ඇත්තේ පොලිස් නිලධාරීන් විසින් ම බව ද මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයන්ගෙන් හෙළිවිය.

ආචාර්ය දීපිකා උඩගම
සභාපතිනි
මානව හිමිකම් කොමිෂන් සභාව

සාලිය පීරිස්
කොමසාරිස්
මානව හිමිකම් කොමිෂන් සභාව

අම්බිකා සත්කුණනාදන්
කොමසාරිස්
මානව හිමිකම් කොමිෂන් සභාව

හමීඩ් ගසාලි හුසේන්
කොමසාරිස්
මානව හිමිකම් කොමිෂන් සභාව

ආචාර්ය උපනන්ද විදානපතිරණ
කොමසාරිස්
මානව හිමිකම් කොමිෂන් සභාව

## 3 වන පරිච්ඡේදයේ ඇමුණුම්

### ඇමුණුම් 3ඒ

### 2015 වසරේදී මානව හිමිකම් කොමිෂන් සභා නිලධාරීන් සහභාගී වූ විදේශීය සම්මන්ත්‍රණ සහ වැඩමුළු

| | සහභාගි වූ නිලධාරියාගේ නම සහ තනතුර | රට සහ විදේශීය සම්මන්ත්‍රණ සහ වැඩමුළු | දින වකවානුව |
|---|---|---|---|
| 01 | මේනකා හේරත් මිය, නීති නිලධාරි | **තායිලන්තය -** <br> ආසියා-ශාන්තිකර කලාපයෙහි සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්තික සමාජභාවී ආදි පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කරලීමෙහි ජාතික මානව හිමිකම් ආයතනවල භූමිකාව - ආසියානු - ශාන්තිකර සංසදය/එ.ජ.සං.වැ. වැඩමුළුව | 2015.02.24 <br> 2015.02.27 |
| 02 | ඩබ්. එච්. සුමනලාල් මහතා, වි.නි. <br> සුජීවා කුමාරි මිය, නී.නි. <br> එම්. එස්. අපොන්සු මිය, වි.නි.(අම්පාර) <br> ඩබ්. කේ.එස්. ප්‍රියංගා මිය, වි.නි. (අනුරාධපුරය) | **නේපාලය -** <br> කාන්තාවන්ගේ සහ දැරියන්ගේ මානව හිමිකම් සම්බන්ධයෙන් උප කලාපීය මිශ්‍රිත අධ්‍යයන පාඨමාලාව | 2015.04.13 <br> 2015.04.17 |
| 03 | ඩී. එස්. වීරවික්‍රම මිය, නී.නි. | **පිලිපීනය -** <br> විමර්ශනය හා වධහිංසාවට අදාළ කලාපීය නියමු මිශ්‍රිත අධ්‍යයන පාඨමාලාව - කලාපීය වැඩමුළුව- ආ.ශා.සං. | 2015.04.20 <br> 2015.04.24 |
| 04 | එම්. ඒ. එන්. චන්ද්‍රසිරි මහතා, පර්.නි. <br> පී. ඩබ්. චන්ද්‍රසිරි මහතා, පර්.නි.(අම්පාර) | **බංග්ලාදේශය -** <br> ආදිවාසීන්ගේ අයිතිවාසිකම් මත එ.ජා. ප්‍රකාශනයට අදාළ කලාපීය නියමු මිශ්‍රිත අධ්‍යයන පාඨමාලාවට සහභාගීවීම සඳහා ආරාධනය - ආ.ශා.සං. | 2015.05.04 <br> 2015.05.08 |
| 05 | එස්. ජේ. පරණගම මිය, ලේකම් <br> ටී. කනගරාජ් මහතා, සම්.නි.,යාපනය | **රුවන්ඩාව -** <br> වේලාසනින් සහ බලහත්කාරයෙන් කෙරෙන විවාහ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය ගැන ජා.මා.අ.ආ. - පොදු රාජ්‍ය මණ්ඩලීය සංසදය - ක්‍රියාකාරී සැසිය | 2015.05.04 <br> 2015.05.08 |
| 06 | කේ. ටී. කේ. පී. අරම්පත් මහතා, වැ.බ.අ./ පාලන හා මුදල් | **තායිලන්තය -** <br> ව්‍යාපාර සහ මානව හිමිකම් පුහුණු පාඨමාලාව - ආ.ශා.සං. | 2015.05.05 <br> 2015.05.08 |

| | | | |
|---|---|---|---|
| 07 | සී. කේ. රාජසිංහ මහතා, ජාල පරිපාලක<br>ඩබ්. ඒ. යූ. සමන්මලී මිය, ප්‍රලේඛන නි. | **තායිලන්තය -**<br>දකුණු සහ අග්නිදිග අසියානු මා.හි. පුස්තකාල මන්ත්‍රණයට ආරාධනය, රාඋල් වැලන්බර්ග් ආයතනය | 2015.05.20<br>2015.05.22 |
| 08 | එස්. ජේ. පරණගම මිය, ලේකම් | **බෙල්ජියම -**<br>ජා.මා.හි.ආ. විශේෂ සංසිද්ධිය - යුරෝපා කොමිෂම | 2015.06.02<br>2015.06.06 |
| 09 | කේ. ටී. කේ. පී. අරම්පත් මහතා, වැ.බ.අ./ පාලන හා මුදල් | **මැලේසියාව -**<br>විදේශ කාර්මික චාරිකාව | 2015.06.03<br>2015.06.09 |
| 10 | සිතාරා තැඹිලියගොඩ මිය. වැ.බ.අ.(ප. හ වි.) | **ඕස්ට්‍රේලියාව -**<br>සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂාකිරීමේ සංසදය ඕස්ට්‍රේලියා නීතිපති දෙපා. | 2015.06.15<br>2015.06.19 |
| 11 | කේ. කේ. විල්ලවරාජන් මහතා, අධ්‍යා.නි. | **මොන්ගොලියාව -**<br>20වන වර්ෂික රැස්වීම සහ ද්විවාර්ෂික සම්මන්ත්‍රණය - ජා.මා.හි.ආ./ආ.ශා.සං. | 2015.08.26<br>2015.08.28 |
| 12 | කේ. කේ. විල්ලවරාජන් මහතා, අධ්‍යා.නි. | **තායිලන්තය -**<br>ආන්තරික කාන්තා සහ වෙනස් වූ ලිංගික සංස්ථානය සහිත ජනතා හඬ වැඩමුළුව සහ විශ්ව සාමයික සමාලෝචන ක්‍රියාදාමයේ සමාජභාවී අනන්‍යතාවය | 2015.09.22<br>2015.09.23 |
| 13 | එස්. ජේ. පරණගම මිය, ලේකම් | **තායිලන්තය -**<br>දකුණු ආසියාවේ පුරුෂ සමලිංගික සහ සංක්‍රාන්තික සමාජභාවී ප්‍රජාව අතර ප්‍රතිකාර සහ මානව හිමිකම් - එ.ජා.සං.වැ. | 2015.09.27<br>2015.09.29 |
| 14 | සුජීවා කුමාරි මිය, නී.නි. | **සෝල්, කොරියාව -**<br>වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජා.ම.හ.ආ. විශේෂ සැසිය | 2015.10.26<br>2015.10.28 |
| 15 | එස්. ජේ. පරණගම මිය, ලේකම් | **මැලේසියාව -** ජ්‍යොෂ්ඨ විධායක වටමේස සාකච්ඡාව | 2015.10.26<br>2015.10.28 |
| 16 | චන්ද්‍රානි සිල්වා මිය, වි.නී.<br>ඒ. ඩබ්. එම්. අහමඩ් මහතා, නී.නි.<br>එස්. ඒ. විජයානන්ද මහතා, වි.නී. | **මැලේසියාව -**<br>ක්වාලාලම්පූර්හි ආගමන රැඳවුම් වැඩමුළුව | 2015.11.30<br>2015.12.03 |

**Human Rights Commission of Sri Lanka**
No. 165, Kynsey Road, Colombo 08
Hot Line 1996
Tele. +94 11 2694925, 2685980, 2685981
Fax +94 11 2694924
sechrc@sltnet.lk www.hrcsl.lk